# PRATHIRAWA

VOL. 3 2024

SRI LANKA LIBRARY ASSOCIATION

*Editor*

*Mrs. M.  K. G. Yanika Nandasena*


**© Disclaimer Notice**

මෙම සඟරාවේ අන්තර්ගතය තුළ ප්‍රකාශ වන අදහස් තනිකරම කතුවරුන් සතු වන අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කිසිදු වගකීමක් නොදරයි.

உள்ளடக்கத்தில்வெளிப்படுத்தப்படும் பிப்பிராயங்களுக்கு ஆசிரியர்களே பொறுப்பாவர்.  இலங்கை நூலகச் சங்கம் உள்ளடக்கத்தின் எந்தவொரு அபிப்பிராயங்களுக்கும் பொறுப்புடையதல்ல.

The opinions expressed within the content are solely the author's and the Sri Lanka Library Association does not hold any responsibility over the opinions.



Publisher
Sri Lanka Library Association
275/75, OPA Centre
Stanley Wijesundara Mawatha
Colombo 07
Sri Lanka
Email: slla@sltnet.lk, sllaoffice@gmail.com
Telephone: 0112589103

# ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිතුමාගේ පණිවිඩය



ලිවීම මානව වර්ගයාගේ වැදගත්ම සංස්කෘතික ජයග්‍රහණයන්ගෙන් එකකි. ශිෂ්ටාචාරය පැන නගින්නේ ලිවීමේ පැමිණීමත් සමඟ ය. ලිවීමකින් තොරව නූතන ලෝකය ප්‍රාථමිකත්වයෙන් වෙන්කර හඳුනා ගන්නා විද්‍යාව, තාක්ෂණය සහ සංස්කෘතිය ජයග්‍රහණය කළ නොහැකි වනු ඇත. ලිවීමට පෙර මානව දැනුම පරම්පරාවෙන් පරම්පරාවට වාචිකව ලබා දෙන ලදී. එබැවින් මෙම දැනුම සමුච්චය කිරීම අතිශයින් මන්දගාමී විය. වාචික කථාව කාලය හා අවකාශය තුළ සීමිතය. කථා කරන දේ ඇසෙන්නේ කථන අවස්ථාවේදී පමණි. අපට කතා කළ හැක්කේ කෙටි දුරකින් පමණි. ලිවීම මෙම සීමාවන් ඉක්මවා යයි. ඊයේ හෝ අවුරුදු දහසකට පෙර ලියා ඇති දේ අපට කියවිය හැකිය.

මිනිසුන්ගේ ජීවිතයේ ලිවීමේ වැදගත්කම කෙතෙක් වීද යත් පුරාණ ජනයා ඊට දිව්‍යයමය සම්භවයක් ආරෝපණය කර ඇත. භාෂාව මෙන්ම ලිවීම ජාතියක බාහිර සංකේත වේ. ලිවීම මානව වර්ගයාගේ ශ්‍රේෂ්ඨතම නව නිපැයුමකි. ශබ්ද භාෂාවෙන් සන්නිවේදනය කළ නොහැකි හෝ දුෂ්කර අවස්ථාවන්හිදී සන්නිවේදනය කිරීමට මිනිසුන්ට ලිවීම උපකාරී වේ. ලිවීමට සංවර්ධනයේ දීර්ඝ ඉතිහාසයක් ඇත. එය ප්‍රාථමික භාවිතයේ සිට වඩාත් පරිපූර්ණ ග්‍රැෆික් සන්නිවේදන ආකාර භාවිතා කිරීම දක්වා දුෂ්කර මාවතකට ගොස් තිබේ. එබැවින් ලිවීම සන්නිවේදනයේ වැදගත්ම මාධ්‍යයක් බවට පත්ව ඇත.එවන් පසුබිමක පුස්තකාල වෘත්තිකයින්ගේ නිර්මාණශීලී ලිවීමේ හැකියාවට අගයක් දෙමින් ප්‍රකාශයට පත්වන ප්‍රතිරාව විද්‍යුත් සඟරාව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තවත් එක් සුවිශේෂී සේවාවකි. එය විද්‍යුත් ප්‍රකාශයක් වශයෙන් ශාස්ත්‍රීය ලිපි, කවි, කෙටිකතා හා නිර්මාණාත්මක සංකල්පයන්ගෙන් සමන්විත වේ.

ප්‍රතිරාව සඟරාව ප්‍රකාශයට පත්කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති වශයෙන් පණිවිඩයක් ලබාදීමට හැකිවීම සතුටට කරුණකි. අද ඔබ අතට පත්වන්නේ ප්‍රතිරාව 3 වෙළුමයි. 2020/2021 පාලක සභාවේ රජයේ පුස්තකාලයාධිපති කණ්ඩායමේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කළ එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන මහත්මියගේ සංස්කාරත්වයෙන් ප්‍රතිරාව පළමු වෙළුම 2021 වසරේ දී ප්‍රකාශයට පත්කර කෙරිණි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් ලිපි ප්‍රකාශයට පත්කිරීම ප්‍රසංශනීය කරුණකි. යුගයේ අවශ්‍යතාවයක් සපුරාලමින් වැදගත් ප්‍රකාශනයක වගකීම තම උරමත දරාගනිමින් සංස්කාරකවරිය ලෙස කටයුතු කරන ගිවෝන් යානිකා මහත්මියට හා ප්‍රතිරාව 3 කලාපය සඳහා සක්‍රීයව දායක වූ සියලු දෙනාට අපගේ ප්‍රසාදය හා ස්තූතිය හිමි විය යුතුය.

**ආචාර්ය ප්‍රීති ලියනගේ**
**සභාපති**
**ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

## සංස්කාරකගේ සටහන



මානව සමාජයේ වර්තමාන දියුණු තත්ත්වයට හේතු වී ඇත්තේ මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු එසේ නැතහොත් දැනුම පසු කාලීන පරපුරට භාවිතා කල හැකි අයුරින් වාර්තා ගත කිරීමට ඇති හැකියාවයි. මෙසේ වාර්තා ගත වන තොරතුරු සෙසු අයගේ දැනුම වැඩිකිරීමට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ලබා ගැනීම, සැකසුම, ගබඩා කිරීම, සමුද්ධරණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් වනුයේ පුස්තකාලයයි. ඉතිහාසය පුරාම පුස්තකාලයේ සංවිධාන ව්‍යුහය, සංකල්ප හා කාර්යයන් නොකඩවා වෙනස් වෙමින් පවතී. දැනුම මූලික සමාජයේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි ඇතැම් කාර්යයන් ඉවතලන ලද අතර නව කාර්යයන් හඳුන්වා දී ඇත. වෙනත් ඕනෑම ගතික සංවිධානයක් මෙන්ම පුස්තකාලයද සමාජයේ පවත්නා වෙනස්කම් අනුව එහි සේවාවන් හා නිෂ්පාදනය වෙනස් කරනු ලබන අතර පුස්තකාලය පුද්ගලයන්ගේ හෝ සංවිධානවල තොරතුරු අවශ්‍යතා සපුරාලීමට බැඳී සිටී. සත්‍ය වශයෙන්ම පුස්තකාලයේ හැඩය, ප්‍රතිරූපය හා සංකල්පය සමාජය විසින් එහි අවශ්‍යතා වලට ගැලපෙන ලෙස විග්‍රහ කරනු ලබයි. සමාජය එහි තොතුරු අවශ්‍යතාවන් වෙනස් කරන විට පුස්තකාලයේ තොරතුරු භාවිතා කිරීමේ ක්‍රම, තොරතුරු ඇගයීමේ උපායමාර්ග හා පුස්තකාලයේ භූමිකාව වෙනස් වේ. කෙසේ වෙතත් සමාජයට අදාල දැනුම බෙදාහැරීම යන පුස්තකාලයේ මූලික පරමාර්ථය වෙනස් නොවී පවතී. පුස්තකාලය යනු මූලික වශයෙන් තොරතුරු ද්‍රව්‍ය සංවිධානාත්මකව එකතු කර එහි අන්තර්ගතය උපරිම ලෙස භාවිතා කිරීමට පහසුකම් සලසන ආයතනයකි.

එවන් වූ සේවාවන් සපයන පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තිකයින්ගේ නිර්මාණශීලී අදහස් හා ශාස්ත්‍රීය ලිපි එකතුවකට ඉඩ හසර ලබා දෙමින් මෙම ප්‍රතිරාව විද්‍යුත් සඟරාවේ තෙවැනි කලාපය එළිදැක්වෙන්නේ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හැට හැටහතර වන සැමරුම වෙනුවෙනි.

හැටහතර වසරක අභිමානවත් අතීතයකට උරුමකම් කියන පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු විද්‍යාඥයින්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ රටේ අනාගත පුස්තකාල අවශ්‍යතා සපුරාලීම සඳහා නායකත්ව භූමිකාවක් ඉටු කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනුග්‍රාහකත්වය හා මගපෙන්වීම යටතේ මෙවන් සමරු කලාපයක් එළි දැක්වීමට හැකිවීම මා ලද ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි. මෙම කටයුතු සාර්ථක කර ගැනීමට උපදෙස් සැපයූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිව සිටි ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස  මහතාටත්, වත්මන් සභාපති ආචාර්ය ප්‍රීති ලියනගේ මහතාටත් බෙහෙවින් සතුතිවන්ත වෙමි. එමෙන්ම මේ සඳහා සහයෝගය දැක්වූ  ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක සභාවේ 2023-2024 සාමාජිකයින්ටත්, තම නිර්මාණ අප වෙත ලබා දීමෙන් දායකත්වය සැපයූ සියලුම ලේඛක ලේඛිකාවන්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි.

**එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන**
**උප සභාපති (2023/2024)**
**ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

පටුන


**විෂය ලිපි** ..... 1

**තොරතුරු මූලාශ්‍රයක් ලෙස සාරසංග්‍රහවල වැදගත්කම - ආර්.ඒ.පී. සකුන්තලා සෙනෙවිරත්න** ..... 1

**මාර්ගගත අධ්‍යාපනය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය - ප්‍රියානී බාලසූරිය, කේ.ඒන් සමන්ති** ..... 8

**නූතන තාක්ෂණික පරිසරයක් තුළ සාර්ථක සහ ඵලදායි අයුරින් තොරතුරු ගවේෂණ ක්‍රමවේද භාවිතය - එච්.ඩී.එම්. සෙව්වන්දි ජයතිලක** ..... 16

“Enhancing Undergraduate Library and Information Science Programmes through the Integration of Medical Librarianship” - Dilhani Munasinghe ..... 21

***தற்கால நூலகர்களின் தொடர் தொழில்வான்மை வளர்ச்சியில்*** ..... 29

***தகவல் எழுத்தறிவின் முக்கியத்துவம் - முகம்மட் மஜீட் மஸ்றூாபா*** ..... 29

**The librarian dress code plays a role in presenting a professional image to the community - WM Thusithakumari** ..... 37

**ROLE OF THE SCHOOL LIBRARIAN IN THE DIGITAL AGE - A. Dharmarathne** ..... 46

**AYURVEDA, THE ART OF MEDICINE - Dr. (Ms.) N. L. Pathinayake** ..... 51

**Sri Lanka Library Association: Nurturing Knowledge and Connectivity - Mrs. T.M.C. Hansamali Thennakoon** ..... 54

පර්යේෂණ ක්‍රියාවලිය තුළ පර්යේෂණ ප්‍රජාවෙහි වැදගත්කම - ප්‍රියානී බාලසූරිය ..... 56

**ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මකවන ආයතනික ගබඩාවන් පිළිබඳ අධ්‍යයනයක් - එම් ජී එස් මධුෂිකා** ..... 59

**පුස්තකාල කාර්යාල කළමනාකරණය - කේ. එන්. සමන්ති** ..... 67

**ඵලදායී මානව සම්පතක් බිහිකරමු - එම්.ජී ෂෙහානි මධුෂිකා** ..... 70

**வாசிப்பின் மாயாஜாலம் - M. T. Thasneem Mohamed** ..... 72

විශේෂාංග ලිපිය ..... 74

**සිංහල කවියේ විකාසය හා ගිවෝන් යානිකා නන්දසේන කිවිඳියගේ කාව්‍ය අනුභූතිය පිළිබඳ හරස්කඩක් - ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස** ..... 74

පොතක වත ගොත ..... 78

කැත්ලීන් ජයවර්ධනගේ ද්‍රෝහී කෘතිය පිළිබඳ විමසුමක් - උදිත අලහකෝන් ..... 78

කෙටි කතා ..... 80

**විශ්‍රාම යාම - ආර්.එම් නදීකා රත්නබාහු** ..... 80

**කුල දියණිය - යමුනා වීරරත්න** ..... 84

**පළමු පත්වීම - ගිවෝන් යානිකා නන්දසේන** ..... 89

මුදු මාරු කරගත්තනම් - එම්.ජී. අරුණ තිලංක ..... 93

කාව්‍ය නිර්මාණ ..... 94

දයාබර පියාණෙනි - චන්දිමා වාදසිංහ ..... 94

අපි හමු වෙමු - ඩී. එල්. ඒ. නදීකා ..... 95

මළවුන්ගේ අවුරුදු දා - ගිවෝන් යානිකා නන්දසේන ..... 96

**දෙවියො මම කතරගම** - එම්.ජී ෂෙහානි මධුෂිකා ..... 97

අරලියා - ප්‍රියදර්ශනී හේමකුමාර......98
නුඹයි මමයි - හංසනී ශානිකා විජේතුංග......99
අවසන් ලිපිය - ගිවෝන් යානිකා නන්දසේන......100
ජිනදාසගේ පාපොච්චාරණය - එම්. පී. ෂෙහානි මධුෂිකා......101
රොබරෝසියා - ප්‍රියදර්ශනී හේමකුමාර......102
මගෙ ලොවම නුඹම විය.. - චමිලා ගමගේ......103
Reading Quotes......104

## විෂය ලිපි

**තොරතුරු මූලාශ්‍රයක් ලෙස සාරසංග්‍රහවල වැදගත්කම - ආර්.ඒ.පී. සකුන්තලා සෙනෙවිරත්න**

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති**
**රුහුණ විශ්වවිද්‍යාලය**

### 1.1. සාරසංග්‍රහ පිළිබඳ හැඳින්වීම

පාඨකයාට වැදගත් තොරතුරු සම්භාරයන් ලබාදෙන විමර්ශන මූලාශ්‍රයක් ලෙස සාරසංග්‍රහ සුවිශේෂී වේ. සාරසංග්‍රහයක් යන්න පොදු අර්ථය වන්නේ මුල් පිටපතට සමාන ශෛලියකින් ලේඛනයක අන්තර්ගතය සංක්ෂිප්ත ලෙස නිරූපණයකි. එය පැහැදිලි, සංක්ෂිප්ත, නිවරදි, විවේචනාත්මක නොවන හා තේරුම්ගත හැකි විය යුතුය. ඒ අනුව වාරසඟරා ලිපි, පර්යේෂණ වාර්තා යනාදිය පාදක කර ගනිමින් සාරසංග්‍රහ සකස් කරනු ලැබේ . විශේෂයෙන්ම ප්‍රසිද්ධ වෘත්තීයමය හා ශාස්ත්‍රීය සඟරාවල පළවන ලිපිවල ඇතුලත් තොරතුරු සාරාංශ කොට ඉදිරිපත් කිරීම දැකිය හැක. මෙහි මූලික පරමාර්ථය වන්නේ පාඨකයෙකුට ලිපියක් පළ වී ඇති බව දැනුම්දීමයි. එමඟින් යම්කිසි සඟරාවක් කියවීමේ අවශ්‍යතාවය තීරණය කිරීමටත්, පාඨකයා අදාළ ලිපිය වෙත යොමු කිරීමටත් මාර්ගෝපදේශයක් සපයයි. පුස්තකාල විද්‍යාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර විශ්වකෝෂය මඟින් සාරසංග්‍රහ යන්න නිර්වචනය කර ඇත්තේ මෙසේය.

"ලිපියේ අන්තර්ගතව ඇති අදහස්වලට හානි නොවන සේ ග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු සඳහන් කරමින් සම්පාදිත ලිපියක සංක්ෂිප්ත නිරූපණයකි."

ඒ අනුව මින් පැහැදිලි වන්නේ පර්යේෂණ ලිපියක් හෝ යම් විෂයයක් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක කෙටි සාරාංශයක් බවයි. ලොව අසීමිතව ප්‍රකාශයට පත් වන සියලුම වාරසඟරා ලිපි, පර්යේෂණ වාර්තා යනාදි විශාල විෂය පරාසයක තොරතුරු සියල්ලම ගවේෂණය කිරීම ප්‍රායෝගිකව සිදු කල නොහැකිය. එබැවින් පාඨකයකුට සම්පූර්ණ ලිපිය කියවීමකින් තොරව ලේඛනයක් පිළිබඳ පැහැදිලි දළ විශ්ලේෂණයක් ලබා ගැනීමටත්, ඉන් ඔබ්බට ගොස් මුල් ලිපිය විමර්ශනයටත් සාරසංග්‍රහක් තුළින් ලැබෙනුයේ මනා පිටුවහලකි.

### 1.2. සාරසංග්‍රහ වර්ග

මූලික වශයෙන් සාරසංග්‍රහ කොටස් 2 කට බෙදා දැක්විය හැකිය.

- විස්තරාත්මක/ දර්ශක සාරසංග්‍රහ (Descriptive/ Indicative Abstract)
- තොරතුරු සාරසංග්‍රහ (Informative Abstract)

### 1.2.1. විස්තරාත්මක සාරසංග්‍රහ (Descriptive Abstract)

මෙම සාරසංග්‍රහ මඟින් මුල් ලේඛනයේ විෂය පථය හා අන්තර්ගතය කෙටියෙන් සඳහන් කරයි. එය කෙටි සාරාංශයක් වන අතර එමඟින් මුල් ලේඛනය කියවිය යුතුද නැද්ද යන්න පාඨකයාට තීරණය කල හැකිය. මෙහිදී ලේඛනයේ පෙළෙහි ඇති බීජ පද ඇතුලත් කරන අතර පර්යේෂණයේ විෂය පථය, අරමුණු, ක්‍රමවේදය අන්තර්ගත වේ. එහි පර්යේෂණයේ ප්‍රතිඵල හෝ නිගමන යනාදිය ඇතුලත් නොවේ. බොහෝවිට වචන 100 ක් හෝ ඊට අඩු ප්‍රමාණයකින් මෙහි විස්තර ඇතුලත් කර ඇත. මෙය පුස්තකාලවල වරණීය විඥාපන සේවා නැතහොත් වත්මන් දැනුවත් කිරීමේ සේවා (Current Awareness Services) සැපයීම සඳහා ඉතා ප්‍රයෝජනවත් වේ.

**WATER**

85C/0635 Dinamika iskoriscavanja i zastite voda u svetu do kraja XX veka. (Dynamics of use and protection of water in the world until the end of the 20th century). D. DUKIC, *Glasnik Srpskog Geografskog Drustva*, **62(1)**, 1982, pp 11-28, 16 refs.
Determines water resources of the Earth on the basis of maps of elements of water balance of the continents and larger islands. River flows are mostly used as they can be renewed in the water-cycles of the planet. In the populated part of the Earth they amount to 38 820 $km^3$. At the same time the consumption of water increases. In 1980 it reached 3494 $km^3$. The greatest consumers are industry, thermo-electrical power plants, agriculture and the population. The amount of liquid waste increased to 1254.9 $km^3$. *-Bull. Sci. Sect. A Yougosl.*

85C/0636 Instrumental price estimates and residential water demand. C. V. JONES & J. R. MORRIS, *Water Resources Research*, **20(2)**, 1984, pp 197-202, fig, 4 tables, 22 refs.
Annual water purchases of single-family residences are regressed on instrumental price estimates, family income, and household size by ordinary least squares, based on a sample of 326 observations from metropolitan Denver, Colorado, for 1976. The resulting demand estimates are robust to the price concept specified, given proportional variation in all rates and charges, and are consistent with findings in the literature. -from Authors

85C/0637 Estimating demand for intake water by self-supplied firms. J. A. ZIEGLER & S. E. BELL, *Water Resources Research*, **20(1)**, 1984, pp 4-8, 3 tables, 30 refs.
Uses data from a sample of paper and chemical firms in Arkansas to test the null hypothesis that there is no significant difference in the estimates of industrial water demand using either average or marginal costs. Average cost provides a better estimate of water use in terms of statistical fit and predictive capabilities. -from Authors

**රූප සටහන 1 : විස්තරාත්මක සාරසංග්‍රහයක සැකැස්ම**

### 1.2.2. තොරතුරු සාරසංග්‍රහ (Informative Abstract)

මෙම සාරසංග්‍රහ මඟින් මුල් ලිපියේ ඉතා වැදගත් සහ ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. එනම් මුල් ලේඛනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයයි. ඒවායෙහි ඉදිරිපත් කර ඇති තොරතුරු දීර්ඝ බැවින් එය පරිශීලනය කරන්නාට මුල් ලේඛනය වෙත යොමුවීමට අවශ්‍ය නොවේ. විශේෂයෙන්ම කිසියම් විෂයක සැලකිය යුතු අන්තර්ගතයක් හෝ පර්යේෂණ පිළිබඳ සාරාංශයක් සපයා තිබීම මෙම සාරසංග්‍රහයක විශේෂත්වයයි. එනම් ලිපියේ හෝ පර්යේෂණයේ විෂය පථය, අරමුණු, ක්‍රමවේදය වැනි තොරතුරු පමණක් නොව පර්යේෂණයේ ප්‍රතිඵල හා නිගමන මෙන්ම කර්තෘගේ නිර්දේශයන් ද ඇතුලත් වේ. තොරතුරු සාරසංග්‍රහ සඳහා උදාහරණ ලෙස,

- Sociological Abstract
- Biological Abstract
- Chemical Abstract
- Geographical Abstract
- Library & Information Science Abstract


ENVIRONMENT

Natural Hazards

**10340 Increase in risk and exposure to flooding in Penang Island: a case of environmental degradation resulting from urbanisation and rapid economic development**
Chan N.W. *Malaysian Journal of Tropical Geography* 1997 28/1 (9-20)
In Penang Island, the flood hazard is caused by a combination of anthropogenic and natural factors. For a variety of reasons chief among which are trading, transport and port facilities, early settlements proposed around the estuaries and banks of major rivers particularly the Sungai Pinang where Georgetown is located. As settlements grew flood plains became more developed and densely populated resulting in floods becoming a serious hazard. The natural/physical system (heavy seasonal rainfall, low-lying topography, river characteristics, poor drainage, etc) and human land use system (agriculture, housing, commerce, deforestation, flood plain encroachment, squatting, etc) interact to create flood hazards on Penang Island. Since the 1970s, the Penang State Government has embarked on a two-prolonged development programme of industrial development and tourism to transform the Island into an industrial power by the turn of the century and a post-industrial society by the year 2020 (in line with Malaysia's Vision 2020). Penang's growth in recent years is henomenal. Its semiconductor factories and other electronic industries have made Penang the 'silicon valley of Southeast Asia' making Malaysia the world's largest computer chip exporter and is only behind the United States and Japan in terms of chip production. Tourism is also gaining importance in Penang. In 1992, the number of tourist arrivals to the Island was about 2.15 million (80.0% of which are foreign tourists). This has stimulated further plans to develop the Penang Hill area into a tuorist resort, programmes to clean up the beaches, and efforts to conserve historical buildings.


**රූප සටහන 2 : තොරතුරු සාරසංග්‍රහයක සැකැස්ම**

වර්තමානයේ පළවන සාරසංග්‍රහ විශාල ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ අධ්‍යාපන ආයතන, විද්වත් සංගම්, වෘත්තීය සංවිධාන ආදිය මඟිනි. වර්තමානය වන විට විවිධ මාධ්‍ය ස්වරූපයෙන් ප්‍රකාශයට පත් කෙරෙන සාරසංග්‍රහයන්හි ආවරණය කරනු ලබන විෂය පථය, ආකෘතිය, ප්‍රමාණය, කාලාන්තරය වැනි සාධක අනුව වෙනස් වේ. සාරාංශකරණය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන් විසින් මෙම

කාර්ය සිදු කරනු ලබන අතර ඔවුන් වෘත්තීය සාරාංශකරුවන් වේ. ඒ නිසාම සාරසංග්‍රහ ඉහල වටිනාකමක් හා ගුණාත්මකභාවයක් සහිත මූලාශ්‍ර විශේෂයක් ලෙස පෙන්වාදිය හැකිය. එසේ වුවද වර්තමානයේ පළවන බොහොමයක් ශාස්ත්‍රීය හා පර්යේෂණාත්මක සඟරා ලිපිවල එහි කර්තෘ විසින්ම සාරාංශ ඉදිරිපත් කරනු ලබයි. දීර්ඝ ලිපියක එහි අන්තර්ගතය පිළිබඳ සාරාංශය ලිපිය ආරම්භයේම දැකිය හැක.

# Political Engagement in Higher Education Curricula

Iris M. Yob, *Walden University* Follow
Aimee Ferraro, *Walden University* Follow

**Abstract**

Political Engagement in Higher Education Curricula

Submitted to the **Teaching** category of *JOSC*

Abstract

As more demands are made for universities and colleges to commit to public service, curricula in higher education may need to include the development of knowledge of and skills for political engagement. In an interview study, students, faculty members, and alumni at Walden University reflected on their understanding and experience of political action and working with policy-makers for social change. The responses overall indicated a general agreement that politics, political action, and policy making have roles to play in ensuring the lasting effects of social change activity, but they also indicated significant limitations to their effectiveness. Participants also showed a reticence to participating in political engagement. The findings suggest that understanding of and confidence in political engagement could be enhanced through connecting scholarly skills and knowledge to political activity and utilizing and stimulating personal interests and professional concerns as a basis for such activity. A curriculum that includes hands-on learning opportunities in social change may be most effective in preparing learners for political engagement.

**රූප සටහන 3 : දීර්ඝ ලිපියක කර්තෘ විසින් ලියන ලද සාරාංශයකි**

(පසුබිම, ක්‍රමවේදය, නිගමන, යෝජනා ඇතුලත් සාරාංශය තනි ඡේදයක් වශයෙන් දක්වා ඇත)

## Social Cognitive Theory Constructs That Predict Betel Nut Chewing Among Secondary Students in the Solomon Islands

Lepani Waqatakirewa, *Public Health Specialist, Suva, Fiji Islands* Follow
Manoj Sharma, *University of Nevada, Las Vegas, NV* Follow
Hadi Danawi, *Walden University, Minneapolis, MN* Follow
Ambrose Roots Gali, *Ministry of Health, Solomon Islands* Follow

**ORCID**
0000-0001-5439-7734

**Abstract**

**Background:** After alcohol, tobacco, and caffeine, areca or betel nut is the fourth most commonly abused substance in the world. The prevalence of betel nut use in the Solomon Islands is estimated at 68% in young people. Long-term use can result in detrimental health outcomes such as oral cancers and metabolic syndrome.

**Methods:** The purpose of this quantitative cross-sectional study was to determine whether the constructs of social cognitive theory (SCT) can predict betel nut use in Year 12 secondary students in the Solomon Islands. Five SCT constructs of expectations (outcome expectations and outcome expectancies), self-efficacy, self-efficacy to overcome barriers, self-control, and environment were used to build a model for the study. Data were collected from a convenience quota sample of 138 Year 12 secondary students through a 37-item questionnaire.

**Results:** Multiple linear regression and multiple logistic regression analysis indicated self-efficacy to overcome barriers ($p < .01$) was the only construct significantly related to intent to not chew betel nut.

**Conclusion:** Social cognitive theory (SCT) was weakly predictive with low explained variance for not chewing betel nut in secondary students. Research findings contribute to knowledge useful for developers of school health programs and researchers working on strategies to improve intervention actions to reduce betel nut use. The SCT could be bolstered by newer theories like the integrative model or multi-theory model (MTM) of health behavior change for designing educational interventions aimed at limiting betel nut use in young people, especially school students.

**රූප සටහන 4 : දීර්ඝ ලිපියක කර්තෘ විසින් ලියන ලද සාරාංශයකි**

(පසුබිම, ක්‍රමවේදය, ප්‍රතිඵල, නිගමන ඇතුලත් සාරාංශය වෙන් වෙන් වශයෙන් දක්වා ඇත)

## 1.3. සාරසංග්‍රහයක කාර්යයභාරය

සාරසංග්‍රහයක් මඟින් පහත ආකාරයේ කර්යයන් ගණනාවක් සිදු කරයි.

- ✓ නව දැනුම සහ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට උපකාර වීම.
- ✓ පාඨකයාට එම ලිපිය අවශ්‍යද නැතිද යන්න හඳුනා ගැනීම නිසා ඔහුගේ කාලය අපතේ නොයාම.
- ✓ සාහිත්‍ය ගවේෂණය සඳහා සහාය වීම.
- ✓ පරිශීලකයාට භාෂා බාධක තිබේ නම් එය යම් දුරකට අවම කරගත හැකිවීම. මන්ද යම් පාඨකයෙක් ඔහු නොදන්නා භාෂාවක ලිපියක සාරාංශය ඔහු දන්නා භාෂාවකින් ලබා ගත හැකි වීම.
- ✓ වර්ගීකෘත සාරසංග්‍රහ මඟින් සඟරාවල හා වෙනත් තැන්වල විසිරී පවතින තොරතුරු මෙන්ම එකම විෂයක් පිළිබඳ තොරතුරු එක් තැනකින් ලබා ගත හැකිවීම.
- ✓ සමාලෝචන ලිවීම සඳහා සහාය වීම.

## 1.4. සාරසංග්‍රහකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ✓ නොසැලකිලිමත් ලෙස කරුණු ඉවත් කිරීම හෝ එකතු කිරීම සිදු නොකල යුතුය.
- ✓ වැදගත් තොරතුරු රඳවා නොගත යුතුය.
- ✓ වගු, ප්‍රස්ථාර, උපුටා දැක්වීම්, කෙටි යෙදුම් යනාදිය භාවිතා නොකල යුතුය.
- ✓ භාවිතා කරන ලද විමර්ශන මූලාශ්‍ර නොදැක්විය යුතුය.
- ✓ අධ්‍යයනය පිළිබඳ තර්ක ඉදිරිපත් නොකල යුතුය.

## 1.5. සාරසංග්‍රහවල ඇති වැදගත්කම

සාරසංග්‍රහයක වැදගත්කම කරුණු කිහිපයක් යටතේ පෙන්වා දිය හැකිය.

- ✓ පාඨකයාට ග්‍රන්ථනාමාවලී, අනුක්‍රමණිකා, සූචි වැනි මූලාශ්‍ර භාවිතයෙන් ලබා ගන්නා තොරතුරුවලට වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් සාරසංග්‍රහයකින් ලබාගත හැකි වීම.
- ✓ ප්‍රවීන සංස්කාරක මණ්ඩලයකගේ අධීක්ෂණය මත සාරසංග්‍රහකරණය සිදුවන බැවින් මෙමඟින් ඉදිරිපත් කරන තොරතුරු විශ්වසනීය හා සාධිකාරීබවින් යුතු වීම මෙන්ම ගුණාත්මකභාවයෙන් යුක්තවීම.
- ✓ නව ලිපියක් සඳහා සූදානම්වීමේදී ප්‍රයෝජනවත් වීම.
- ✓ වරණීය විඥාපන සේවා නැතහොත් වත්මන් දැනුවත් කිරීමේ සේවා (Current Awareness Services) ප්‍රවර්ධනයට සහායවීම.
- ✓ පාඨකයකුට පර්යේෂණ ගැටලුවක් තෝරා ගැනීමට උපකාරී වීම.
- ✓ නව ප්‍රවණතා පිළිබඳ නිරීක්ෂණය කිරීමට පර්යේෂකයාට සහායවීම.

- ✓ පරිශීලකයාට එම ලිපිය අවශ්‍යද නැතිද යන්න හඳුනා ගැනීම නිසා කාලය අපතේ නොයාම.
- ✓ වර්ගීකෘත සාරසංග්‍රහ මඟින් සමාන විෂයන් පිළිබඳ තොරතුරු එක් තැනකින් ලබා ගත හැකිවීම.
- ✓ යාවත්කාලීන හා නවතම තොරතුරු ලබා ගැනීමට උපකාරී වීම.

කෙසේ වුවද සාරසංග්‍රහ සමඟ බැඳී පවතින ගැටලුද නැතුවාම නොවේ. සාරසංග්‍රහයක පළවන සාරාංශ සෑම පාඨකයකුටම ගැලපීමට ඉඩ නොමැතිවීමත්, පාඨකයාට අත්‍යවශ්‍යම කරුණු පමණක් ලබාදෙන්නේ කෙසේද යන්නත්, යම් අවස්ථාවක ප්‍රයෝජනවත් තොරතුරු අත්හැරී යාම වැනි කාරණා පෙන්වා දිය හැකිය. කෙසේ වුවද ඵලදායී සාහිත්‍යය ගවේෂණයක් සඳහා සුවිශාල දැනුම් සමුදායක් ලබා දෙන තොරතුරු මූලාශ්‍රයක් ලෙස සාරසංග්‍රහ පර්යේෂකයන්ගේ වටිනා ග්‍රන්ථයක් ලෙස පෙන්වා දිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Latt, K. T. (2016). A Study on Indexes and Abstracts as Valuable Reference Sources for Researchers (Doctoral dissertation, MERAL Portal).

Nundy, S., Kakar, A., Bhutta, Z.A. (2022). How to Write an Abstract? In: How to Practice Academic Medicine and Publish from Developing Countries? Springer, Singapore. https://doi.org/10.1007/978-981-16-5248-6_15 [Accessed 29th May 2023]

Rawat, P.P., Kumar, T. (1992) Encyclopedia of Information Technology and Library Science, New Delhi, Castle books pvt. Ltd.

අධ්‍යාපන නිලධාරි සහ භාණ්ඩාගාරික
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (2023/2024)

**හැඳින්වීම**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ එක් ප්‍රධාන කාර්යය භාරයකි, පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තීය පාඨමාලාවන් පවත්වාගෙන යාම. වර්ෂ 1961 සිට පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ වෘත්ත්තීය පාඨමාලා පවත්වනු ලැබේ. පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) 2024 වර්ෂයේදී මාර්ගගතව ආරම්භ කිරීමට පෙර, දිවයින පුරා විසිරි අධ්‍යයන මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගෙන ඉරිදා දිනයන්හි ශිෂ්‍ය අභිමුඛ දේශන හා ප්‍රායෝගික වැඩමුළු ලෙස පවත්වන ලදී. වත්මන් රජයේ අවශ්‍යතාව මත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාඨමාලව සඳහා ද ජාතික වෘත්තීය සුදුසුකම (National Vocational Qualification) ලබාගෙන එය ප්‍රතීතනය කර ගැනීමේ අවශ්‍යතාවය පැන නැගින. ඒ අනුව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම (Tertiary and Vocational Education Commission) යටතේ ලියාපදිංචි කිරීමේ දී එම ආයතනය මඟින් පනවා ඇති නියාමනයන්ට අනුව ආදාළ යටිතල පහසුකම් සපුරාගැනීමේදී ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති විය. ඒ අනුව අදාළ යටිතල පහසුකම් සහිත වෙනත් නව අධ්‍යයන මධ්‍යස්ථාන තෝරා ගැනීම ප්‍රායෝගිකව අපහසුය විය. තවද, වර්ථමානයේ ශ්‍රී ලංකාව මුහුණපා ඇති ආර්ථික අර්බුදය හමුවේ අධ්‍යයන මධ්‍යස්ථානවල පංති සඳහා සිසුන්ගේ පැමිණීම ද ක්‍රමයෙන් අඩුවීමක් දක්නට ලැබිණ. එම නිසා පාඨමාලාව මාර්ගගතව ආරම්භ කිරීම අවස්ථානුකූලව කළ යුතු විය. මාර්ගගත අධ්‍යාපනය සම්බන්ධව සිසු ප්‍රතිචාර විමසා බැලීමේ මෙම අධ්‍යයනය කාලෝචිතව වැදගත්වේ.

**අධ්‍යයනයේ අරමුණු**

මාර්ගගත අධ්‍යාපනය සම්බන්ධව සිසුන්ගේ දැනුවත් භාවය සහ ඒසම්බන්ධ පළපුරද්ද විමසා බැලීම මෙම ප්‍රධානතම අරමුණ විය. පාඨමාලාව හැදැරිමේදි සිසුන්ට පවත්නා පහසුකම් සහ අපහසුතාවන් විමසා බැලීම, පාඨමාලාව හැදැරිමට යොමුවන සිසුන්ගේ දිස්ත්‍රික්ක මට්ටමෙන් ව්‍යාප්තිය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පැමිණීම සඳහා වැයවන කාලය සහ විදයම විමසා බැලීම, පාඨමාලාව හදාරන සිසුන්ගේ සිවිල් සහ වෘත්තීමය තත්වය විමසා බැලීම ආදිය සෙසු අරමුණු විය.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ සංගහනය පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා හදාරන සියලුම සිසුන් වන අතර, නියැදිය වූයේ අධ්‍යයන මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගෙන 2023/2024 වර්ෂය සඳහා සිංහල මාධ්‍යයෙන් පාඨමාලාව හැදැරීමට ලියාපදිංචි වූ සිසුන් 75කි. සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ප්‍රශ්නාවලියක් සකසා එය ගූගල් පොරමයක් භාවිත කර සිසුන්ගේ වට්ස්ඇප් සමූහය වෙත යොමු කරන ලදි. අධ්‍යයනයට සිසුන් 75ක් තෝරා ගන්නා ලද අතර අවෘත ප්‍රශ්න 15 ක් සහ විවෘත ප්‍රශ්න 05 කින් සමන්විත ප්‍රශ්නාවලියට පිළිතුරු සපයා තිබුනේ 62ක් පමණි.

**දත්ත විශ්ලේෂණය**

පාඨමාලාවට ලියා පදිංචි වූ සිසුන්ගේ පදිංචිය අනුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය පහත පරිදිය.




ප්‍රස්තාරය 01

ඒ අනුව මහනුර දිස්ත්‍රික්යෙන් වැඩිම සිසු පිරිසක් ද, අඩුම ශිෂ්‍ය ප්‍රමාණයක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ලියාපදිංචි වී ඇත. ලියාපදිංචි මධස්ථානය අනුව සිසු පිරිස පහත පරිදි බෙදී ගොස් ඇත.




ප්‍රස්තාරය 02

ඒ අනුව වැඩිම සිසු පිරිස කොළඹ මධ්‍යස්ථානයෙන් වාර්තා වන අතර, අඩුම සිසු පිරිසක් බදුල්ල මධ්‍යථනයෙන් වාර්තා වේ.

පාඨමාලාවට ලියාපදිංචි සිසුන්ගේ වයස් ව්‍යුහය පහත දැක්වේ.




ප්‍රස්තාරය 03

සිසුන් අවුරුදු 20 - 50 අතර වූ අතර ඉන් 23 (37%) ක් වයස අවු. 35 - 40 අතර විය. 25 -30 අතර 19 ක්ද 21- 24 අතර 10 ක්ද විය.




ප්‍රස්තාරය 04

සිසුන්ගෙන් 37 (59%)ක් විවාහක අයවූ අතර 25 (41%) ක් අවිවාහයකය. විවාහක අයට දරුවන් සිටින නොසිටින බව මෙන්ම දරුවන්ගේ වයස පිළිබඳව ද විමසා බලන ලදි.




ප්‍රස්තාරය 05

විවාහක වුවන්ගෙන් අවුරුදු 05 වඩා අඩු වයසේ දරුවන් සිටින සිසුවියන් 35 ක් විය. මාර්ගගත අධ්‍යාපනය නිවසේ සිට හදාරන බැවින් වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින සිසුන් වැඩි පිරිසක් සිටින බැවින් දිවා කාලයේදී පමණ දේශන පැවැත්විය යුතුය.

පාඨමාලාව හදාරන සිසුන්ගේ රැකියා වියුක්තිය පිළිබඳව ද විමසන ලද අතර රැකිය ක්ෂේත්‍රය මෙන්ම සේවය කරන ආයතනවල ස්වරූපය ද විමසා බැලීය.




ප්‍රස්තාරය 06




ප්‍රස්තාරය 07

බහුතරය ඊකියාවල නිරත වූ අතර, 50 (80%) කි. ඉන් සිසුන් 28 ක් පුස්තකාල ආශ්‍රිත ඊකියාවල නිරත වූවන්ය. ඊකියාවල නිරතවූවන්ගෙන් රාජ්‍ය අංශයේ 25 ක්ද, අර්ධ රාජ්‍ය අංශයේ 09ක් සහ පෞද්ගලික අංශයේ 16 ක් විය. එය ප්‍රස්තාර අංක 08න් පෙන්නුම් කරයි.




ප්‍රස්තාරය 09

සිසුන් සතුව වතින තාක්ෂණික මෙවලම් සම්බන්ධවත් ඒවා භාවිතයෙන් මාර්ගගත අධ්‍යාපන කටයුතුවල ඇති පළපුරුද්ද සම්බන්ධව සොයා බැලීම ද වැගත් විය. ඒ අනුව නියැදියෙන් 93% (58) කට ඇන්රොයිඩ් වර්ගයේ දුරකථන තිබුණි. බහුතරය මාර්ගත දේශනවල සම්බන්ධවී ඇත්දැකිම් ලත් පිරිස වූ අතර ඒය නියැදියෙන් 82% ක් විය. ( 51) ක් විය.




ප්‍රස්තාරය 10




ප්‍රස්තාරය 11

සිසුන්ට තම නිවසේ සිට තම අධ්‍යාපන මධ්‍යස්ථාන සඳහා පැමිණීමට ගතවන කාලය සහ වියදම සම්බන්ධව අවබෝධයක් ලබා ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් විමසන ලදී. ඒ අනුව නිවසේ සිට තම අධ්‍යයන මධ්‍යස්ථානය පැමිණීමට ගතවන කාලය පැයකට අඩු කාලයක් බව සිසුන් 07 ක් ද, පැය 1-2 ත් අතර සිසුන් 34 ක්ද, පැය 3-4 කාලයක් වැය කරන පිරිස 13කි. සිසුන් 08 ක් පැය හතරට වැඩි කාලයක් වැය වන බව ද සඳහන් කර තිබුණි.




ප්‍රස්තාරය 12

අධ්‍යාපන මධ්‍යස්ථාන කරා පැමිණීමට වැය වන මුදල පිළිබඳව විමසීමේදී දක්වන ලද ප්‍රතිචාර පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.




ප්‍රස්ථාරය 13

51% ( 32)ක් අධ්‍යයන මධ්‍යයස්ථානය කරා පැමිණීමේදී එක් වතාවට වැය වන ප්‍රවාහන වියදම රු. 500/- වඩා අඩු බවත්, රු. 500 – 1000 අතර සිසුන් 10 ක් , රු. 1000 – 2000 අතර සිසුන් 08ක් ද සඳහන් කර තිබුණු අතර, රු. 2000/- ට වඩා වැඩියෙන් වැය කරන සිසුන් 02 ක් විය. ඒ පොලොන්නරුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙන් මහනුවර මධ්‍යස්ථානයට පැමිණෙන සිසුන්ය.

බහුතරය ඒනම් 91% ( 57) ක් NVQ සහිත ඩිප්ලෝමාවක් ලබා ගැනිමට කැමති අතර NVQ නොමැති සාමාන්‍ය ඩිප්ලෝමාවක් ලබා ගැනිමට කැමති සිසුන් 05ක් විය. මාර්ගගත දේශන මගින් කරනු ලබන දේශනවලට අමතරව, රෙකෝඩින්, දේශන සටහන, දේශන ඉදිරිපත් කිරිම්, අමතර කියවීම් ද්‍රව්‍ය, පසුගිය ප්‍රශ්න පත්‍ර, ආදිය වට්ස් ඇප් සමූහය මගින් ලබා දෙන සඳහන් කර තිබුණි. එසේම අමතර අභ්‍යාස හා නිබන්ධන පංති පවත්වන ලෙස ද සඳහන් කර තිබුණි.

NVQ සහිත ඩිප්ලෝමාවක් ලබා දීමේදී පාඨමාලා මාධ්‍යය ඉංග්‍රිසි මාධ්‍යය වූ බැවින් පාඨමාලාව හැදැරිමට කැමති භාෂා මාධ්‍යය පිළිබඳව ද විමසන ලදි.




ප්‍රස්තාරය 14

බහුතරය 69% (43) ක් සිංහල භාෂාවෙන් පමණක් ද, 31% (19) ක් සිංහල හා ඉංග්‍රිසි මාධ්‍ය දෙකෙන්ම පාඨමාලාව හැදෑරීමට කැමති බව දක්වා තිබුණි. වයස් කාණ්ඩය අනුව ද එම පිරිස හඳුනාගත හැකිවිය. එය පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.




ප්‍රස්තාරය 15

භාෂා දෙකෙන්ම පාඨමාලාව හැදෑරීමට කැමති සිසුන්ගේ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක මට්ටමෙන් මෙසේය.




ප්‍රස්තාරය 16

භාෂා දෙකෙන්ම පාඨමාලාව හැදෑරීමට කැමති වැඩි පිරිසක් මහනුවර දිස්ත්‍රික්යෙන් වාර්තාවූ අතර වෙනුවට ගාල්ල දිස්ත්‍රික්යෙන් විය. බදුල්ල, කළුතර, එත්නපුර සහ කුරුණෑගල සම තත්වයක් පෙන්නුම් කරන ලදි. කෑගල්ල, කොළඹ සහ ගම්පහ අවම මට්ටමක විය.

"*මාර්ගගත දේශන ක්‍රමය කාලය හා ශ්‍රමය ඉතිරි කරයි*" යන ප්‍රකාශයට එකඟ වන බවත්, එහි පවතින ප්‍රයෝජන ලෙස, මෙම අධ්‍යාපන ක්‍රමය පහසු බව, කාලය ශ්‍රමය මෙන්ම වර්තමානයේ පවතින ආර්ථික ගැටලු සමඟ ප්‍රවාහන වියදම ද අඩුවන බව, අධ්‍යාපන කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවිය හැකි බව, නිවසේ සිට ඉතා පහසුවෙන් ඉගෙන ගැනීමට අවස්ථාව පවතින බව සඳහන් කර තිබුණි. එසේම මාර්ගගත

අධ්‍යාපනයේ දුර්වලතා ලෙස අන්තර්ජාල පහසුකම් නොමැති අවස්ථාවන්හිදි බාධා ඇති වන බව, මෙන්ම ප්‍රායෝගික විෂයයන් වලදි මෙම ක්‍රමවේදය එතරම් සුදුසු නැති බව ද සඳහන් කර තිබුණි.

**නිගමන**

මාර්ගගත අධ්‍යාපනයේ ප්‍රතිලාභ සහ ඒ සම්බන්ධ අවබෝධයක් සහිත වැඩි පිරිසක් සිටින බැවින් පාඨමාලාව මාර්ගතව ආරම්භ කිරීම සුදුසු විය. තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂමේ නියමන්ට අනුව ආයතනය සහ පාඨමාලාව ලියාපදිංචි කොට ජාතික වෘත්තීය සුදුසුකම ලබා ගත හැකිය. වයස අවුරුදු 20 -50 අතර වයස් කාණ්ඩයේ සිසු පිරිසක් වීම නිසා නව තාක්ෂණික මෙවලම් භාවිතයෙන් අධ්‍යාපනය ලැබීම ඔවුන්ට අභියෝගයක් නොවීය. නියැදියෙන් බහුතරයකට එනම් 93% කට ඇනරොයිඩ් වර්ගයේ දුරකථන පැවතිමත්, 82% ක් මාර්ගත අධ්‍යාපන අත්දැකීම් ලබා තිබීම නිසා මාර්ගගත ක්‍රමයට පාඨමාලාව ආරම්භ කිරිමට වඩාත් පහසු විය. පාඨමාලාව සඳහා අවුරුදු 05ට වඩා අඩු දරුවන් සිටින මව්වරුන්ට දරුවන් සමඟ නිවසේ සිට මාර්ගගත පාඨමාලාවට හැදැරිමේදි ගැටලු මතුවීමට ඉඩකඩ පවති. ඒම නිසා මාර්ගගත දේශන දිවා කාලෙය්දී පැවැත්වීම වඩාත් සුදුසුය.

**යෝජනා**

අධ්‍යයන මධ්‍යස්ථානයට පැමිණීමට පැය 04කට වැඩි කාලයක් ගත කර කරන මෙන්ම රු. 3000/ක් 4000/ක් පමණ මුදලක් එක් ගමන්වාරයකට වැය කර මහනුවර මධ්‍යස්ථානයට පැමිණෙන පොළොන්නරුව, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රිකවල සිසුන් ද සිටින බැවින්, සිංහල මාධ්‍යය අධ්‍යයන මධ්‍යස්ථානයක් උතුරු මැද පළාතට වන්නට ස්ථානගත කිරීම වඩාත් සුදුසුය. විභාග පැවැත්විමේ දී ද සිසුන්ට පහසු වන අතර, එම පළාත් වල වෙසෙන තවත් පිරිසකට මෙම පාඨමාලාව හැදැරීමට අවස්ථාව සැලසිය හැකිය. නිවෙස්වල අන්තර්ජාල පහසුකම් නොමැතිකම මෙන්ම තාක්ෂණික බාධා පවතින ප්‍රදේශයන්හි තෝරා ගත් පුස්තකාල කේන්ද්‍රකොටගෙන එම ස්ථානයට පැමිණ සිසුන් කිහිපදෙනෙකුට ඒක්ව මාර්ගගත දේශනවලට සහභාගිවීමට හැකි පරිදි අධ්‍යයන වැඩ සටහන් සැළසුම් කළ යුතුය. නිරන්තරව සිසුන් සසම්බන්ධව පසු විපරම් කළ යුතු අතර සිසුන්ගේ දුක්ගැනවිලි සහ යෝජනා පිළිබඳ අවධානය යොමු කොට ඊට සුදුසු පිළියම් යෙදීමට කටයුතු කිරීමෙන් මාර්ගගත අධ්‍යාපන ක්‍රමය වඩාත් සාර්ථක කර ගත හැකිය.

**ප්‍රමුඛ පද: මාර්ගගත අධ්‍යාපනය, ජාතික වෘත්තීය සුදුසුකම, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

**සාරාංශය**

*නූතන සමාජය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් පරිපූර්ණත්වයට පත් ව ඇත. එබැවින් වත්මන් සමාජයේ ජීවත් වන මිනිසා ඔවුන්ගේ සියලු කාර්යයන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීමට කටයුතු කරනු ලබන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග තොරතුරු සඳහා විශාල වටිනාකමක් ලැබී ඇත. පැරණි ලෝකයේ සාම්ප්‍රදායික මාධ්‍ය හරහා නිර්මාණය වුණු මානව දැනුම වර්තමානය වන විට තාක්ෂණික මාධ්‍ය හරහා ප්‍රකාශයට පත්වීම සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස දිනෙන් දින තොරතුරු බිහිවීමේ ප්‍රවණතාව සීඝ්‍ර ලෙස ඉහළ යාම හේතු කරගෙන නූතන මානවයාට නව තොරතුරු නිවැරදිව සොයා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණදීමට සිදුවේ. එබැවින් නිරවද්‍ය තොරතුරු නිවැරදි කාලයක් තුළ ලබාගැනීම සඳහා තොරතුරු ගවේෂණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් වීම අතිශයින් වැදගත් වේ. ඒ අනුව මෙම ලිපිය හරහා නූතන තාක්ෂණික පරිසරයක තොරතුරු ගවේෂණ ක්‍රමවේද භාවිතයෙන් තොරතුරු සොයාගැනීම පිළිබඳ විමසා බලනු ලැබේ.*

**ප්‍රමුඛ පද** - තොරතුරු, තොරතුරු ගවේෂණය, තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය, තොරතුරු ගවේෂණ ක්‍රමවේද

**තොරතුරු ගවේෂණය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව වත්මන් සමාජය වෙත විශාල බලපෑමක් සිදුකර ඇත. මේ නිසා ම සමාජයේ බොහෝ පුද්ගලයන් සිය තොරතුරු අවශ්‍යතා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් ඉටුකර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරනු ලැබේ. නමුත් නූතන තාක්ෂණික විප්ලවය හේතුවෙන් දිනෙන් දින ලෝකයට බිහි වන තොරතුරුවල ප්‍රමාණය විශාල වශයෙන් වර්ධනය වී ඇත. මේ හේතුවෙන් වත්මන් සමාජය තුළ තොරතුරු සුලභතාවය නිර්මාණය වී ඇති අතර සමාජයේ ජීවත්වන පුද්ගලයන් හට තමාට අවශ්‍ය තොරතුරු නිවැරදි හා අඩු කාලයකින් සොයාගන්නේ කෙසේ ද යන ගැටළුවට මුහුණ දීමට සිදු ව ඇත. මේ සඳහා තොරතුරු ගවේෂණ කුසලතාවය වර්ධනය කරගැනීම සාර්ථක විසඳුමක් ලෙස දැක්විය හැකිය. තොරතුරු ගවේෂණ කුසලතාව වර්ධනය කරගැනීම හරහා තොරතුරු රාශියක් අතුරින් තමන්ට අවශ්‍ය කරන නිවැරදි ම තොරතුරු අවම ශ්‍රමයක් හා අවම පිරිවැයක් වැය කර ලබා ගැනීමේ හැකියාව ඇත.

වර්තමානය තුළ තොරතුරු ගවේෂණය කිරීම සඳහා විවිධ තොරතුරු සෙවුම් මෙවලම් භාවිතා කෙරේ. ඒ අතුරින් වර්තමානයේ බහුල වශයෙන් වෙබ් අඩවි ( Websites ) , ඒකීය මූලාශ්‍ර නිශ්චයාකාරකය ( Uniform Resource Locator - URL) , විෂය නාමාවලි ( Subject Directories ) , සෙවුම් යන්ත්‍ර ( Search Engines ) , අධි - සෙවුම් යන්ත්‍ර ( Meta Search Engines ) , තොරතුරු පිවිසුම් මාර්ග ( Gateways ) ,

සම්බන්ධ පුරුක් ( Link ) , තොරතුරු ප්‍රකාශන පුවරු ( Bulletin Boards ) භාවිත කෙරේ. ගවේෂකයන්ට ඉහත කුමන හෝ සෙවුම් මෙවලමක් භාවිතා කර තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාව ඇත.

**තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය**

තොරතුරු ගවේෂණය සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා ප්‍රාමාණික අවබෝධයක් තිබීම වැදගත් වේ. තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකින් සමන්විත වේ.

1. තොරතුරු අවශ්‍යතාව හඳුනා ගැනීම

තොරතුරු ගවේෂණ ක්‍රියාවලියේ ප්‍රථම පියවරෙහි සාර්ථකත්වය මත සමස්ත තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය ම තීරණය වේ. මේ නිසා ප්‍රථම පියවර නිවැරදි ව සිදුකර ගැනීම වැදගත් වේ. ප්‍රථමයෙන්ම ගවේෂකයා තමන්ට අවශ්‍ය කරන තොරතුරු නිවැරදිව අවබෝධ කරගත යුතු අතර තොරතුරට අදාළ මාතෘකාව හෝ ගැටළුව පිළිබඳ නිවැරැදි අවබෝධයක් තිබීම අතිශයින් වැදගත් වේ. මේ සඳහා ‘’ 5WH’’ සූත්‍රය භාවිතා කිරීමට හැකිය.

| | | |
|---|---|---|
| W – Why | - | තොරතුරු කුමකට ද? |
| W – What | - | කුමන තොරතුරු ද? |
| W – When | - | තොරතුරු කුමන විටෙකදී ද? |
| W – To Whom | - | තොරතුරු කාහට ද? |
| W – Where | - | තොරතුරු කවර තැනක ද? |
| W – How | - | තොරතුරු සොයන්නේ කෙසේ ද? |

2. තොරතුරු මූලාශ්‍ර වර්ග හඳුනා ගැනීම

තොරතුරු අවශ්‍යතාව නිවැරදිව අවබෝධ කරගත් පසුව අදාළ තොරතුරු ලබාගත හැකි, නිවැරදි, යාවත්කාලීන හා සාධිකාරි තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. එහි දී වර්තමානයේ ද බහුලව ම භාවිතා වන අන්තර්ජාලය, පුවත්පත්, වාර සඟරා හෝ පොත්පත් ආශ්‍රයෙන් තමන්ට අවශ්‍ය කරන තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත.

3. බීජපද හඳුනා ගැනීම

තොරතුරු ගවේෂණ ක්‍රියාවලියේ තෙවන පියවර ලෙස බීජපද හඳුනා ගැනීම සිදුකළ යුතු ය. මෙම පියවර ද ඉතා සුපරික්ෂාකාරීව සිදු කළ යුතු අතර ගවේෂණයේ ප්‍රතිඵලයේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය බීජපද තෝරා ගැනීම මත තීරණය වේ. එබැවින් තොරතුරු ගවේෂණයේ දී පුළුල් පද, නියත පද, සමාන හා සම්බන්ධිත පද පිළිබඳ අවබෝධය ගවේෂකයාට තිබිය යුතු වේ.

4. තොරතුරු ගවේෂණය

නිවැරදි බීජපද හඳුනා ගැනීමෙන් අනතුරුව තෝරාගත් ගවේෂණ පද එකිනෙකට සම්බන්ධ කරමින් අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීම සිදුකළ යුතු ය. මේ සඳහා සුදුසු ගවේෂණ ක්‍රමවේදයක් භාවිතයෙන් තොරතුරු ගවේෂණය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි වේ.

5. ප්‍රතිඵල ලබා ගැනීම

ඉහත පියවරයන් සාර්ථක අයුරින් අනුගමනය කිරීම හරහා සිය අවශ්‍යතාවයට ගැලපෙන තොරතුරු සමුද්ධරණය කරගැනීම මෙම  පියවරේ දී සිදු වේ.

6. ප්‍රතිඵල ඇගයීම

ප්‍රතිඵලය ලෙස ලබාගත් තොරතුරු කුමන ආකාරයෙන් සිය තොරතුරු අවශ්‍යතාවයට ගැලපේ ද, ලබාගත් තොරතුරු කෙතරම් ප්‍රමාණවත්ද, තමා අපේක්ෂා කරන ලද තොරතුරු ඒ ආකාරයෙන්ම ලබා ගැනීමට හැකි වූයේ ද යන්න පිළිබඳ ඇගයීමක් ගවේෂණ ක්‍රියාවලියේ අවසන් පියවර වශයෙන් සිදුකළ යුතු වේ.

**ගවේෂණ ක්‍රමවේද**

තොරතුරු ගවේෂණය කිරීම සඳහා භාවිත කළ හැකි ගවේෂණ ක්‍රමවේදයන් කිහිපයකි. ඒවා පහත ආකාරයට හඳුනා ගත හැකිය.

**බූලියන් තර්කනය ( Boolean Operators )**

මෙම ගවේෂණ ක්‍රමවේදය '' බීජපද ගවේෂණය'' ( Key Word Searching ) යන නමින් ද, හඳුන්වන අතර මේ හරහා තොරතුරු ගවේෂණයේ දී  මෙහෙයුම් කාරක පද  භාවිත කෙරේ. මෙහි ප්‍රධාන මෙහෙයුම් කාරක පද ලෙස And, Or, Not යන පද හඳුන්වා දීමට හැකිවේ.

AND - මෙම මෙහෙයුම් කාරකය හරහා ගවේෂකයාට ඉතා සීමා සහිත තොරතුරු ප්‍රමාණයක් ලබාගත හැකිවේ. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන සහ උසස් අධ්‍යාපන ආයතන වශයෙන් පද දෙකක් ඇතුළත් කළ විට ඊට අදාල සීමා සහිත තොරතුරු ප්‍රමාණයක් ගවේෂකයාට ලබාගත හැකිවේ.

OR - ගවේෂකයාට ඉතා පුළුල්  තොරතුරු ප්‍රමාණයක් මෙම මෙහෙයුම් කාරකය මගින් ගවේෂණය කිරීමට හැකියාව ලැබේ. ඒ අනුව පෙර සඳහන් කරන ලද නිදසුනට අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන හෝ උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් ඕනෑම පදයක් පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් ලබාගත හැකි වේ.

NOT - තනි පදයක් සම්බන්ධයෙන් පමණක් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මෙම මෙහෙයුම් කාරකය භාවිතයට ගැනීමේ හැකියාව ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන යන පදයට ඇතුළත් නොවූ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ පමණක් තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත.

**ක්ෂේත්‍ර ගවේෂණය ( Field Searching )**

කර්තෘ , ග්‍රන්ථ නාමය , ප්‍රකාශකයා , සඟරා නාම ආදී විවිධ ක්ෂේත්‍ර පදනම් කරගනිමින් තොරතුරු ගවේෂණය කිරීම මෙම ක්‍රමවේදය හරහා සිදු වේ. මෙම ගවේෂණ ක්‍රමවේදය යටතේ Domain Searching, Image Searching, Host Searching වැනි ගවේෂණ ක්‍රම පවතින අතර මෙම ක්‍රමවේදය පිළිබඳ ගවේෂකයා දැනුවත්වීම සාර්ථක ගවේෂණයකට වඩාත් වැදගත් වේ.

**වාක්‍යාංශගත ගවේෂණය ( Phrase Searching )**

වඩා වැඩි වචන ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා මෙම ගවේෂණ ක්‍රමවේදය යොදා ගත හැකි අතර අදාළ ගවේෂණ පදය උධෘත පාඨ තුළ යෙදීම සිදුකළ යුතුවේ. නිදසුනක් ලෙස සෙවුම් තීරුවේ ‘’ Botanical Garden in Sri Lanka ‘’ වශයෙන් සඳහන් කළ විට ශ්‍රී ලංකාවේ උද්භිත උද්‍යාන පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ගවේෂකයාට ලබා ගැනීමේ හැකියාව ඇත.

**සමීපස්ථ ගවේෂණය ( Proximity Searching )**

සමීපස්ථ ගවේෂණ ශිල්ප ක්‍රමයේ මෙහෙයුම් කාරක පද කිහිපයක් ඇති අතර, ඒවා කිහිපයක් ලෙස With, Before, Near, Adjacent දැක්විය හැකිය. මෙහි දී ප්‍රථමයෙන්ම ගවේෂණ පදය සෙවුම් තීරුවට ඇතුළත් කර ඉහතින් දක්වන ලද මෙහෙයුම් කාරක පද ඇතුළත් කළ යුතු වේ. මෙහි දී පද දෙක අතර තිබිය යුතු වචන ප්‍රමාණය සඳහන් කළ යුතු ය. මෙම ගවේෂණ ක්‍රමවේදය Full Text Database ආශ්‍රයෙන් තොරතුරු ගවේෂණය සිදු කරන ගවේෂකයන් සඳහා වැදගත් වේ.

**ලෝපනය ( Truncation )**

සංකේතානුසාරයෙන් තොරතුරු ගවේෂණය මෙම ලෝපන ක්‍රමවේදයේ දී සිදු වේ. ඒ සඳහා Asterisk (*), Question mark (?), Dolor mark ($), Hash mark (#), Plus mark (+) යන සංකේත භාවිතයට ගැනේ. මෙම ලෝපන ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් ආකාර තුනකි.

1. දකුණු ලෝපන ක්‍රමවේදය ( Right Truncation System )

මෙම ක්‍රමවේදයේ දී ගවේෂණ පදයේ දකුණු කොටස ලෝපන කිරීම සිදුවේ. නිදසුනක් ලෙස Edu* යනුවෙන් සඳහන් කළ විට ‘’ Educator ‘’ , ‘’ Educational ‘’, ‘’ Education ‘’, ‘’ Educate ‘’ යනාදී වචන රාශියක තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාව ඇත.

2. වම් ලෝපන ක්‍රමවේදය ( Left Truncation System )

ගවේෂණ පදයේ වම් කොටස ලෝපනය කිරීම හරහා ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීම මෙම ක්‍රමවේදය මගින් සිදුවේ. නිදසුනක් ලෙස ගවේෂණ තීරුවේ *tion යනුවෙන් සඳහන් කළ විට ‘’Position‘’, ‘’ Education ‘’, ‘’ Solution ‘’, ‘’ Vacation ‘’වශයෙන් වචන රාශියක තොරතුරු ලබාගත හැකිය.

3. සමගාමී වම් සහ දකුණු ලෝපන ක්‍රමවේදය ( Simultaneous Left Truncation System )

ගවේෂණ පදයේ වම සහ දකුණ එක විටෙක ලෝපනය කිරීම මෙම ක්‍රමවේදයේ දී සිදුවේ. නිදසුනක් ලෙස *Press* සඳහන් කළ විට '' Impression'' , '' Suppressant'' , '' Expression'' , '' Impressive'' යනාදි වචනයන්ට අදාළ තොරතුරු ලබා ගැනීමට හැකිවේ.

**අව්‍යස්ථික අනු ලක්ෂණය ( Wild Card Characters )**

තොරතුරු ගවේෂණය සඳහා භාවිත කරනු ලබන සෙවුම් පදවල අක්ෂර වින්‍යාසයන්හි ගැටලු ඇති වූ අවස්ථාවක දී මෙම ගවේෂණ ක්‍රමවේදය භාවිත කිරීමට හැකිවේ. මේ සඳහා භාවිතයට ගන්නා සංකේත කිහිපයකි. ඒවා නම් , Asterisk (*), Question mark (?), Dolor mark ($), Hash mark (#) ලෙස දැක්විය හැකිය. මෙකී ගවේෂණ ක්‍රමවේදය '' Mandated Wild Cards '' සහ '' Optional Wild Cards '' වශයෙන් කොටස් දෙකකි. එක් අක්ෂරයක් පිළිබඳ ගැටලුවක් ඇති වූ විට Mandated Wild Cards ක්‍රමය ද , එක් අක්ෂරයක් හෝ ඊට වැඩි ගණනක දී Optional Wild Cards ක්‍රමය ද භාවිත කිරීමට හැකිවේ. මෙම ගවේෂණ ක්‍රමවේදය සහ ලෝපන ක්‍රමවේදයෙහි සමානත්වයක් ඇත.

ඉහත සඳහන් කරන ලද ආකාරයට අදාළ තොරතුරු අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ගවේෂණ ක්‍රම ශිල්ප තෝරා ගැනීම හරහා වඩා සාර්ථක සහ නිරවද්‍ය තොරතුරු අවම කාලයක් සහ අවම ශ්‍රමයක් වැය කර ලබා ගැනීමේ හැකියාව ඇත. මීට අමතරව සාර්ථක තොරතුරු ගවේෂණයක් හරහා වඩා හොඳ තාර්කික තීරණ ගැනීම, විවිධ විෂය ක්ෂේත්‍රවල තාක්ෂණික දියුණුව ඇති කිරීම, ගැටලු සඳහා සාර්ථක විසඳුම් ලබාගැනීම, කායික හා මානසික දියුණුව ඇති කර ගැනීම වැනි වාසී කර ප්‍රතිඵල රාශියක් ලබා ගත හැකි වේ. එබැවින් නූතන තාක්ෂණික පරිසරයක් තුළ තොරතුරු ගවේෂණ ක්‍රමවේද සාර්ථකව භාවිතා කිරීම හරහා ගවේෂකයන්ගේ තොරතුරු උපයෝගීතාවය පරිපූර්ණත්වයට පත් වනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍ර**

සෝමානන්ද හිමි, බෝපැත්තේ. ( 2019 ). තොරතුරු ගවේෂණය හා සෙවුම් ක්‍රමවේද. සමාජ විමර්ශන. කැලණිය විශ්වවිද්‍යාලය.

ගල්ගොඩවත්ත, ඉනෝකා. ( 2013 ). තොරතුරු සමාජය හා පුස්තකාලය. ඉඹුල්ගොඩ. කර්තෘ ප්‍රකාශන.

අලහකෝන්, යූ.පී. ( 1999 ). තොරතුරු සමාජය. පුස්තකාල ප්‍රවෘත්ති.

“Enhancing Undergraduate Library and Information Science Programmes through the Integration of Medical Librarianship” - Dilhani Munasinghe

Senior Assistant Librarian, Postgraduate Institute of Medicine, University of Colombo
Email: dilhani@pgim.cmb.ac.lk https://orcid.org/0000-0002-8351-6568

## Introduction

Medical librarianship is a specialized field within library and information science that focuses on managing and providing access to medical and healthcare-related information. Medical librarians play a crucial role in collecting, organizing, and disseminating resources such as medical literature, research articles, patient education materials, and other health-related information. Also, medical librarians, play a critical role in various healthcare settings, academic institutions, research organizations, and libraries. They support healthcare professionals, researchers, students, and patients by ensuring access to accurate and up-to-date medical information, promoting evidence-based practice, and facilitating informed decision-making in healthcare settings.

Implementing medical librarianship into the Library and Information Science degree programme provide students with specialized knowledge and skills in medical information management, health literacy, and medical terminology. This specialized training would equip students with the expertise necessary to navigate and organize complex medical information systems effectively. Also, integrating medical librarianship into the curriculum would open up new career opportunities for students. By gaining proficiency in this field, undergraduates would be well-prepared to pursue roles as medical librarians, knowledge managers, or information specialists in healthcare settings, research institutions, and academic libraries. Moreover, exposure to medical librarianship would enhance students’ research abilities and information literacy skills. They would learn to critically evaluate medical literature, conduct systematic reviews, and assist healthcare professionals in accessing and utilizing reliable medical information for decision-making and patient care. Furthermore, the inclusion of medical librarianship in the programme would contribute to the overall quality of healthcare services by ensuring that healthcare professionals have access to accurate, current, and relevant medical information. Students would play a vital role in bridging the gap between research and practice, thus improving healthcare outcomes and patient safety.

## History of Medical Librarianship

The profession of medicine has been important for a long time. Ancient civilizations like the Assyrians and Babylonians had medical collections. King Assurbanipal of Assyria had a famous library in Nineveh with many medical tablets from around 2000 B.C. The library was well organized with a catalogue, and it contained medical and magical texts. Eventually, in 606 B.C., Nineveh was captured and the library was destroyed along with the city. In Babylonia and Assyria, medical knowledge was collected in libraries controlled by court officials, priests, and educated people. The Babylonians even regulated medicine in their laws. Trade between Mesopotamia and Egypt likely exchanged medical knowledge around 3000 B.C. Egyptian temples were known for healing and had well-organized medical collections. The Temple of

Thoth had a comprehensive collection, and titles like "Keeper of the Sacred Books" and "Lady of Letters" were given to those in charge of medical texts. Private libraries also grew. Important medical papyri like the Kahun, Smith, and Ebers papyri have been found dating back to 1900 B.C. to 1500 B.C.

In ancient Greece, individual scrolls were kept in leather or cloth covers inside clay jars, sometimes adorned with jewels. Knowledge in medicine thrived in Greece, especially during the time of Hippocrates and Aristotle. Libraries, including medical libraries in temples, became more common. The Alexandrian School of Medicine was a significant center of learning with its library dedicated to healing gods. Libraries were organized with rolls in pigeonholes or on shelves, and booklists were created. Librarians were highly respected in Greek society. The classification system of pinakes, with tablets listing authors chronologically by literary type, was used in libraries. Other important medical schools with libraries included those in Pergamus, Cos, Cnidos, Rhodes, and Cyrene.

මෙහි 1 රූපසටහනේ දැක්වෙන්නේ නම් ස්පාඤ්ඤයේ විශාලතම මහජන පර්යේෂන ආයතනයේ "RANKING WEB OF REPOSITORIES" වෙබ්අඩවිය මගින් 2021 වර්ෂයේ දී ලෝකයේ ආයතනික නිධි (E- Reposatary) ශ්‍රේණිගතකර ඇති ආකාරයයි. එහිදී 2 රූපසටහනේ දැක්වෙන පරිදී ලොව හොඳම ආයතනික ගබඩාව ලෙස "Europe PubMed Central" ආයතනික ගබඩාව ලොව ශ්‍රේණිගතකිරීම් වලින් ප්‍රථම ස්ථානය ලබාගෙන ඇති අතර එය අයිතමයන් 2700000 කින් පමණ සමන්විතවන 2021 වසරේ ලොව හොඳම ආයතනික නිධිය වේ.

ආයතනික ගබඩා පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාලව ක්‍රියාත්මකවන ආයතනික ගබඩාවලටද සුවිශේෂී ස්ථානයක් හිමිවේ. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවල භාවිත කරන E - Reposatary ගුණාත්මකභාවය පිළිබඳව පැහැදිලි දර්ශකයක් ලෙස සේවයකරන අතර එමගින් විශ්වවිද්‍යාලයේ දෘශ්‍යතාවය කීර්තිනාමය හා විශ්වවිද්‍යාලය පිළිබද මහජන වටිනාකමද වැඩිකරයි .

"විශ්වවිද්‍යාලය පදනම් කරගත් ආයතනික ගබඩාවක් යනු ආයතන සහ එහි ප්‍රජා සාමාජිකයන් විසින් නිර්මාණය කරනලද, ඩිජිටල් ද්‍රව්‍ය කලමණාකරනය හා බෙදාහැරීම සදහා විශ්වවිද්‍යාලයක් තම ප්‍රජාවේ සාමාජිකයන්ට ලබාදෙන සේවා සමූහයකි .ඩිජිටල් ද්‍රව්‍යවල භාරකාරත්වය සුදුසුම අවස්ථාවලදී දිගුකාලීනව සංරක්ෂණය කිරීම මෙන්ම සංවිධානය , ප්‍රවේශය හෝ බෙදාහැරීම වන අතර එය බොහෝ දුරට ආයතනික කැපවීමකි" (ලින්ච් ,2003).

යන නිර්වචනයෙන්ද විශ්වවිද්‍යාලය පදනම් කරගත් ආයතනික ගබඩාවක් යනු කුමක්ද යන්න පැහැදිලි වේ.

**විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මකවන ආයතනික කෝෂ්ඨාගාරවල අරමුණු හා පරමාර්ත.**

- විශ්වවිද්‍යාලයේ ඩිජිටල් වත්කම් කළමණාකරනය කිරීම සංරක්‍ෂණය කිරීම සහ ගබඩාකිරීම .
- විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා ගෝලීය දෘශ්‍යතාවයක් ඇතිකිරීම.
- උසස් අධ්‍යාපනයට හා පර්යේෂණ සඳහා තිරසාර සහයෝගයක් ලබාදීම.
- විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිදානයට විවෘත ප්‍රවේශය සැපයීම.
- විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයට හා සිසුන්ට ඩිජිටල්කරණය වූ අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමට හා ඒට ප්‍රවේශ වීමට ඉඩ සැලසීම.
- ප්‍රකාශක සහ විකිණුම්කරුවන් වෙනුවට ස්වයං ප්‍රකාශණයට ඉඩදීමෙන් ආයතනික අයවැය අඩුකිරීම සඳහා විශ්වවිද්‍යාලතුල විවෘත කේත මෘදුකාංග ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු සහ ඒවාට විසඳුම් සෙවීම.

**විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මකවන ආයතනික කෝෂ්ඨාගාරයක් තුලින් ලබාගතහැකි ප්‍රයෝජන**

- විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මකවන ආයතනික කෝෂ්ඨාගාර මගින් දේශීය පර්යේෂණ සඳහා ගෝලීය වේදිකාවක් සපයන අතර එමගින් විශ්වවිද්‍යාලයේ දෘශ්‍යතාවය කීර්තිනාමය වැඩිදියුණු වීම.
- පර්යේෂණ සහයෝගීතාවය හා පර්යේෂණ කාර්යසාධනය වැඩිදියුණු වීම.
- ඉගනීම සහ ඉගැන්වීම සඳහා සහය දැක්වීම.
- ප්‍රකාශයටපත් නොකළ හා ප්‍රයෝජනයට නොගත් එකතුකිරීම් වෙත ප්‍රවේශවීම සහ භාවිතය වැඩිකිරිමට හේතුවීම.
- විශ්වවිද්‍යාලයේ ආයතනික ගබඩාවෙහි ප්‍රතිලාබ අවධාරණය කරමින් ආයතනික ගබඩාවක් සංවර්ධනය කිරීම සඳහා සෙසු විශ්වවිද්‍යාල දිරිමත් කිරීම.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාල මගින් ක්‍රියාත්මකකරන ආයතනික කෝෂ්ඨාගාර පිළිබදව අධ්‍යයනය කළ යුතුමය .දේශීයව මෙන්ම විදේශීයවද පර්යේෂකයන් අතර බොහෝ ජනප්‍රිය මෙන්ම ඉහල කීර්තිනාමයක් දිනාගෙන ඇති විශ්වවිද්‍යාල ආයතනික කෝෂ්ඨාගාරයක් ලෙස කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාව(E-Reposatary) හැදින්විය හැකිය. කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාව යනු කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂකයින්ගේ , විශ්වවිද්‍යාලයේ උපාධි හා පශ්චාත් උපාධි සිසුන්ගේ ,අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හා පර්යේෂක සහයකයින්ගේ විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන එකතුවයි .මෙම එකතුවට පීඨ ප්‍රකාශන, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි නිබන්ධනයන්ද ඇතුලත් වේ .තවද පීඨයේ පශ්චාත් උපාධිදාරී සිසුන්ගේ සහ පර්යේෂණ කණ්ඩායම්වල අධ්‍යයන කටයුතු කළමණාකරනය කිරීම, සංරක්‍ෂණය කිරීම සහ ලබාගැනීම සඳහා මෙමගින් විශාල දායකත්වයක් ලබාදේ .



රූපසටහන 3



රූපසටහන 4

ඉහත 3 රූපසටහන මගින් දක්වා තිබෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලීය වෙබ් අඩවියෙහි ප්‍රධාන පිටුවෙහි ආයතනික ගබඩාව දිස්වන ආකාරයයි. 4 රූපසටහන මගින් දක්වා තිබෙන්නේ ආයතනික ගබඩාවේ පරිශීලක අතුරු මුහුණතේ රූපසටහනකි. මෙම ගබඩාව නිතිපතා යාවත්කාලීන කෙරෙන අතර අඛණ්ඩ එකතුකිරීම් සිදුකරනු ලබයි .යම් පර්යේෂකයෙකුට සිය පර්යේෂණයේ ප්‍රතිඵල කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාවතුල ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍යයනම් ,ඒ සඳහා sallaw@lib.cmb.ac.lk යන විද්‍යුත් ලිපිනය හරහා කොළඹ විශ්වවිද්‍යාලය සම්බන්ධකරගත හැකි අතර තවද පර්යේෂකයන්හට තම පර්යේෂණ ප්‍රතිඵල ස්වයං උඩුගත කිරීමේ පහසුකම යටතේ උඩුගත කිරීමට අවස්ථාව ලබාදී ඇත. ඒ සඳහා වන මාර්ගෝපදේශ මාලාවක්ද ආයතනික ගබඩාව තුල ප්‍රදර්ශණයකර ඇත.

කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාව මගින් මූලික වශයෙන්ම අදහස්කරනු ලබන්නේ පෙර ප්‍රකාශයට පත්කළ ප්‍රකාශන සඳහා ගබඩාවක් මිස නව පර්යේෂන ලිපි සඳහා ස්වාධින ප්‍රකාශන වේදිකාවක් ලෙස නොවන අතර, ඉදිරිපත් කිරීමේ කාර්යක්‍ෂමතාව කළමණාකරනය කිරීමේ උපක්‍රමයක් ලෙස පීඨාධිපතිවරුන්ගේ හා පර්යේෂකයන්ගේ පහසුව සඳහා පුස්තකාලය මගින් සෑම පීඨයක් සඳහාම ආයතනික ගබඩාව සම්බන්ද අදහස් හුවමාරුකරගැනීමට හා එහි ඒකීයබාවය පවත්වා ගැනීමේ පහසුව සඳහා ජේශ්ඨ කාර්යමණ්ඩල සමාජිකයෙකු පත්කර ඇත. එමෙන්ම බුද්ධිමය දේපල පනතේ 2003 අංක 36 දරණ ප්‍රකාශන හිමිකම් සහතික කිරීමේ වගන්තියට අනුගත වෙමින් විශ්වවිද්‍යාලයේ ආයතනික ගබඩාවේ වැඩකටයුතු මගින් වෙනත් පුද්ගලයෙකුගේ බුද්ධිමය දේපළ, පෞද්ගලිකත්වය හෝ වෙනත් නීති ,අයිතීන් උල්ලංඝනය නොකරන බවට පර්යේෂකයන් විසින් සහතික විය යුතුය. එසේම යම්

ප්‍රකාශණයක් නිර්මාණය කිරීමට විශ්වවිද්‍යාලය හැර වෙනත් පාර්ශවයන් අනුග්‍රහය දැක්වූවේනම් ,අනුග්‍රාහක ගිවිසුම මගින් නියමකරන ලද පූර්ව සමාලෝචනයක් හෝ වෙනත් බැදීම් හෝ අවශ්‍යයතාවයන්ට පර්යේෂකයින් අනුකූලවී තිබිය යුතුය. තවද ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් කතෘවරුන් තම දැනුමේ ආකාරයට තම ප්‍රකාශනයේ අසත්‍ය, අපහාසාත්මක, නීතිවිරෝධී ,නොමඟයවන සුළු හෝ වංචනික හෝ වෙනත් කිසිදු නීතියක් උල්ලංඝනයවන කිසිවක් අඩංගු නොවන බවටද සහතික වියයුතුය.

කොළඹ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාවතුල පහත දැක්වෙන ආකාරයට විවිධ විෂය ක්ෂෙත්‍ර ඔස්සේ ප්‍රකාශන වර්ගීකරණයකොට දක්වා ඇති අතර මෙහි ප්‍රකාශයට පත්කරන ඕනෑම ප්‍රකාශයක සම්පූර්ණ පර්යේෂන පත්‍ර(Full Text Articles) හා පර්යේෂන පත්‍රිකාවල සාරාංශ(Abstracts නොමිලේ අන්තර්ජාලය මඟින් ඕනෑම කෙනෙකුට ලබාගැනීමේ හැකියාව ඇත.

- වාර්ෂික පර්යේෂන සම්මන්ත්‍රණ (Annual Research Symposiums)
- මිශ්‍ර ඉගනීම් (Blended Learning)
- පරිගණක විද්‍යාව (Computer Science)
- අධ්‍යාපන (Education)
- මානව ශාස්ත්‍ර ඃ සමාජ විද්‍යාවන් (Humanities and Social Sciences)
- දේශීය වෛද්‍ය විද්‍යාව (Indigenous Medicine)
- නීති (Law)
- පුස්තකාල සහ තොරතුරු විද්‍යාව (Library & Information Science)
- කලමණාකරන සහ මූල්‍ය (Management & Finance)
- ජනමාධ්‍ය හා රංග කලාව (Mass Media and Performing Arts)
- ඖෂධ (Medicine)
- හෙද (Nursing)
- පශ්චාත් උපාධි පර්යේෂන (Postgraduate Research)
- විද්‍යාව (Science)
- තාක්‍ෂණය (Technology)
- උපාධි පර්යේෂන සම්මන්ත්‍රණ (Undergraduate Research Symposium)
- කොළඹ විශ්වවිද්‍යාලීය සඟරා (University Of Colombo Journals)

කොළඹ විශ්වවිද්‍යාලය පර්යේෂන ලෝකයතුල දේශීයව මෙන්ම විදේශීයවද ඉමහත් කිර්තියක් මෙන්ම ජනප්‍රසාදයක් අත්කරගෙන ඇති විශ්වවිද්‍යාලයක් වන අතර උසස් තත්වයේ පර්යේෂන සඳහා නිරතුරුව කැපවන විශ්වවිද්‍යාලයක් ලෙසද අර්ථදැක්විය හැකිය .විශ්වවිද්‍යාලයේ ආයතනික ගබඩාව විශ්වවිද්‍යාලයේ එම කීර්තියට හා ජනප්‍රසාදය ඔපමට්ටම් කරන අංගයක් ලෙස තවදුරටත් දැක්විය හැකිය .

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලය පද්ධතිය තුල ප්‍රමුඛ ස්ථානයක් ලබාගෙන ඇති තවත් විශ්වවිද්‍යාලයක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලය හැදින්විය හැකිය .කැලණිය විශ්වවිද්‍යාලය උසස් තත්වයේ පර්යේෂන සඳහා නිරතුරුව කැපවන අතර විවිධ විෂයන්හි ශාස්ත්‍රාලිකයන් දේශීය හා ජාත්‍යයන්තර වශයෙන් අදාලවන උසස් තත්වයේ පර්යේෂන නිරතුරු අත්හදා බලමින් සිටී. එහිදි කැලණිය විශ්වවිද්‍යාලයේ ආයතනික ගබඩාවට සුවිශේෂී ස්ථානයක් හිමිවේ .ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන යුගයේ දී විද්‍යාත්මක ව්‍යාප්තියේ අත්‍යවශ්‍ය යටිතල පහසුකමක් ලෙස ආයතනික ගබඩාවන් හදුනාගෙන ඇති අතර විශ්වවිද්‍යාලයේ

බුද්ධිමය ප්‍රාග්ධනය නියෝජනය කරනු ලබන මෙන්ම විවෘත ප්‍රවේශය සපයන අංගයක් ලෙසද දැන්විය හැකිය .




රූපසටහන 5




රූපසටහන 6

මෙම 5 රූපසටහනින් දැක්වෙන පරිදි ආයතනික ගබඩාවේ අයිකනය ක්ලික් කිරීමෙන් 6 රූපසටහනේ දක්වා තිබෙන ලෙස විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාව තුලට ප්‍රවේශවීමට හැකියාව ලැබෙන අතර , කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ ආයතනික ගබඩාවතුල පහත දැක්වෙන ආකාරයට විවිධ විෂය ක්ෂෙත්‍ර ඔස්සේ ප්‍රකාශන වර්ගීකරණයකොට දක්වා ඇත.

- වාණිජ හා කළමනාකරන(Commerce & Management)
- පරිගණක හා තාක්ෂණය(Computar & Technology)
- උපාධි අධ්‍යයන (Graduate Studies)
- මානව ශාස්ත්‍ර(Humanities)
- ඖෂධ(Medicine)
- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය(Postergraduate Institute Of Archaeology)
- පාලි හා බෞද්ද අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය (Postergraduate Institute Of Pali and Buddhist studies )
- විද්‍යා(Science)
- සමාජ විද්‍යා(Social Sciences)
- සම්මන්ත්‍රණ(Symposiam & Conferences)
- පුස්තකාලය(The Library)
- නිබන්ධන(Theses and Dissertations)
- විශ්වවිද්‍යාල ප්‍රකාශන(University Publications)
- වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය- ගම්පහ(Wickramarachchi Ayurveda Institute- Gampaha

විවිධ ගවේශණ ක්‍රමවේද භාවිතයෙන් ආයතනික ගබඩාවෙහි තැම්පත්කර ඇති ප්‍රකාශනයන් වෙත ප්‍රවේශවිය හැකි අතර විශ්වවිද්‍යාලයේ දැනට සේවයකරන සහ සේවයකළ ආචාර්යමණ්ඩල සාමාජිකයන්ගේ සම්පූර්ණ පර්යේෂන පත්‍ර(Full Text Articles) හා පර්යේෂන පත්‍රිකාවල සාරාංශ(Abstracts) මෙහි අන්තර්ගතව ඇත ඊට අමතරව කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිය හදාරනු ලැබූ සිසුන්ගේ නිබන්ධනවල සාරාංශද මෙහි අන්තර්ගතකොට ඇත එමෙන්ම විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කාර්යමණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන හා පාර්යේෂණ අවශ්‍යතාවන්ට සහායවීම සඳහා ,

- වානිජ හා කළමනාකරන අධ්‍යයන පීඨය – achala@kln.ac.lk
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය- tharangad@kln.ac.lk
- මානව ශාස්ත්‍ර පීඨය –sajeewanie@kln.ac.lk
- විද්‍යා පීඨය – subhanee@kln.ac.lk
- සමාජීය විද්‍යා පීඨය - tharangad@kln.ac.lk
- වෛද්‍ය පීඨය – chithra@kln.ac.lk
- පරිගණක හා තාක්ෂණ පීඨය – udayangani@kln.ac.lk

ලෙස එක් එක් පීඨයට අදාළව විද්‍යුත් ලිපිනයන් මගින් පීඨ පුස්තකාලයාදීපතිවරුන් සම්බන්ධකර ගතහැකි අතර විශ්වවිද්‍යාලයේ ආයතනික ගබඩාව හා එය භාවිතාකරන ආකාරය සම්බන්ධව මගපෙන්වීම ඔවුන් විසින් සිදුකරනු ලබයි .

ඉහත ආකාරයට විශ්වවිද්‍යාලීය ආයතනික ගබඩාවන් පිළිබද දැක්වීමේ ආයතනික ගබඩාවන් කළමනාකරනයේදී සංවර්ධනයේදී මෙන්ම පවත්වාගෙන යාමේදී විවිධ ගැටලුකාරී අවස්ථාවන්ටද මුහුණදීමට විශ්වවිද්‍යාල වලට සිදුව තිබේ. විශේෂයෙන්ම ලිපිගොනු ඩිජිටල්කරණය කිරීම හා නඩත්තු කිරීමට ඉහල පිරිවැයක් දැරීමට සිදුවීම දැක්විය හැකිය. එහිදී ඊට විසඳුම් යෝජනාවක් ලෙස එවැනි වාතාවරනයක් තුල සෑම විශ්වවිද්‍යාලයකටම එක් මධ්‍යයම සේවා සපයන්නෙකු සදහා ධත්ත සපයන්නෙකු ලෙස ක්‍රියාකල හැකි අතර එවිට පරිශීලකයාටද ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාලවල පර්යේෂණ ප්‍රතිඵල එක් ස්ථානයකින් සොයා ගැනීමට හැකිවන අතර ලොව බොහෝ විශ්වවිද්‍යාල පුස්තකාල මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලබයි .

**නිගමනය**

වර්තමාන නව තොරතුරු හා තාක්ෂනික විප්ලවය තුල විශ්වවිද්‍යාලීය ආයතනික ගබඩාවන්ට සුවිශේෂී ස්ථානයක් හිමිව ඇත. ඩිජිටල් ආකෘතිය ඔස්සේ තොරතුරු සම්පත් වෙත ප්‍රවේශවීම සඳහා වර්තමානයේ බහුල ලෙස බාවිත කරනු ලබන සංකල්පයක් ලෙස මෙය දැක්විය හැකිය .නමුත් වර්තමානයේ පවතින සංකල්පයන් යල්පැන යාමටත් නව සංකල්පයන් බිහිවීමටත් එක් තත්පරයක් උවද ප්‍රමාණවත් විය හැකිය. එබැවින් මෙම තාක්ෂණික ලෝකය තුල විය නොහැක්කක් තිබිය නොහැකි අතර මෙම ආයතනික ගබඩාවන් සංකල්පයද යල් පැන ගොස් නව තාක්ෂණික සංකල්පයන් නුදුරේදිම ලොව වෙලාගනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍ර**


Anuradha.K.T.(2005) Design and development Institutional Repositories: A case study. The International Information and Library Review,vol.37,p.169-178.

Prabhakaran .S.V.R & Manjula Rani.S.V.(2016)Benefits and Perspectives of Instititional Repositories In Academic Libraries.Scholarly Research Journal for Humanity Science & English Language.Vol.5/25,No.48612.

University Of Colombo(2020) Institutional Repository Policy Guidelines.

https://repositories.webometrics.info

https://archive.cmb.ac.lk

https://repository.kln.ac.lk

**තොරතුරු නිලධාරී**
**ජාතික විද්‍යා පදනම**

පුස්තකාලය යනු දැනුම, තොරතුරු සහිත මූලාශ්‍ර අයත් කර ගන්නාවූත්, ඒවා සුදුසු පරිදි සංවිධානය කොට, අවශ්‍ය අවස්ථාවලදී ලබා දීමට කටයුතු කරන සේවා සපයන ආයතනයකි. මෙම සේවා සැපයීදී පුස්තකාලවල මානව, භෞතික සහ මූල්‍ය සම්පත් ප්‍රධාන වශයෙන් උපයෝගී කරගනී. මෙකී සම්පත් කළමනාකරණය කිරීමෙන් පුස්තකාල කාර්යයන් ඵලදායීව සිදු කර ගත හැකි වන අතර මෙහිදී කාර්යාල කටයුතු ද අඩු වැඩි වශයෙන් සිදු වේ.

පුස්තකාලයේ දැනුම, තොරතුරු සහිත මූලාශ්‍ර මුද්‍රිත හෝ මුද්‍රිත නොවන ආකාරයෙන් ප්‍රධාන වශයෙන් දැකිය හැකිය. මුද්‍රිත මූලාශ්‍ර වශයෙන් පොත් පත්, වාරික ප්‍රකාශන, පුවත් හසුන්, අත් පත්‍රිකා, පෝස්ටර් ආදිය පෙන්වා දිය හැකිය. මුද්‍රිත නොවන මූලාශ්‍ර නැවතත් ඉලෙක්ට්‍රොනික හා ඉලෙක්ට්‍රොනික නොවන ආකාරයෙන් වෙන් කර දැක්විය හැකිය. යන්ත්‍රානුසාරයෙන් ඉලෙක්ට්‍රොනික මූලාශ්‍ර කියවා ගැනීමට අවශ්‍යය වේ. මයික්‍රොෆිච්, මයික්‍රොෆිල්ම්, සීඩී, ඩීවීඩී ආදිය මෙම ගණයට අයත් වේ. ඉලෙක්ට්‍රොනික නොවන මූලාශ්‍ර ලෙස කාසි, මුද්දර, අත් පිටපත්, පුස්කොළ පොත් ආදී වූ දේ දැක්විය හැකිය. මෙකී මූලාශ්‍ර පුස්තකාලවලට අයත් කර ගැනීමේ ක්‍රම කිහිපයකි. එනම් මිල දී ගැනීම, පරිත්‍යාග, හුවමාරු ක්‍රම වේ. මෙසේ අයත් කර ගත් මූලාශ්‍ර සමාන හෝ අසමානකම් අනුව කිසියම් පිළිගත් ක්‍රමවේදයකට අනුව සංවිධානය කොට එනම් සුදුසු වර්ගීකරණයකට අනුව වර්ග කෙරේ. පසුව පුස්තකාල භාවිතයේ දී පහසුවෙන් එම මූලාශ්‍රයන් තෝරා ගැනීම, ලබා ගැනීමට අවශ්‍ය වන ආකාරයෙන් පිළිගත් ක්‍රමයකට අනුව සුචිගත කිරීම සිදු කෙරේ. මෙහිදී අද වන විට තම ජංගම දුරකතනයෙන් පවා පුස්තකාල සුචියකට ප්‍රවේශ වීමේ හැකියාව ඇත. එසේ සුදුසු පරිදි වර්ගීකරණයකට හා සුචිකරණයකට යටත්ව සංවිධානය කළ මූලාශ්‍ර නිසි තැන ස්ථාපිත කොට අවශ්‍ය භාවිතයට ඉඩ හසර ලබා දීම පුස්තකාලයක මූලික කාර්ය භාරය වන අතර පුස්තකාලයාධිපති ඇතුළු සෙසු කාර්ය මණ්ඩලයේ ද කාර්ය භාරය එය වෙයි.

මෙම කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව කර ගෙන යාමේදී කාර්යාල කටයුතු සිදු කර ගැනීම අවශ්‍ය වේ. තොරතුරු එක්රැස් කර, ගබඩා කර, විශ්ලේෂණය කර අවශ්‍ය අවස්ථාවල දී තොරතුරු බෙදාහැරීමේ කාර්යයන් කාර්යාල කටයුතු වේ. කළමනාකරණය යනු අවම සම්පත් (මානව, භෞතික, මූල්‍ය) භාවිතයෙන් උපරිම ඵලයක් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමයි. පුස්තකාලයක වැඩකටයුතු සිදු කර ගෙන යාමේ දී ද කාර්යාල කළමනාකරණය ඉතා වැදගත් වේ.

කාර්යාල කළමනාකරණය යනු කාර්යාලයක් එහි නිශ්චිත වූ අරමුණු වඩාත් ලාභදායීව ඉටු කර ගැනීම සඳහා මෙහෙයවීම සහ පාලනය කිරීමයි.

කාර්යාලයක මූලික කාර්යයන් වශයෙන් සන්නිවේදනය හා වාර්තාගත කිරීම ආදිය දැක්විය හැකිය. තොරතුරු ලබා ගැනීම : පුස්තකාලයක කටයුතු කිරීමේ දී ලිපි ගනුදෙනු සිදු කිරීම, මිල

ගණන් ලබා ගැනීම ආදි කටයුතු වලදී තොරතුරු ලබා ගැනීම දැක්විය හැකිය. තොරතුරු වාර්තා කිරීම : වාර්ෂික තොග ගණනය කිරීම් කටයුතු, කාර්ය මණ්ඩල වාර්තා සැපයීම මින් පෙන්වා දිය හැකිය. තොරතුරු සකස් කිරීම : සංඛ්‍යාලේඛන, වාර්තා සකස් කිරීම ආදිය පෙන්වා දිය හැකිය. තොරතුරු ලබා දීම : මව් ආයතනයට අවශ්‍ය තොරතුරු ලබා දීම එනම් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු, ඇස්තමේන්තු, ඉන්වොයිස් ආදිය පෙන්වා දිය හැකිය. වත්කම් ආරක්ෂා කිරීම, නඩත්තුව : පුස්තකාලයේ වත්කම වාර්ෂිකව ගණනය කිරීම ආදිය දැක්විය හැකිය.

පුස්තකාල මව් ආයතනයක් මගින් ක්‍රියාත්මක වුවද දෛනික කටයුතු කර ගෙන යාමේ දී එනම් ලිපිලේඛන කටයුතු සිදු කිරීම, වාර්තා කිරීම් ආදි කාර්යාල කටයුතු සිදු කෙරේ.

කාර්යාල කළමනාකරණයේ ප්‍රධාන අංග වශයෙන් අරමුණු, සංවිධානය, ක්‍රම, පිරිස්, පරිසරය හා යන්ත්‍රෝපකරණ දැක්විය හැකිය. කාර්යාල සේවා මධ්‍යගත කිරීම මගින් විධිමත් කාර්යාල ක්‍රමයක් පවත්වාගෙන යා හැකිය. ආයතනයක මධ්‍යගත කළ හැකි සේවාවන් වශයෙන් තැපැල (යන එන), දුරකතන සේවාවන්, පිටපත්කරණ සේවාවන්, ලිපිගොනුකරණය හා වාර්තාගත කිරීම්, ගණනය කිරීම්, ලිපිද්‍රව්‍ය හා කාර්යාල සැපයුම්, ආකෘති පත්‍ර පාලනය, පිරිසිදු කිරීම සහ ආපනශාලාව, රැකියා පුහුණුව, පැමිණීමේ වාර්තා, නඩු විධිවිධාන හා ප්‍රථමාධාර පෙන්වා දිය හැකිය. පුස්තකාල කාර්යයන්වල දී ද මෙම මධ්‍යගත සේවා දියත් කිරීමෙන් එහි කාර්යාල කළමනාකරණ කටයුතු පහසු කරවා ගත හැකිය.

අන්‍යායන්ගේ වැඩ අධීක්ෂණය කරන බැවින් පුස්තකාලයාධිපති ද කාර්යාල අධීක්ෂකවරයෙකු වෙයි. කාර්යාල කළමනාකරුවෙකුගේ ප්‍රධාන කාර්යයන් වශයෙන් කාර්යය කිරීමට උපදෙස් ලබා දීම, කාර්ය මණ්ඩලය පාලනය කිරීම, ඔවුන්ව රැකියා සඳහා පුහුණු කිරීම හා කාර්ය මණ්ඩලය සමග යහපත් මානව සම්බන්ධතා පවත්වාගෙන යෑම දැක්විය හැකිය.

පුස්තකාල කාර්යාල කළමනාකරණයේ දී වැඩ කොටස් සැලසුම් කිරීම, නියමිත වේලාවට වැඩ කටයුතු කිරීම, නිවැරදිබව, අනෙකුත් අංශ, දෙපාර්තමේන්තු සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම, වැඩ සාධාරණව බෙදා හැරීම සහ වැඩ කිරීමේ නව ක්‍රම සකස් කිරීම තුළින් මනා ලෙස කටයුතු කරවා ගත හැකිය. එසේම යටත් සේවකයන් ව පුහුණු කිරීම, අධ්‍යාපන අවශ්‍යතා දියුණු කරවීම, ණය ආදී පහසුකම් ලබා දීම සහ විනය නිසි ලෙස පවත්වාගෙන යාම ද වැදගත් වේ. කළමනාකරුවන් වශයෙන් පුස්තකාලයාධිපතිවරුන් ද තම වැඩ කටයුතුවල වගකීම භාර ගැනීම, අන් සමාන්තර ශ්‍රේණි සමග සහයෝගයෙන් කටයුතු කිරීම, කාර්ය මණ්ඩල හුවමාරු කිරීම අවසර දීම හා දිරිගැන්වීම සහ ආයතනයේ ප්‍රතිපත්ති බලාත්මක කිරීම ආදී කටයුතු සිදු කිරීම අවශ්‍ය වේ.

තව ද කාර්යාල කළමනාකරුවකු වශයෙන් වැඩකටයුතු පහසු කරනුවස් ආකෘති, පෝරම නිර්මාණය කිරීම හා භාවිත කිරීම පිළිබඳව වැඩි අවධානය ද යොමු කළ යුතුවේ.

මනා ලිපිගොනුකරණය ද කාර්යාල කළමනාකරණයේ ඉතා වැදගත් අංගයකි. කාර්යාලයීය කටයුතු වාර්තා කිරීම ලිපිගොනු මගින් සිදු කෙරෙන අතර නිසි ලෙස ස්ථානගත කිරීම, අවශ්‍ය අවස්ථාවල දී වාර්තා සැකසීම ආදිය මෙහිදී සිදු කෙරේ. පිළිගත් ලිපිගොනුකරණ ක්‍රමවේදයක් තිබීම ද වැදගත් වේ. ඉඩ, ප්‍රවේශ වීම, සරල බව, ආරක්ෂාව, නම්‍යශීලිත්වය, කාලය ඉතිරි කරවාගැනීම, හරස් විමර්ශන, යාවත්කාලීන කිරීම, පවතින තත්ත්වය පෙන්වා දීම හා නිසි වර්ගීකරණ සැලැස්මක් භාවිතා කිරීම ලිපිගොනුකරණයේ දී දැකිය හැකිය.

ලිපිගොනු වර්ග කිරීමේ ක්‍රම ඇත. එහිදී අකාරාදියට, අංක ක්‍රමයකට, භූගෝලීය කරුණු, විෂය හා කාලානුක්‍රමය අනුව ගොනු කිරීම සිදු කෙරේ.

වර්තමානයේ පුස්තකාල දියුණු තත්ත්වයක පැවතිමට එක් හේතුවකි, පුස්තකාල කාර්යාල කළමනාකරණ කටයුතු නිසි ලෙස පවත්වාගෙන යෑම. පුස්තකාල කාර්යමණ්ඩලය මෙහෙය වීම, භාණ්ඩ හා උපකරණ මෙන්ම ගොඩනැගිලි නඩත්තුව හා මූල්‍ය තත්ත්වයන් නිසි ලෙස පාලනය කිරීම තුළින් පුස්තකාලවල කටයුතු මනා සංවිධානාත්මකව සිදු කර ගත හැකිය.

## එලදායී මානව සම්පතක් බිහිකරමු - එම්.ජී ෂෙහානි මධුෂිකා

කැලණිය විශ්වවිද්‍යාලය

තිඹිරිගෙයින් ආරම්භ කරන අපගේ ජීවන චාරිකාව විටෙක බාදක කඩාගෙන ලස්සනට ගලායන දියඇල්ලක් වැනිය . තවත් විටෙක ඒකාකාරීව ගලාගෙන යන ගැඹුරක් නොපෙනෙන ගගක් වැනිය .මේ දෙකෙන් තමන් බාදක කඩාගෙන ,අභියෝගවලට මුහුණදීගෙන, නොනැවතී , ලස්සනට ගලායන දියඇල්ලක් වෙනවද, එහෙමත් නැතිනම් ඒකාකාරීව, ගැඹුරක් නොපෙනෙන, එකම ආකාරයට මුහුදට ගලාගෙන යන නිකම්ම නිකන් ගගක් වෙනවාද කියා තීරණය කිරීමේ අයිතිය හිමිවන්නේද තමාටමය . උපදින සැම සත්වයෙකුම මියෙන වග දන්නා අප ඉපදී මියෙන තෙක් කුමක් කලේද යන්න තමාගෙන්ම විමසා බැලියයුතු ප්‍රශ්ණයකි .තම රටට තම මහපොලවට තම හෘදසාක්ෂියට අවංකව වැඩකල එලදායී පුරවැසියෙකු වනවාද නැතිනම් මෙලොවට ජනිතවූ නිසා කාලය කා දමා සුසානය වෙත ගිය නිකමෙකුවනවාද යන්න තීරනය කිරිමේ අයිතිය අප සතුය .

එලදායී මානව සම්පතක් යනු සැබවින්ම රටකට සම්පතකි. එලදායී මානවයෙකුහට ලොවක් වෙනස් කල හැකිය. එලදායී මිනිසෙකු බිහිකිරීමෙහිලා ප්‍රමුඛතම කාර්ය පැවරී ඇත්තේ දෙමවුපියන්ටය. ඒ කුඩාකල සිටම හොද නරක කියා දෙමින් යා යුතු මාර්ගය පෙන්වන්නේ ඔවුන් නිසාය .ඉන්නික්බිතිව පාසලේ ගුරුවරුන්ගෙන් ,සමාජයේ වැඩිහිටියන්ගෙන් ආදී සැම කොටසකින්ම දරුවන් හොද නරක ඉගෙන ගනී .එවැනි යහපත් සමාජ සම්බන්දතාවයක ප්‍රතිඵලයක් ලෙස බිහිවන දරුවා රටට දැයට වැඩදායී එලදායී පුරවැසියෙකු වීම අනිවාර්ය කරුණකි .නමුත් අප සමාජයේ පිරිහීමට හේතුවන සමාජයටත් රටටත් අවැඩදායක ලෙස ජීවත්වන පුද්ගලයින් කොතෙකුත් දැක ඇත .විවිධ හේතුනිසා එවැනි පුද්ගලයින් සමාජයට ජනිතවුවද එසේ වීමටද විවිධවූ සාධාරන හා අසාධාරන හේතු පැවතිය හැකිය.
විශේෂයෙන්ම ,

1 දෙමාපියන්ගෙන් ලැබෙන අඩු අවධානය.

2 වැඩිහිටියන්ගේ අඩම්තේට්ටම් වලට ලක්වීම.

3 ගුරුවරුන්ගේ නොසැලිකිල්ලට භාජනයවීම.

4 සමාජයෙන් කොන්වීම.

වැනි විවිධ හේතුනිසා ඉහත කී ලෙස සමාජයට අවැඩදායක පුද්ගලයන් සමාජගත වේ. එලදායීතාව යනු අප උපතින් රැගෙනඑන දෙයක් නොවේ .එලදායී මිනිසෙකු වීමටනම් තිබිය යුත්තේ මොනවාද නොව, ප්‍රගුණකල යුත්තේ මොනවාද යන්න තදින්ම සිතට ගතයුතු කරුණකි. මක්නිසාදයත් අත් නොමැති මිනිසුන්ටද දෛවයක් තිබෙන නිසාවෙනි .අතෙහි රේඛාවකට දෛවය වෙනස්කල හැකිනම් අප මිනිසුන් ලෙස කොයි කොයි ස්ථානවල සිටීවිද ?

එලදායී මිනිසෙක් වන්නේ කෙසේද යන පැනයට විවිධ පුද්ගලයින්ට විවිධ අර්ථකතන ලබාදිය හැකිය. නමුත් මා හට අනුවනම් එලදායී එලදායී මිනිසෙකු යනු තමන් උපන් මහපොලවට බරක් කරදරයක් නොවී, ස්වශක්තියෙන්ම ඉදිරියෙන් ඉදිරියට යමින් තම අරමුණු එකින් එක ඉටුකරගන්නා සමාජශීලී, කාර්යක්ෂම මිනිසෙකි .එවැනි පුද්ගලයෙකු වීමට තම ආත්ම විශ්වාසය ප්‍රථම අත්වාරුව කරගතයුතු අතර ඉන්ඔබ්බට එවන් මිනිසෙකු වීමටනම් පහත ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලද නිරතවිය හැකිය.

1 යහපත් මානසික සෞඛයක් පවත්වාගෙන යන්න.

2 ව්‍යායාම සමග ප්‍රිතිමත්ව අවිදිවන්න.

3 අද කලයුතු දේ අදම කරන්න.

4 දින චර්යාවට කාලසටහනක් එකතුකර ගන්න.

5 පලමුවෙන්ම අමාරුදේ කරන්න.

6 හැකි සැම විටම පොතක් කියවන්න.

7 සමාජ මාධ්‍යයවල අවුල් කිරීම ඔබට අපහසු කරවන්න.

8 ඒ වෙනුවට මිනිසුන් සමග කෙලින්ම සමාජගත වන්න.

9 අඩුවෙන් නිදාගන්න වැඩියෙන් වැඩකරන්න.

10 ප්‍රියමනාපව සතුටින් ඉන්න.

ඉහත ආකාරයට ක්‍රියා කිරීම තුලින් අපට නොදැනුවත්වම ඵලදායී පුද්ගලයෙකු වීමේ මූලික අඩිතාලම දමාගත හැකිය. ඵලදායී පුද්ගලයින් සතුටින් සිටින බවත්, වඩා සතුටින් සිටින අය වඩා ඵලදායී බවත් පරීක්ෂණ මගින් සොයාගෙන ඇත .ඉතින් එසේනම් එවන් ඵලදායී පුද්ගලයෙකු වීමට ඔබත් අදම සිතට ගන්න. ඒ සදහා ඔබ ඔබේ සැලැස්ම  අදම ක්‍රියාවට නන්වන්න.  එපමනක් නොව ඔබ තම හිතවතුන් ද එම ගමනට එක්කරගන්නට අමතක නොකරන්න. සමාජය වෙනස්කල හැක්කේ සමුහයකට නොව තනි තනි පුද්ගලයන්ටය. ඔබ සමාජයට යහපත් දෙයක් දෙන්න. එවිට එවැනිම දෙයක් තවත් අයෙක් සමාජයට තිළිණ කරන්නට පසුබට නොවිය හැකිය. ප්‍රභාකරන්ලාත් දුටුගැමුණුලාත් බිහිවුයේ මෙවැනිම සමාජයකින් බව සිතට ගන්න. ඵලදායී මිනිසෙකු වන්න. ඔබේ යුතුකම සමාජය උදෙසා ඉටුකරන්න. එවිට ලෝකය වඩාත් අලංකාරවනු නොවනුමානය.

## வாசிப்பின் மாயாஜாலம் - M. T. Thasneem Mohamed

HDIPLIS - II,

வாசி! வாசி! வாசி!

வாசிப்பு அவ்வளவாக ஒன்றும் செய்து விடுவதில்லை…

வாசிப்பால் பெற்றுக் கொண்டது என்ன? என்றால், இல்லை…

வசித்த புத்தகங்களின் பெயர்கள் கூட நினைவில் இல்லை…

வாசித்துப் பெற்றுக் கொண்டேன் என மார்தட்டவும் எதுவுமில்லை…

வாசிப்பு ஏன்? ஏன் வாசிப்பு?

மனித இருப்பின் வெளிப்பாடு செயல்பாடுகளே...

உள்ளீடுகள் இன்றி செயல்பாடுகள் எங்கனம் சாத்தியம்...

வாசிப்பின்றி உள்ளீடுகளும் அசாத்தியம்...

வாசி! வாசி! வாசி!

'நீங்கள் சென்றடைய வேண்டிய இடத்தை நன்றாக அறிதில்லாவிட்டால் நீங்கள் வேறு இடத்தை சென்றடைய நேரிடலாம். அதுமட்டுமின்றி நீங்கள் வேறு இடத்தை அடைந்து விட்டீர்கள் என்பதே அறியாமல் இருக்கக்கூடும்.' (டாக்டர். ராபர்ட் மேர்ஜர்)

வாசிப்பின் மாயாஜாலம். உங்களை

மாயாஜாலம் 01. அகராதியாக ஆக்கும், சொற்களஞ்சியமாக விருத்தியடையச்செய்யும்.

மாயாஜாலம் 02. தேவையை, நோக்கத்தை அறிந்து நூல்களை, நபர்களை தேர்வு செய்து ஆலோசனை பெற்றுக்கொள்ளவைக்கும்.

மாயாஜாலம் 03. நினைவாற்றலை விருத்தியாக்கும்.

மாயாஜாலம் 04. எழுத்தாற்றலை செப்பனிடும்.

மாயாஜாலம் 05. வினைத்திறன், விளைதிறன் மிக்க தொடர்பாடல் மேற்கொள்ளச் செய்யும்.

மாயாஜாலம் 06. பிரச்சினைகளுக்கான சரியான தீர்மானங்களை வேகமாக, விவேகமாக எடுக்கச்செய்யும்.

மாயாஜாலம் 07. நிகழ்காலத்தில் வாழக் கற்றுத்தரும்.

மாயாஜாலம் 08. மொழிப்பாவனையை விருத்தியடையச்செய்யும்.

மாயாஜாலம் 09. புதிய வாய்ப்புகளை ஏற்படுத்தும்.

மாயாஜாலம் 10. நுணுக்கமாக சிந்தித்து செயல்படச் செய்யும்.

மாயாஜாலம் 11. எவ்விடயத்தையும் விரைவாக விளங்கி, சொந்த அபிப்பிராயத்தையும், நிலைப்பாட்டையும் அடையச் செய்யும்.

மாயாஜாலம் 12. கூட்டாக, ஓரணியாக செயல்பட வழிகாட்டும்.

மாயாஜாலம் 13. பொழுதைப் பயனுள்ளதாக்கும்.

மாயாஜாலம் 14. தர்கிக்கும் ஆற்றலையும், நியாயப்படுத்தும் தன்மையையும் உண்டாக்கும்.

மாயாஜாலம் 15. ஒருமைப்பாட்டை வளர்க்கும், பிளவைத்தவிர்க்கும்.

மாயாஜாலம் 16. அதிக அளவான செய்திகளையும் கருத்துக்களையும் தகவல்களையும் சேமிக்கத்தரும்.

மாயாஜாலம் 17. மன அழுத்தத்தை குறைக்கும்.

மாயாஜாலம் 18. ஆளுமையை பலப்படுத்தும், வளப்படுத்தும், மேம்படுத்தும்.

மாயாஜாலம் 19. சுய ஊக்குவிப்பாளனாக்கும்.

மாயாஜாலம் 20. சுய விழிப்புணர்வைத்தரும்.

மாயாஜாலம் 21. அகநிலையை நேர்நிலையாக நிர்வகிக்கும்.

மாயாஜாலம் 22. சமூகத் திறன்களை வளர்க்கும்.

மாயாஜாலம் 23. சுதந்திரமான கலந்துரையாடல்களை மேற்கொள்ளச் செய்யும்

மாயாஜாலம் 24. பரிவை, பணிவை, பக்குவத்தை, பண்பைக் தரும்.

# සිංහල කවියේ විකාසය හා ගිවෝන් යානිකා නන්දසේන කිවිඳියගේ කාව්‍ය අනුභූතිය පිළිබඳ හරස්කඩක් - ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස

**වැඩ බලන පුස්තකාලයාධිපති**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

කවියේ හෙවත් කාව්‍යයේ ඉතිහාසය ඈත අතීතය තෙක් දිවෙයි. දැනට සොයා ගෙන ඇති ආදීම පද්‍ය නිර්මාණය ක්‍රි. පූ. පළමු ශත වර්ෂයට පමණ අයත් වේ. බුදු ගුණ පවසන ඒ පද්‍ය බ්‍රාහ්මී අක්ෂරයෙන් ගල් මතු පිට කොටා ඇති ඒවා ය. ප්‍රාග් අනුරාධපුරයේ සිට ද කවිය පිළිබඳව නිදසුන් සඳහන් වේ. ''රත්තිං තුරිය සද්ධං ච'' යන මහාවංශ පාඨයට අනුව රාත්‍රි කාලයේ තූර්ය වාදනය සහිත ගීත රාවයක් ඇසූ විජය කුමාරයා තමන් සමඟ සයනෙහි සිටි කුවේණිය අමතා ඒ රාවය කුමක්දැයි අසා ඇත. එයට පිළිතුරු දුන් ඇය පවසා ඇත්තේ ආවාහ මංගල්‍යයක් පිළිබඳ උත්සවයක් පවත්වන බවත්, මේ ඇසෙන්නේ එහි නැටුම් ගැයුම් වැයුම් හඬ බව කියමින් ද පිළිතුරු දුන් බව මහවංශය වැඩිදුරටත් විස්තර කර ඇත.

සිංහල කවිය ප්‍රාග් බෞද්ධ යුගයේ සිට අධ්‍යයනය කිරීමට අවශ්‍ය සාධක සාහිත්‍යය මූලාශ්‍රය නිරීක්ෂණයෙන් ද විද්‍යමාන වේ. ලක්දිව ලේඛන විධිමත් ව සකස්වෙමින් වැඩෙන්නට වූ මුල් අවධියේ පවා ලියවුණු ශිලා ලේඛන කිපයක් ම පද්‍යයෙන් රචනා වී තිබීම මේ සම්බන්ධයෙන් තවත් වැදගත් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදන්කඩවල අසල කොස්සවකන්ද (කොස්ගොඩ කන්ද) නම් ස්ථානයෙන් ද, දකුණු පළාතේ මාගම් පත්තුවේ කිරින් ද සමීපයේ ද තිබී හමු වූ ශිලා, ලේඛන මෙම කාරණය සම්බන්ධයෙන් වැදගත් නිදසුන් ය.

පැරණි සිංහල කවිය පිළිබඳ ප්‍රබල සාක්ෂි සීගිරි ගීවලින් ලැබේ. සීගිරි ගී රචනා කළ කාල සීමාව ක්‍රි. ව. 700 - 900ත් අතර කාලය නමුත් එයට පෙර සියවසේ සිංහල කවිය බෙහෙවින් ප්‍රකට විය. 19 වන සියවසේ අග හා 20 වන සියවසේ මුල පටන් ඉංග්‍රීසිය ඔස්සේ විදේශීය සාහිත්‍යයන්ගේ බලපෑම් ආරම්භ වන තෙක් මෙරට පද්‍ය කාව්‍ය ආදර්ශයට ගන්නා ලද්දේ භාරතීය කාව්‍ය විචාර සම්ප්‍රදායයි.

ක්‍රි. ව. 1815 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසි ආධිපත්‍යය යටතට පත්වීම නිසා පොදුවේ සිංහල සමාජය ද සංස්කෘතිය ද ඊට සමාන්තරව සිංහල කවිය ද විවිධ විපර්යාසයන්ට භාජනය විය. ඉන්පසුව විසිවන සියවසේ මුල් භාගයේ සිට නැවත සිංහල කවියේ ප්‍රබෝධයක් ඇති විය. එහි දී දේශීය සිංහල සංස්කෘතිය, ආගම දහම, ස්වභාවය සෞන්දර්යය, ආදරය, ප්‍රේමය වැනි මනෝභාව හා ජාතික නිදහස් අරගලය වැනි අංශ පිළිබඳ අවධානය වර්ධනය විය. ශ්‍රීමත් අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර, ජෝන් ද සිල්වා, පියදාස සිරිසේන ආදී ජාතික ව්‍යාපාරයේ පුරෝගාමීන්ගේ අදහස් රට පුරා ව්‍යාප්තියට සිංහල කවිය ක්ෂේත්‍ර ගණනාවකින් බලපා ඇති බව ද නිරීක්ෂණය වන තවත් කරුණකි.

වර්තමාන කවිය හෙවත් නිදහස් කවිය සඳහා රෝමැන්ටික කවියටත් වඩා බටහිර කවියෙන් ආභාසය ලබා ඇත. බටහිර නව කවිය පිළිබඳ ආභාසයක් ලබා ගැනීම මගින් සිංහල කවිය නිවැරදිව හඳුනාගත හැකිය. මාතර යුගයේ කවිය පිරිහීමත් සමඟ ම කොළඹ යුගයේ කාව්‍ය නිර්මාණකරණය ආරම්භ විය. මෙම යුගයේ මුල් පරපුරේ කාව්‍ය නිර්මාණකරුවන් අතර පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදාස, රැපියෙල් තෙන්නකෝන්, බොරලැස්ගමුවේ ජී. එච්. පෙරේරා හා ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි යන පිරිස කැපී පෙනෙන සේවාවක් කර ඇත. කවිය අවියක් කර ගෙන සමාජය අවදි කරන්නට කටයුතු කර ඇති බව ඔවුන්ගේ නිර්මාණ අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

කොළඹ යුගයේ මුල් පරපුරේ කවියන් විසින් එම යුගයේ දී කවි කොළ, කවි මඩු, කාව්‍ය සංග්‍රහ ආදී නිර්මාණය රැසක් බිහිකරන ලදි. ඒ අතර කවි කළඹ, කවි මිණි නිධාන හා කවි මුතු සයුර ආදි නිර්මාණ ද දැකිය හැකිය. මොවුන් පැරණි කවිය නිර්මාණයේ දී අරමුණු කර ගන්නා ලද්දේ හෙළ සිරිත් වගා කරමින් පැරණි ශ්‍රී විභූතිය වර්ණනා කිරීමටයි. එහි දී දේශානුරාගය ඇති වන පරිදි කව්‍ය නිර්මාණ බිහිකිරීමට මෙම යුගයේ සමහරක් කවීහු වැඩි නැඹුරුතාවක් දැක්වූහ.

කොළඹ යුගයේ කවිය දියුණුවේ උපරිම අවස්ථාවට පත්වූයේ දෙවන ලෝක යුද්ධයත් සමඟ ය. ඒ අනුව කොළඹ යුගයේ දෙවන පරපුර නියෝජනය කළ කවීන් කීපදෙනෙක් ම විශේෂත්වයක් කර දක්විය හැකිය. ඒ අතරින් සාගර පලන්සූරිය, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, පී. බී. අල්විස් පෙරේරා, මීමන ප්‍රේමතිලක, එච්. එම්. කුඩලිගම හා විමලරත්න කුමාරගම යන අය කැපී පෙනෙන කාව්‍ය රචකයෝ වෙති. මෙම යුගයේ අපර ගණයේ කවියන් වශයෙන් බඹරකොටුවේ සුධම්ම, කපිල ඒ සෙනෙවිරත්න, යූ. ඒ. ඇස්. පෙරේරා, ජෝන් රාජදාස, මාකඳුරේ ගුණවර්ධන, විල්සන් හැගොඩ, උඳුගොඩ නවරත්න, බී. එච්. අමරසේන, හොරණ කුමාරසිංහ, තිහාරියේ පීටර් පෙරේරා, වස්කඩුවේ සීලදාස හා බැන්ටිස් රණවීර යන අය කැපී පෙනෙති.

කොළඹ යුගයේ දෙවන පරපුර නියෝජනය කළ කවීන් මුල මැද එළිසමය ප්‍රිය කර නැත. ටෙනිසන්, පී. බී. ෂෙලි, විලියම් වර්ඩ්ස්වර්ත්, ජොන් කීට්ස්, කෝල්රිජ්, ගෝල්ඩ්ස්මිත් ආදී බටහිර අද්භූතවාදී (රොමැන්ටික්වාදී) කවීන්ගේ ආභාසය ද පෙරදිග මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර්යන්ගෙන් ලද ආභාසය ද කැපී පෙනෙයි. මොවුහු සියලු දෙනා ම තරුණ කවියෝ වූහ. මෙම යුගයේ දී කවි සඳහා සමාජය තුළ වැඩි ඉල්ලුමක් ද පැවතුනු හෙයින් ක්ෂණිකව කවි නිර්මාණය කිරීමට මොවුනට සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ හරවත් බවින් අඩු නිර්මාණ බිහිවීම නිසා කවිය අසාර්ථක වීමයි.

නූතන යුගයේ හෙවත් කොළඹ යුගයේ කවිය පිළිබඳව අධ්‍යයනයෙන් පසුව එහි ආභාසය ලද වර්තමාන කවිය හෙවත් නිදහස් කවිය හා එහි නව ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කළ යුතුය. කාව්‍යය ක්ෂේත්‍රයෙහි නව අරුනලු උදාවන්නට ''පළිගැනීම'' නමැති කෘතිය ඉවහල් විය. 1946 වසරේ ජී. බී. සේනානායක මහතා විසින් රචිත පළිගැනීම නම් කෙටිකතා සංග්‍රහයෙන් නව කාව්‍ය සම්ප්‍රදායක් සිංහල සාහිත්‍යයට එකතු වූයේ ය. මෙම නව කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳව ජී. බී. සේනානායක මහතා කරන ලද ප්‍රකාශයට ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. එහි දී ඔහු මෙසේ පවසයි.

මේ පොතෙහි පද්‍යාවලින්ගේ විලාසයෙන් එන නිබන්ධ මා සලකන්නේ ගද්‍යයට ද, පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක් වශයෙනි. ඒවා කියවිය යුත්තේ ගද්‍ය කියවන ලෙස ය. එහෙත්, කියවීමේ දී ශබ්ද සංඝටනාවෙහි මාධූර්යය කෙරෙහි දක්වන සැලකිල්ල ගද්‍ය කියවීමේ දී ඒ අරබයා දක්වන සැලකිල්ලට වැඩි විය යුතුය.'' මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ජී. බී. සේනානායක මහතා නව කාව්‍ය සම්ප්‍රදාය නිසඳැස් කවි වශයෙන් හෝ නිදහස් කවි වශයෙන් හඳුන්වා නොමැති බවයි.

ගද්‍ය මෙන් එකදිගට නොව පද්‍ය සේ පාදවලට වෙන් කොට ලිවීමට ඒ නිර්මාණයන්ගේ ලක්ෂණයයි. ඉංග්‍රීසි Blank verse, Free verse යන අංගයන්ගේ බලපෑමෙන් ආරම්භ වී එසේ ම ඡන්දසකට අනුකූලතා දක්වීම අපේක්ෂා නොකරන එම කාව්‍ය සාමාන්‍ය සිංහල පද්‍ය කාව්‍ය මෙන් ශ්‍රැති ගෝචර නොව දෘෂ්ටි ගෝචර පක්ෂයට නැඹුරු වන්නේ ය. මෙම සාහිත්‍යාංගය පද්‍ය යනුවෙන් නොව කාව්‍ය නමින් හැඳින්වීම සිරිත ය. ඒ සඳහා නිසඳැස් පද්‍ය හෝ නිදහස් පද්‍ය යන්න නොව නිසඳැස් කාව්‍ය, නිදහස් කාව්‍ය යන ව්‍යවහාර වඩාත් උචිත වන්නේ ය.

නිදහස් කාව්‍ය සම්ප්‍රදායේ විකාසයෙහි තුන්වන පරම්පරාව නියෝජනය කරන කවියන් අතර පරාක්‍රම කොඩිතුවක්කු, විමල් දිසානායක හා මොනිකා රුවන්පතිරණ යන නිර්මාණකරුවන් විශේෂත්වයෙහිලා සඳහන් කළ හැකිය. පළමු පරම්පරාව ජී. බී. සේනානායක, සිරි ගුනසිංහ හා ගුණදාස අමරසේකර යන කවියන් ද, දෙවන පරම්පරාවට මහගමසේකර වැනි කවියන් ද අයත් වේ.

80 දශකයේ පුරෝගාමී කවියෙකු වශයෙන් රත්න ශ්‍රී විජේසිංහ ගෞරවාදරයට ලක්වෙයි. ඔහුගේ කාව්‍ය නිර්මාණ සමූහය නූතන සිංහල කාව්‍ය ව්‍යාපාරයේ දී ද නූතන ගීත සාහිත්‍යයේ ද විශිෂ්ට මං සලකුනකි. මහගමසේකර ගෙන් පසුව ගීතය ද කවිය ද යන ක්ෂේත්‍ර දෙකෙන් ම කැපී පෙනෙන ප්‍රතිභාවක් පෙන්නුම් කරන ලද්දේ රත්න ශ්‍රී විජේසිංහයන් බව විවාද රහිත ය. ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය බිය නොවන් අයියන්ඩි (1979) වන අතර ඉන්පසුව වස්සානය (1985), සුභ උදෑසන (1988), සල් ගහ යට (1996) හා තරු ලකුණ (1997) ආදී විචාරක අවධානයට පාත්‍ර වූ පද්‍ය සංග්‍රහ කීපයක් ම රචනා කර ඇත.

අනුරාධපුර යුගයේ සිට සිංහල කාව්‍යකරණය හා කාව්‍ය රචනා මෙන් ම කැපීපෙනෙන කාව්‍ය කෘති කළ කවියන් කීපදෙනකුගේ නාමයන් සඳහන් කරන ලද්දේ ඒ සියලු නිර්මාණකරුවන් අතර නූතන පරපුරේ කිවිඳියක වන ගිවෝන් යානිකා ස්ථානගත වන්නේ කුමන ආස්ථානයක ද යන්න අධ්‍යයනයට පසුබිමක් සකස්කර ගැනීමට පදනමක් වශයෙනි. එමෙන් ම, යානිකාගේ ''සිතුවිලි රළ'' නම් වූ ඇයගේ ප්‍රථම කාව්‍ය කෘතියෙන් සිංහල කවියට කෙරෙන බලපෑම ශාස්ත්‍රාලයීය පරිසරයක අධ්‍යයනය සඳහා ය.

90 දශකයේ කාව්‍ය නිර්මාණ සඳහා විදග්ධ සම්ප්‍රදායට ප්‍රවිෂ්ඨ වන ගිවෝන් යානිකා අපගේ කාව්‍ය නිර්මාණ පරම්පරාවේ ශාස්ත්‍රාලයීය විකාසයේ නවතම සොයා ගැනීමකි. ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත යන පිරුළ අසත්‍යයක් බවට ඔප්පු කළ මානව ප්‍රාග් ධනයේ ජීවමාන සාධකයක එක් පරිච්ඡේදයක් ඇයගේ මෙම කාව්‍ය සංග්‍රහයෙන් විවෘත වෙයි. ගිවෝන් යානිකා නන්දසේන මහත්මිය වෘත්තියෙන් වරලත් පුස්තකාලයාධිපතිනියකි.

වර්ෂ 1995 දී සඳරේණු පුවත්පතට ලියන ලද ''සමුගැනීම'' නම් වූ කාව්‍ය නිර්මාණය වාච්‍යාර්ථය ඉක්මවා ගිය බව අපට පසක් වන්නේ වසර 29ක එනම්, දශක තුනකට ආසන්න කාලයක ඇය කළ හපන්කම් පිළිබඳ අතීතාවර්ජනයෙනි. පාසල් අධ්‍යාපනය තුළ ලබාගත් විවිධ විෂයක කුසලතාවලින් කැපීපෙනෙන ශිෂ්‍යාවක වශයෙන් 1995 දී සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ කලා උළෙල ඇයගේ සාහිත්‍ය ගමන් මාර්ගයේ තවත් සුවිශේෂ කඩයිමකි. නිර්මාණ චාරිකාවේ පළමු සම්මානය තම පාසලෙන්ම ලබා ගැනීමට යානිකා වාසනාවන්තියක වූවාය. වර්තමානයේ නූතන සයිබර් අවකාශයේ කවි පිටුවල නිර්මාණකරණයෙන් නිරන්තර ඇගයීමට ලක්වන කිවිඳියක වශයෙන් කාව්‍ය නිර්මාණකරුවන් අතර ඇයට හිමි ස්ථානය විචාරක අවධානයට ලක් වී ඇත.

නූතන සිංහල කාව්‍ය පරපුරේ විරෝධාකල්ප දක්වන කිවිඳියක වන ඇය නිර්මාණශීලී ලේඛිකාවකි. ප්‍රතිරාව නම් වූ සඟරාව සංස්කරණයෙන් ඒ බව ප්‍රකට කර ඇත. 2021 හා 2022 වර්ෂවල එම සඟරාවේ සංස්කාරක වශයෙන් සාහිත්‍යය කෙරෙහි ඇය සතු නිර්මාණාත්මක කුසලතාව පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විමර්ශන නම් වූ ශාස්ත්‍රීය සඟරාවේ ප්‍රකාශන නිලධාරි වශයෙන් 2019 - 2020 වර්ෂයට කරන ලද සේවයත්, පර්යේෂණාත්මක විෂය ක්ෂේත්‍රයට අදාළ සාහිත්‍යකරණයෙහි ද ඇයගේ භූමිකාව පුස්තකාලය හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට ආගන්තුක නොවේ.

යානිකාගේ සිතුවිලි රළ කාව්‍ය සංග්‍රහයෙහි එන කාව්‍ය නිර්මාණ ගණන එකසිය විස්සකි. නොනවතින ගමන, පියල්ගේ පාපෝච්චාරණය, ධාතුසේන රජුගේ අවසන් හෝරාව, තවදුරයි ජීවිතේ, උද්ධමනය, වියලුනු රෝස කුසුම, මගේ සඳ නුඹ, මැයි මල් පිපිලා, සිත්තරානනි, වරාමල්, සීගිරි අප්සරා, මැණික මගේ, සොබාදම් අසිරිය, විරාගයේ අරවින්ද කියයි ආදී වශයෙන් දිග හැරෙන යානිකාගේ පරිකල්පන ශක්තිය, ජීවන අත්දැකීම් හා කාව්‍ය අනුභූතිය නූතන සිංහල කවියේ හරස්කඩකි. මේ සෑම කාව්‍ය නිර්මාණයකම එකිනෙකට වෙනස් ජීවන අත්දැකීම් විස්තර කිරීම ඇයගේ නිසඟ කාව්‍ය ප්‍රතිභාව පෙන්නුම් කරන බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ගිවෝන් යානිකා නිර්මාණශීලී කිවිඳියක බව මේ කෘතියෙහි එන නිර්මාණවලින් පෙන්නුම් කෙරෙන්නේ ගෙන්දගම් පොළොවෙහි ජීවත්වීම ඇයගේ කාව්‍ය අනුභූතිවලට ගැටලුවක් නොවූ බව පෙන්නුම් කරමිනි. නාගරික සමාජයේ මධ්‍යම පාන්තික පුරුෂාර්ථ මෙන් ම, ශ්‍රී ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන පිරිසගේ ජීවන අපේක්ෂා ද නිරීක්ෂණයෙන් තම කාව්‍යට අවශ්‍ය වස්තු බීජ සපයා ගෙන ඇත. නොනවතින ගමන, රාජ්‍ය සේවය පිණිසයි හා උද්ධමනය වැනි කාව්‍ය නිර්මාණ ඊට කදිම නිදසුන් වේ. ඇතැම් මිනිසුන් උසස් තනතුරුවලට පත් වූ විට මුල අමතක වීම සුලභ මිනිස් ගතියකි. එහෙත්, එය සංවේදී සිතකට නම් කෙතරම් රළු ද යන්න ''මං මුලා වූ වන්නා නම් වූ කුවණ්ණා ඈ'' කාව්‍ය නිර්මාණයෙන් මනා සංයමයකින් යුතුව ධ්වනිත කරයි. මෙය සියුම් චරිත නිරූපණයක් ද සහිත සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව වෙත රැගෙන යන නිර්මාණයකි.

ස්වකීය කව්‍ය නිර්මාණයන් සඳහා බොහෝ විට අනුභූති කර ගෙන ඇත්තේ ප්‍රේමය, ස්ත්‍රිය, සමාජ විෂමතාව, ස්වභාවික පරිසරය, සමාජ අසාධාරණය වැනි සංකල්පනා ය. ඒ සඳහා බටහිර කවියේ ආභාසය ද ඇය ලබා ගෙන ඇත. මෙහි දී රොමැන්ටික් කවියන් එනම්, ඇල්ෆ්‍රඩ් ටෙන්සන්, වර්ඩ්ස් වර්ත්, තෝමස් ග්‍රේ, ඔවර් ගෝල්ඩ්ස්මිත් හා ශෙලි යන කවීන්ගේ ආභාසය සාර්ථක ලෙස ලබා ගෙන ඇති බව සිතුවිලි රළ කාව්‍ය සංග්‍රහයේ එන නිර්මාණ විචාරාත්මක අධ්‍යයනයකින් තේරුම්ගත යුතු සත්‍යයකි. පෙරදිගින් රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ හා ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් කාව්‍ය ආභාසය ලබා ඇති බව ද නිදහස් මනසකින් ඇයගේ නිර්මාණ නිරීක්ෂණයෙන් ප්‍රකට වේ.

සැබෑ අත්දැකීම් පදනම් කොට ගෙන මානව භක්තියෙන් යුක්තව තම අදහස් සරල බසින් ඉදිරිපත් කිරීම ගිවෝන් යානිකාගේ කාව්‍ය ප්‍රතිභාව ප්‍රකට කරන්නකි. මේ නිසා ඇයගේ කාව්‍ය රචනා තවදුරටත් විචාරකයන්ගේ ප්‍රසංසාවට ලක් විය යුතු බව මාගේ විශ්වාසයයි. කාව්‍ය රචනයේ දී පෙරදිග සම්ප්‍රදායන් පිළිබඳ ශාස්ත්‍රීය දැනුමක් පැවති බව පෙන්නුම් කර තිබේ. කාව්‍ය ආකෘතිය පිළිබඳ විමසීමේ දී කෝට්ටේ, සීතාවක, මහනුවර, මාතර යුග ඔස්සේ වැඩී ආ මුල, මැද හා අග එළිසමය සහිත සිව්පද ආකෘතිය සේම

නිසඳැස් ආකෘතිය ද අනුගමනය කිරීමට යොමු වී ඇත. තමන් අවට සිටින ජනතාවගේ අදහස්, ආගමික විශ්වාස හා හැඟීම් පිළිබඳ සියුම් අවබෝධයක් තිබූ යානිකා එම විශ්වාස ගැරහීමට ලක් කර නැත. ඇයගේ නිර්මාණවල විශේෂත්වය හෙවත් කාව්‍ය අනුභූතියට අදාළ ප්‍රධාන තේමාවන් පහත සඳහන් අයුරින් කෙටියෙන් දැක්විය හැකිය.

1. ප්‍රේමය, ආදරය, විප්‍රලම්භය වස්තු විෂය කර ගැනීම.

2. ස්වභාව සෞන්දර්ය, අවට පරිසරය හා එහි චමත්කාරය ඉතා ඉහළින් වර්ණනා කරමින් කාව්‍යයට අවශ්‍ය වස්තු බීජ සපයා ගැනීම.

3. අතීත සභ්‍යත්වය, වාපී සංස්කෘතිය, ජාත්‍යාලය හා නිදහස පිළිබඳව කවි රචනා කිරීම.

4. එදිනෙදා ජීවන ප්‍රශ්න, ජීවිත අපේක්ෂා හා දුගී දුක පිළිබඳ අවධානය යොමු කිරීම.

5. මායාව, හාස්‍ය, උපහාසය, සංස්කෘතික සංස්පර්ශය ප්‍රශ්න කරවන සේ කවි පබැඳීම.

6. වෘත්තීය අරගල හා සමාජ අසාධාරණය එරෙහිව පෙනී සිටීම.

7. පන්ති හා පුර්ෂාර්ථ පිළිබඳ කාල්මාක්ස්ගේ විග්‍රහය ඇසුරෙන් කාව්‍ය අනුභූති සපයා ගැනීම.

8. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනස පිළිබඳ විග්‍රහය සියුම් නිරීක්ෂණයෙන් නිර්මාණ කාර්යය පෙහොසත් කර ගැනීම.

9. සම්මානිත සාහිත්‍යය කෘති නැවත කියැවීමට අවශ්‍ය පසුබිම නිර්මාණාත්මක පරිසරයක විදග්ධ ආකාරයට නැවත ස්මරණය කරවීම.

10. ශ්‍රී ලාංකේය ඉතිහාසය පෙරදිග දෘෂ්ටිකෝණයෙන් නැවත කියැවීමකට ආරාධනා කිරීම.

නූතන පරපුරේ කිවිඳියක වශයෙන් ගිවෝන් යානිකා නන්දසේන නම් වූ අපේ කථානායිකාව තමන් අවට සිටින ජනතාවගේ අදහස් හා හැඟීම් අවබෝධ කරගෙන තිබුණි. ගැමියන් හා දුප්පතුන්ගේ ජීවිත බොලඳ හැඟීමකින් දකින්නකු නොවීය. වැටහෙන නුවණකින් ගැමි ජීවිතය දෙස බැලීම ඇය සතු විශේෂ ලක්ෂණයකි. සංයත හැඟීමෙන් හා සංවිධාන ගුණයෙන් යුක්තව කවි රචනා කර ඇත. ගතානුගතිකත්වයෙන් තොරව සිටිමින් කල්පනාත්මක දෘෂ්ටියකින් මිනිස් චරිත දෙස බලා ඇත.

කාව්‍යයකින් ඉදිරිපත් කරන අදහස් අනෙක් බසකින් පැවසිය හැකිය. වචන ද අනෙක් බසකට පෙරළිය හැකිය. එහෙත්, ශබ්දාර්ථ දෙකෙහි සංකලනයෙන් සිද්ධ වූ සමස්තාර්ථවත් වින්දනය හෙවත් කාව්‍යය පරිවර්තනය කිරීම අසීරු ය. කවියා භාෂාවේ ව්‍යංජන ශක්තියෙන් උපරීම ප්‍රයෝජන ගන්නෙකි. සිතුවිලි රළ කාව්‍ය සංග්‍රහයේ එන නිර්මාණවල ද එකී ලක්ෂණ විද්‍යාමාන වේ. ශාස්ත්‍රීය ලේඛනයේ දී මෙන් අර්ථය අවබෝධ කර ගැනීම පිණිස පමණක් වචන භාවිතයක් කාව්‍යයෙහි නොමැත. ගිවෝන් යානිකා අපට වැදගත් වන්නේ එකී නිර්මාණාත්මක කාර්යය හා ඊට අවැසි භාෂාත්මක පරිඥානය සහිත කිවිඳියක් බව ඇයගේ කෘතියෙන් නූතන සමාජයේ සහෘද පිරිසට අමාන්ත්‍රණය කරමිනි. ආරාධනා කරමිනි.

## කැත්ලීන් ජයවර්ධනගේ ද්‍රෝහී කෘතිය පිළිබඳ විමසුමක් - උදිත අලහකෝන්

සහකාර පුස්තකාලයාධිපති
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය




මානවකේන්ද්‍රවාදය සහ සොබාදම්කේන්ද්‍රවාදය පිළිබඳ කතිකාවට ඉතිහාසයක් පැවතියද එය සිංහල පාඨක සමාජයේ අවධානයට ලක්වූයේ මෑතකදිය. මේ සඳහා ලෝක ප්‍රකට කෘති කිහිපයක සිංහල පරිවර්තන හේතුවූ බව රහසක් නොවේ. යුවාල් නොආ හරාරිගේ Sapiens (සේපියන්ස්/සේපියන්ස්ලා), ජෝන් ග්‍රේගේ Straw dogs (පිදුරු බල්ලෝ සහ රුගර් බ්‍රෙග්මාන්ගේ Humankind (මනුසත්වග) ඒ අතරින් ප්‍රමුඛ වේ. මිනිසා මූලික කොට ගත් ශිෂ්ටාචාරමය ජයග්‍රහණ පිළිබඳ නැවත සිතා බැලීමක් වෙතට ලෝකය යොමු කිරීමට මෙම කෘති සමත් විය. ශාස්ත්‍රීය ලෝකයේ සිදුවන මෙම කතිකාව ප්‍රබන්ධ අවකාශයට ගෙන ඒමට ගත් ප්‍රයත්නයක් ලෙස කැත්ලීන් ජයවර්ධනගේ ද්‍රෝහී නවකතාව හැඳින්විය හැකිය.

නීතිඥවරයකුගේ පරිකල්පිත චරිතාපදානයක් ඔස්සේ මෙහි කතාපුවත ගලා යයි. ක්‍රිෂ්ණ නම් වන ඔහු සහ ඔහුගේ ස්ත්‍රී පුරුෂ සබඳතා මත එය ගොඩ නැංවෙයි. මෙම ස්ත්‍රීන් අතර ගෘහණියක්, ලිංගික ශ්‍රමිකයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් සහ ඇයගේ දියණිය ද වෙති. පිරිමින් අතර සමාජයේ ඉහළ තලය නියෝජනය කරන්නන් සිටී. මෙම සබඳතා හරහා ශිෂ්ටාචාරමය අර්බුදයේ විවිධ මානයන් ස්පර්ශ කිරීම කතුවරියගේ අරමුණ වී ඇත. නවකතවේ ප්‍රධාන චරිත මානවකේද්‍රවාදය බරපතළ ලෙස විවේචනය කරන්නෝ වෙති. මේ අනුව කතුවරිය විද්‍යාවේ සහ තාක්ෂණයේ දියුණුව සැබැවින්ම දායක වී ඇත්තේ පෘථිවි තලයේ පැවැත්මටද නැතහොත් විනාශයටද, එසේම නීතිය, දේශපාලනය, පුද්ගල සබඳතා , ලිංගිකත්වය යනාදියෙහි වර්තමානයේ පවත්නේ ඇත්තෙන්ම ශිෂ්ටාචාරමය ස්වභාවයක්ද යන ප්‍රශ්න පාඨකයා ඉදිරියේ තබයි. එමෙන්ම මෙකී ක්ෂේත්‍රවල මතුපිටින් නඩත්තු කරන ශිෂ්ටත්වයට යටින් පවත්නා අශිෂ්ටත්වයත් එහි කැකෑරෙන ප්‍රතිවිරෝධතාත් ඇයගේ අවධානයට ලක් වෙයි. කතාපුවත මුල සිට අගටම ගලායන්නේ මෙම විරුද්ධාභාසී ස්වභාවය සංවාදයට ගනිමිනි. ද්‍රෝහී නවකතාව සදාචාරය සහ දුරාචාරය පිළිබඳ අලුත් ශිෂ්ටාචාරමය සිතීමක් වෙත යොමුවීමට අපට බල කරයි.. එය වත්මන් සදාචාරයේ නිර්ණායක ප්‍රශ්න කරයි. මේ අනුව ලිංගික ශ්‍රමිකයකු විකුණන්නේ තමන්ගේ ශරීරයයි. එය ඇයගේ / ඔහුගේ පෞද්ගලික දේපළකි. එහෙත් දේශපාලකයා විකුණනන්නේ පොදු දේපළය. එසේ නම්, සදාචාරය සහ දුරාචාරය අර්ථකථනය කරන්නේ කෙසේද ? තමන්ට තවදුරටත් ජීවත්වීමට කැමැත්තක් නොමැති නම් සියදිවි නසා ගැනීමට අයිතියක් නැත්තේ ඇයි ? එහෙත් එවිට නීතියද සදාචාරයද අවි ඔසවා ගනී. එමෙන්ම විකාරරූපී අනීතික ස්වභාවයක් පවතින විට නීතිය හැදෑරීමේ විකාරරූපීත්වයද වැරදිකාර මිනිසුන් එවැනිම වැරදිකරුවන් විසින් විනිශ්චය කරනු ලැබීමද වත්මන් ශිෂ්ටත්වයේ ලක්ෂණ වෙති. කැත්ලීන් මෙම ශිෂ්ටාචාරමය කතිකාව ආගමික දෘෂ්ටිවාද, පයීත සහ චර්යාවන් දක්වා ව්‍යාප්ත කරයි. මෙහිදී ඇය ආගමික පයීතවල පවත්නා ප්‍රතිවිරෝධතා වෙතද ශික්ෂාපද එලෙසම අනුගමනය කිරීමේ ගැටලු වෙතද අවධානය යොමු කරයි.එක් චරිතයක් මෙසේ

පවසයි " පන්සල්වලින් ඇර අපාය දකින්න වෙන විදිහක් නෑ." මෙය අතිශයින් තියුණු හැඟවුම් අර්ථයක් දනවන ප්‍රකාශයකි. තවද, මෙම ශිෂ්ටාචාරමය කතිකාව තුළ විවාහය, මූලික අයිතිවාසිකම්, සත්ව හිංසනය, පාරිසරික ගැටලු, දෙවියන්, සොබාදහම, නිර්ආගමිකත්වය, මරණය ක්‍රියාකරන ආකාරයේ ශිෂ්ටත්වය හෝ අශිෂ්ටත්වය විනිවිදීමට කතුවරිය අපට ආරාධනා කරයි. ශිෂ්ටත්වය සහ අශිෂ්ටත්වය අතර පවත්නා මෙම පටලැවිල්ල නිසා බොහෝදුරට අපට අප අහිමි වෙමින් තිබේ. අපට අප දකින්නට හැකිවන්නේ අනෙකෙකු හරහාය. එහෙයින් සියල්ලන් සියල්ල දැන සිටියත් වෙනසක් සිදු නොවේ. මෙය සැබැවින්ම වත්මන් සමාජ දේශපාලනය ද තමා මෙන්ම අනෙකාද තේරුම් ගැනීමට අත්‍යවශ්‍ය කතිකාවකි.

කතුවරිය මෙම කතාපුවත ඉදිරිපත් කිරීමේදී අන්තර්පයීතමය ආඛ්‍යාන රටාවක් වෙත නැඹුරු වෙයි. එහෙයින් ලෝක ප්‍රබන්ධ සාහිත්‍යයේද දාර්ශනික සහ ආගමික චින්තාවන්ගේද උපුටන, ප්‍රකාශ සහ අදහස් අපට මෙහිදී මුණගැසෙයි. ශිෂ්ටත්වයේ ව්‍යාජය හඳුනා ගැනීමට එමගින් මහඟු සහායක් ලැබෙයි. එහෙත් ඇතැම් විට සමාජ දේශපාලනික විග්‍රහයන්ගේ පවත්නා අමු ස්වභාවය කැත්ලීන්ගේ ප්‍රබන්ධාත්මක ප්‍රවාදයට බාධාවක් වේ.

මේ නිසා පාඨකයාගේ පරිකල්පනාත්මක කියවීමට ඇති ඉඩ ඇහිරී යයි. මෙය මෑතකාලීන සිංහල නවකතා ගණනාවක දක්නට ලැබෙන තත්ත්වයකි.

අප ද්‍රෝහී වන්නේ කවරෙකුටද කුමකටද? පරිසරයටද, අනෙකුත් ජීවීන්ටද, ජීවිතයටද, ආදරයටද, විවාහයටද සමීපතමයන්ටද ලිංගිකත්වයටද, මරණයටද නැතහොත් තමාටමද? ද්‍රෝහී බව මේ ශිෂ්ටත්වයේ අවියෝජනීය අංගයක්ද? ඍජු පිළිතුරු නොමැති ප්‍රශ්න සමඟ පොරබැදීමට ප්‍රබන්ධමය අවකාශයක් සැපයීම වෙනුවෙන් කැත්ලීන් ජයවර්ධනට අපගේ ස්තූතිය පිරි නමමු.

# කෙටි කතා

**විශ්‍රාම යාම - ආර්.එම් නදීකා රත්නබාහු**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනයන අංශය**
**සමාජයීය විද්‍යා පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය.**

සුමේධ අම්මේ... ඇයි අද දෝණි ඉස්කෝල නොගියේ...?

අනේ ලොකු මැඩම්...මේවා ඉතින් කාට කියන්නද? කෙල්ලගෙ ඇඳුම් වේල ගන්න බැරි වුණා... ඊයේ රාත්‍රියේ එළිවෙනකම් වැස්ස නොවැ.

සුමේධ අම්මේ... එතකොට මහත්තයා ඔය දෙන්නා ගැන බලන්නේ ම නැද්ද ?

අනේ මොනව කියනවද අපේ මැඩම්... ඒ මිනිහා අපි උන්නද මලාද කියලා බලන එකක්යැ... දැන් ආයෙ ආගිය අතක් නෑ... අශ්වයෙක් වැඩ කරනකන් ඉතින් උන්දැ හොයාගනු බොරු.

මැඩම් ගියාම ඉතින් අපිට තාම පාඩු... ඇය ඉවත බලාගෙන කඳුළු සලයි.

මිනිස්සුන්ට වටිනා මනුෂ්‍ය ජීවිතයක් ලැබී තිබුනත් ඒවා හරියාකාරව පවත්වාගෙන යන්න නොහැකිවීම බරපතළ කනගාටුදායක කරුණක් නොවේද? සුමේධාගෙ දුවට ශිෂ්‍යත්වයක් හදලා දෙන්න පාඨක සමාජේ අයත් එක්ක කතා කරලා බලන්න ඕනේ... ඒ ළමයා ඉගෙන ගන්න දක්ෂයි ...
පුස්තකාලෙට අල්ලපු ඉඩමේ ලැලි ගෙදරක ජීවත්වන ඔවුන්ගේ ජීවිතේට අරමුණක් නැත. එදිනෙදා වේල සරිකර ගැනීම ම පමණක් ඔවුන්ගේ එකම අරමුණ බවට පත්වී හමාරය. මෙවැනි අයාලේ ගිය ජීවිත කීයක් නම් යහමගට ගන්න මට හැකියාව ලැබුණ ද? මහජන පුස්තකාල වෘත්තීය මිනිසුන්ගේ හදවතට කතා කරන වෘත්තියක් නොවේ දැයි හිතෙන්නේ මට විතරද ?

මැඩම්... හැමෝම ඇවිල්ලා... සභාපතිතුමත් ආවා. අනෙක් හැමෝම වගේ ඇවිත් ඉන්නේ. මං හැම තැනම අපේ මැඩම්ව හෙවුවා.

අනේ... මධුශංක, මං මේ අර සුමේධා අම්මගේ දරුවා ගැන අහන්න ටිකක් මෙතන නතර වුණා.
ඔය දරුවා යන්... මං එන්නම්...

මගේ මහජන පුස්තකාලාධිපතිත්වයට වසර තිහක් සම්පූර්ණ වී ඇත. එදා මෙදා කාලය තුල දිනෙන් දින දියුණු වූ මහජන පුස්තකාලය, නගරය මැද බබලන විශ්වවිද්‍යාලයක් යැයි කියන්නට තරම් මිනිස්සු දිරිමත් වී ඇත. අද ලබන ප්‍රතිඵල සියල්ලම අතීතයේ අප කළ සියළු කැපකිරීම් වල ප්‍රතිඵලයි. ඇතැමෙක් මහජන පුස්තකාලාධිපති වෘත්තිය හැල්ලු කරන හැම විටම මා උඩුගං බලා පීනුවේ එම වෘත්තියේ ගෞරවය රැක ගැනීම වෙනුවෙනි. ආ මාවත ඉතා රළු පරළු වුණත් එහි ප්‍රතිඵලය කොතරම් ආශ්වාදජනක දැයි අද සිතේ. මා වටා මහා මිනිස් පවුරක් ගොඩනැගුණේ හරිම පුදුම විදිහට ය.

මා නැවත වරක් පුස්තකාලය දෙස බැලුවෙමි. සැබැවින්ම වසර 30ක කාලසීමාව තුළ මා ලද සියල්ලේ අග්‍රගණ්‍ය ප්‍රතිඵලය මෙයයි. ඇහැල මල් පිසගෙන හමා යන සුළඟ ගතේ දැවටෙන විට, නා නා විධ මල් පිපි පුෂ්පයන් අතරෙත් සුන්දර ගොඩනැගිලි සංකීර්ණය දකින විට දැනෙන්නේ අප්‍රමාණ සතුටකි .

මගේ හිත අතීතයට දිවයයි. මා රැකියාවට ආ මුල් කාලයේ පුස්තකාලයට වෙන්ව තිබුණේ සභාවේ ගබඩා කමරයකි. පොත් පත් පන්සියයක් පමණ ඉතා අබලන් වූ රාක්ක කීපයක් තුළ ගබඩා කර තිබුණු අතර කිසිදු වර්ගීකරණ ක්‍රමයක් නොතිබිණි. එය කිසිවකුගේ අවධානය යොමු නොවූ අඳුරු ස්ථානයක් විය.

මාගේ මුවගට සිනාවක් නැගුනේ විශ්වවිද්‍යාලයේ ගත කළ සුන්දර ජීවිතය සිහි වීමෙනි. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යා අධ්‍යයනාංශය තුළ ගෙවී ගිය සිව් වසර මගේ වෘත්තීය ජීවිතයේ අභිමානනීය පදනම නොවේද? මහජන පුස්තකාලයාධිපතිත්වයට මා පෙම් බඳින්නේ වීරසූරිය සහ වීරසිංහ ගුරු පියවරුන් නිසාවෙනි. ඔවුන්ගේ ධනාත්මක වදන් අද ද මා තුළ රැව් පිළිරැව් දෙන බව නොරහසකි.

එනිසා හැමෝම විවිධ ඉහළ වැටුප් ලබන රැකියා තෝර ගනිද්දී මා තෝරා ගත්තේ මහජන පුස්තකාලයාධිපතිත්වය යි. එය ඉතා අභියෝගාත්මක තීරණයක් වූ බව මට පසක් වන්නේ ජීවිත අරගලයේ දී මා හට අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වූ නිසාවෙනි. එකල සභාව තුළ මහජන පුස්තකාලයට හිමිව තිබුණේ කම්කරුවන් ට පවා පහළ තත්ත්වයක් යැයි කීම සාවද්‍ය නොවනු ඇත.

නමුත් අධ්‍යනාංශය තුලදී මා විසින් පෙන්වූ නායකත්ව කුසලතා මට මෙහිදී ප්‍රයෝජනවත් විය. උගත් සියලු ශිල්ප, නිර්මාණශීලිබව, නොපසුබට උත්සහය මා සමඟ නිබදවම රැඳුණි.

එවකට පැවති සභාව විසින් පුස්තකාලයටල ලබාදුන් ප්‍රතිපාදන කිසිසේත්ම ප්‍රමාණවත් නොවුනද, රාජ්‍ය බැංකුවක සහයෝගය යටතේ පැවති ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ගැනීමට හැකි වීම හා පුස්තකාලය වෙත සමාජ අවධානය යොමු කර ගැනීමේ හැකියාව මට ලැබුණේ පුදුමාකාර කැපවීමේ ප්‍රතිඵලයකිනි. කී දෙනෙක් නම් මා මරු කිරීමට උත්සාහ කලාද ? නමුත් මාගේ මහජන පුස්තකාලයේ ගෞරවනීය පුස්තකාලාධිපතිත්වයට "මැඩම්" යන ගෞරව නාමය දිනා දීමට මට අවසානයේ හැකියාව ලැබිණි.

අදත් සභාව තුළ ක්‍රියාත්මක වන්නේ මාගේ ව්‍යාපෘතීන් ය. පාඨක සමාජය බලගැන්වීම මා විසින් ගන්නා ලද නිවැරැදිම තීරණය යි. වෛද්‍යවරු, ගුරුවරු නීතිඥවරු, ව්‍යාපාරිකයින්, කථිකාචාර්යවරුන්, ගොවි මහතුන්මහතුන්, සෞඛ්‍ය නිලධාරීන්, ගෘහණියන් මෙන්ම වෙළෙඳ ප්‍රජාව ඒ සඳහා ලබාදුන් දායකත්වය දිනෙන් දින දියුණුව කරා පිය නැගීමට හේතු වූවා නොවේද ? අද ඔවුන්ගේ දරුවන් රටේ ඉහළ නිලතල දරන වැදගත් පිරිස් නොවේද? ප්‍රථම වතාවට ශිෂ්‍යත්ව විභාග, සාමාන්‍ය පෙළ, උසස් පෙළ සම්මන්ත්‍රණ ආරම්භ කිරීම අද ඊයෙක මෙන් මතකය.

කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආරම්භය, ගොවි මහතුන්ගේ වගා කටයුතු සඳහා කෘෂිකාර්මික නිලධාරීන්ගේ සහයෝගය ලබාදුන් සම්බන්ධීකාරකයා වීම, විවිධ භව භෝග වගාවන් හඳුන්වා දීම, ගෙවතු වගාව සඳහා කාන්තාවන් බලගැන්වීම, විවිධ මාසික දේශන ඔස්සේ සෞඛ්‍ය, නීතිය හා අනෙක් කරුණු පිලිබද ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම, ජංගම පුස්තකාල සේවය හරහා පොත්පත් ලබා ගත නොහැකි ප්‍රජාව වෙත ගෙනයාම, විවිධ තරග, උත්සව ආදිය පැවැත්වීම, ආකර්ෂණීය ළමා පුස්තකාලය ආරම්භ කිරීම ඉන් කිහිපයක් පමණි.

කෙටියෙන් කිවහොත් ප්‍රදේශයේ ජනතාව ඕනෑම ගැටලුවකට පිළිතුරු සොයාගෙන පැමිණෙන්නේ පුස්තකාලයටයි. ඔවුන්ගේ ගැටලුව විසඳා ගැනීමට අවශ්‍ය කරන මගපෙන්වීම නිරන්තරයෙන්ම පුස්තකාලයෙන් සිදුවේ.

ඒ සියල්ල කිරීමේදී තනි කාන්තාවක් ලෙස ප්‍රජාවට පුස්තකාලයක වටිනාකම පහදා දීම ලේසි පහසු කාර්යයක් නම් වූයේ නැත.

මහජන පුස්තකාලය හැම විටම පොදු ජන විශ්වවිද්‍යාලය බවට පත් කිරීමට හැකියාව ලැබුණේ ඒ දැඩි කැපවීමේ ප්‍රතිඵලය නිසාවෙන් ය. පිට පිට වසර ගණනාවක් හොඳම පුස්තකාලය හා පුස්තකාලාධිපති වීමට භාග්‍ය ලද්දේ එබැවිනි. මාගේ වාර්තාව බිඳ දැමීමට කිසි කෙනෙකුට නොහැකිවීම පිළිබඳව ද මම කණගාටු වෙමි. මන්ද, ඉතා දක්ෂ පුස්තකාලාධිපතිවරුන් මේ ධරණිය සංවර්ධනය සඳහා අවශ්‍ය වන බැවිනි. තොරතුරුවලින් දුප්පත් මිනිසුන්ට දියුණුවේ මාවත විවෘත වන්නේ කලාතුරකිනි. ලෝකයේ දියුණු රටවල්වල රහස වන්නේ ද තොරතුරු සංසරණයේ වේගවත් බවයි.

මෙම ප්‍රදේශය ජනතාවගේ තොරතුරු සාක්ෂරතාවය මෙන්ම පරිගණක සාක්ෂරතාවය ද ඉතා ඉහළ මට්ටමක පවතින්නේ ඒ සඳහා වන සියලුම පහසුකම් හා පුහුණුව පුස්තකාලය තුළින් නොමිලේ ලබා දෙන බැවිනි. බාල, තරුණ, මහලු භේදයකින් තොරව ඒ පිළිබඳ ඔවුන් උනන්දුව දක්වයි.

මැඩම්... ඒ හඬින් මගේ සිතුවිලි දැහැන බිඳී ගියේ නිමේෂයකිනි.

සභාපතිතුමා...

මං දන්නවා ඔබතුමියට දැනෙන හැඟීම්. ඒවා වචන වලට පෙරලන්න තරම් මට හැකියාවක් නෑ .ඒත් ඔබතුමිය මේ ප්‍රදේශයේ අභිමානයයි. දේශපාලනඥයන්ට වඩා මිනිස්සු සලකන්නෙ ඔබට. මේ පුස්තකාලයට. අපි බැබළෙන්නෙත් මැඩම් නිසා. කොටින්ම කිව්වොත් මිනිස්සු අපට ඡන්දෙ දුන්නේ අපි අපේ පුස්තකාලයට සලකන විදිය බලලා. ඒක තියා පාර්ලිමේන්තුවේදී අපේ නායකයන්ගෙන් අහන්නේ මදාරා පුස්තකාලාධිපතිතුමියව අඳුරනවද කියලා. මැඩම්ගෙ විශ්‍රාම යාම අපිට ලෙහෙසි පහසු පාඩුවක් නොවේ.

මට නිදහසේ ඇස් දෙක පියා ගන්න පුළුවන් සභාපතිතුමා...
මේ රටට ණය ගෙව්වා කියන හැඟීම මට තියෙනවා .

මිනිස්සු ගන්න පඩියට වඩා වැඩ කරන්න ඕනේ සභාපතිතුමා. මේ රටට අපි සේවය කරන්න ඕනේ. බැහැ කියලා දෙයක් නැහැ. හැම තැනම තියෙන්නේ අභියෝග. ඒවා ජයගන්න ධනාත්මකව හිතලා වැඩ කරන්න ඕනේ. අපි ඔසවා තැබීමේ හැකියාව තියෙන්නේ අපිටම විතරයි.

ඒක සහතික ඇත්ත මැඩම්.

හා... අපේ මහාචාර්යතුමියත් මේ එන්නේ...කොහොමද ඉතින් ඔබතුමියට? මොනවද මේ බරටම උස්සගෙන?

හොඳින් ඉන්නවා.. ඔන්න හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා වගේ වැඩක් කරන්න යන්නේ සභාපතිතුමා.

මැඩම්... ඔන්න පොත එළි දක්වන්න කලින් පෙන්නුවට සමාවෙන්න. ඒත් මට මැඩම්ගේ හැඟීම් ළඟින්ම බලා ගන්න ඕනේ වුණා... මොකද මැඩම් ලෝකෙන් දේවල් ඉල්ලනවාට වඩා හැමදාම කරේ හැමකෙනාට ම වටිනාම දේවල් දෙන එක නේ...

"ආචාර්ය මදාරා රත්නසිරි අභිනන්දන ග්‍රන්ථය"

අපූරුයි ප්‍රොෆෙසර් සමදරා...මං මෙහෙම දෙයක් බලාපොරොත්තු වුණේ නැහැ. ඒත් මං කැමතියි මේ දැනුම අනාගත ප්‍රජාව භාවිතයට ගන්නවට... බොහොම ස්තුතියි ඔබතුමියට කැම්පස් එකේ දහසක් රාජකාරි මැද්දෙ මං වෙනුවෙන් කාලයක් වෙන් කරාට.

මේක මට ලොකු ගෞරවයක් මදාරා මැඩම්. මොකද මමත් මැඩම්ගේ ශිෂ්‍යයාවක්. අද මම මෙහෙම ඉන්නේ ඔබතුමියට පින් සිද්ධවෙන්න.

එහෙනම් අපි යමු මැඩම්... උත්සව සභාව මිනිසුන්ගෙන් අතුරු-සිදුරු නැති ව පිරීලා ගිහින්.

මැඩම්ට සමු දෙන්න ඒ අයගේ කැමැත්තක් නෑ.

ඒත්... සභාපතිතුමා අපි තාරුණ්‍යට අවස්ථාව දෙන්න ඕනේ. ඒ ජවයෙන් ඉදිරියටම මේවා කරගෙන යන්න. මට විශ්වාසයි අපේ අලුත් පුස්තකාලාධිපතිතුමිය මටත් වඩා හොඳ යුගයකට අපේ මහජන පුස්තකාලෙ අරන් යන බවට. ඒ එසේම වෙන්න කියලා මං ඇයට ආශිර්වාද කරනවා...

## කුල දියණිය - යමුනා වීරරත්න

### විශ්‍රාමික පුස්තකාලයාධිපතිනී

බැසීමට නියමිත බස් නැවතුමට ආසන්න වන විට දේවිකා හිඳ සිටි අසුනෙන් නැගිට බස් රියෙහි ඉදිරිපසට ගියාය.

"බහින අය හෝල්ට් එකෙන් බහින්න.ඔය කලර් ලයිට් එක ළඟින් බහින්න ලේස්ති වෙන්න එපා"

කොන්දොස්තර කෑගසමින් සිට ගෙන සිටි මගීන්ගේ ඇගෙහි හැපෙමින් බසයේ පිටුපසට ගමන් කළේය. බසය තුළවූ රස්නයෙන් දහඩිය දමා හෙම්බත්ව සිටි ඇයට ඉන් බැස ගත් වහාම මද සිසිලක් ගතට දැනුනද දැඩි අව් රශ්මිය දරාගත නොහැකිව කුඩය ඉහළා ගත්තාය. බැංකුව ඇත්තේ පාරෙන් අනිත් පැත්තේය. සුදු ඉරක් තිබුණද එය නොතකා නොනවත්වාම ගමන් කරන වාහන නතර කරන තුරු ඇය මදක් බලා සිටියාය. බෑගයක් පිටෙහි එල්ලා ගත් තරුණයෙකු අත මදක් ඔසවා වාහන නතර කර පාර පනින විට දේවිකාද යුහුසුලුව පැන ගත්තාය.

පසුගිය මාස කිහිපය පුරාම ඇයගේ බැංකු කාඩ් පතෙහි වූ අංකය පැහැදිලිව පෙන්නුම් නොකිරීම නිසා සුපිරි වෙළඳ සැල් මෙන්ම බැංකු කාඩ් පත භාවිතා කර ගනුදෙනු කරන අනෙකුත් වෙළඳසැල් වලින් ලැබුණ අයහපත් ප්‍රතිචාර නිසා ඇය කණස්සල්ලට පත්ව සිටියාය. බිල්පත් වලට මුදල් ගෙවන විට කාඩ් පතෙහි වූ මේ ප්‍රමාදය නිසා ඇයට පිටුපසින් සිටින ගනුදෙනුකරුවන්ගේ නොරිස්සුම් සහගත මුහුණු දුටු විට ඇයගේ කණස්සල්ල තවත් වැඩි විය. කාර්යාලයෙන් කෙටි නිවාඩුවක් ලබා ගෙන බැංකුව වෙත ගොස් මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට සිතුවේ එබැවිනි.

බැංකුවට ඇතුලු වන දොරටුව අබියස තිබූ විශබීජ නාශක බඳුනෙන් බිඳක් දෑතෙහි අතුල්ලා ගනිමින් වායු සමනය කළ ගොඩනැගිල්ල තුළට පිවිසි ඇයට දැනුනේ මහත් සිසිලකි. ගනුදෙනු සඳහා භාවිතා කරන කවුන්ටර දෙකෙහිම පෝලිම් දෙකකි. තම ගැටලුව විසඳා ගැනීමට යා යුතු ස්ථානය නිශ්චිතවම නොදන්නා බැවින් පසෙකින් ගිණි අවියක්ද අතදරා සිටි ආරක්ෂක නිලධාරියාට තම අවශ්‍යතාව සැල කර සිටියාය. ඔහු විසින් ඇය හට යායුතු ස්ථානය පෙන්වා දුන් අතර ඇය ඒ දෙසට පියවර නැගුවාය. එහි වූ කවුන්ටර ඉදිරිපසද ගනුදෙනු කරුවන් අසුන් ගෙන සිටි නමුත් එක් කවුන්ටරයක් අසල සිටි කාන්තාව එතැනින් නැගිට යාමට සූදානම් වූ බැවින් දේවිකා එහි ගොස් අසුන් ගත්තාය. කොවිඩ් රෝගයෙන් ආරක්ෂා වීමට කවුන්ටර සියල්ල ආවරණය කර තිබූ බැවින් ඇතුළත සේවයේ නිරතව සිටි පිරිස පැහැදිලිව දර්ශනය නොවේ. ඔවුන් සිටියේද පරිගණක තිර මත දෑස් අලවා ගෙනය. තමා ඉදිරියෙන් වූ කවුන්ටරය වෙත පැමිණි නිලධාරනියට බැංකු කාඩ් පත සම්බන්ධයෙන් මුහුණ පා ඇති අපහසුතාවය විස්තර කළාය.

"මට ඔයාගෙ අයිඩෙන්ටිටි කාඩ් එක දෙන්න"

දේවිකා වහා අත් බෑගය තුළින් ගත් හැඳුනුම්පත කවුන්ටර ආවරණයේ ගනුදෙනු සඳහා සකසා තිබූ කුඩා කවුලුව තුලින් දුන්නාය. ඒ අතර වාරයේ ඇය බිත්තියෙහි සවිකර තිබූ ඔරලෝසුව දෙස දෑස් යොමු කළාය. බැංකුව වැසීමට ඇත්තේ පැය බාගයක් පමණ වේලාවකි. ඇය සුසුමක් හෙලුවාය. කෙටි නිවාඩුවක් ගත්තද අදත් නිවසට යන්නට වෙන්නේ සුපුරුදු වේලාවටමය.

"මේ අයිඩෙන්ටිටි කාඩ් එක අලුත් එකක්ද ?"

දේවිකා වහා නිලධාරනිය දෙස බැලුවාය.

"ඔව්, අවුරුද්දකට විතර කලින් මගෙ අයිඩෙන්ටිටි පරණ වෙලා අලුත් එකක් හදා ගත්තා. කාඩ් එකේ අයිනේ පරණ අංකය තියෙනව නේද ?"

දේවිකා පිළිතුරු දුන්නාය.

"ඒක හරි, ඒ වුනත් ගිණුමෙ තිබුණු අංකය දැන් වෙනස් වෙලානෙ, මිස්ගෙ පරණ අයි.ඩී එකෙයි අලුත් එකෙයි අංක මේ කොලේ ලියලා මැනේජර්ට දීල අත්සනක් දාගෙන එන්නකො"

දේවිකා දෙසට මුද්‍රිත පත්‍රිකාවක් දිගු කරමින් ඇය පැවසුවාය. දේවිකා ඉක්මනින් හැඳුනුම්පත් අංක දෙක පත්‍රිකාවේ ලියා තම අත්සනද යොදා කළමනාකරුගේ කාමරය වෙත පිය මැන්නාය. වීදුරු වලින් ආවරණය වූ කාමරය තුළ පරිගනකය

වෙත දෑස් යොමු කරගෙන සිටි කළමනාකරු තමා වෙත පැමිණෙන ගනුදෙනුකරුට ඉදිරියේ ඇති පුටුවේ අසුන් ගන්නා ලෙස පවසා පැමිණි කාරණය විමසා සිටියේය. දේවිකා ඇයගේ හැඳුනුම්පත සමග පත්‍රිකාවද ඔහු වෙත ඉදිරිපත් කරමින් තමා පත්ව ඇති අපහසුතාවය ගැන පවසා සිටියාය. කළමනාකරු හැඳුනුම්පත පරීක්ෂා කරන අතරතුරේ ඇය කාමරය සිසාරා දෙනෙත් යොමු කළාය. මේසය මත එක් පසෙක අලුත්ම වර්ගයේ ජංගම දුරකථන දෙකකි. කළමනාකරු අසුන් ගෙන සිටින්නේ තම ආයතන ප්‍රධානියාගේ කාමරයේ ඇති අසුන බඳු ඉතා සුව පහසු පුටුවකය. ඔහු හැඳ සිටින කමීසයෙහි සාක්කුවේ සඳහන් වන්නේ මිල අධික සන්නාමයකි.

"කලින් තිබුණු අයිඩෙන්ටිටි කාඩ් එකට මොකද වුනේ ? " කළමනාකරු විමසුවේය.

"ඒක පරණ නිසා අලුත් එකක් හදා ගත්තා" ඔහුගේ දෑස් දෙස බලමින් ඇය පිළිතුරු දුන්නාය.

"එතකොට පරණ අයිඩෙන්ටිටි එක ගත්තෙ දොඩන්ගොඩ ඉන්න කාලෙද ?"

ඇය තිගැස්සී විමතියෙන් ඔහු දෙස බැලුවාය. පැරණි හැඳුනුම්පත නොමැතිව තමා පෙර ජීවත් වූ ගම දන්නේ කෙසේද

"ආ...ඔව් ඒත් කොහොමද..?"

ඔහු ඇය අසන්නට ගිය ප්‍රශ්නයේ ඉතිරි කොටස සම්පූර්ණයෙන් කළේය. "මගේ ගම දන්නෙ නේද ?"

දේවිකා ඔහු දෙස වඩාත් හොඳින් බැලුවාය. මුහුණු ආවරණයෙන් වැසී ඇති කොටස හැරුණු කොට පෙනෙන්නේ අතරින් පතර ඉදුණු හිසකෙස් වලින් භාගයට වැසී ඇති නලල, දෙනෙත් සහ කන් දෙක පමණි.

ඔහු සෙමෙන් මුව ආවරණය ගෙල තෙක් පහත් කළේ සිනාසෙමිනි.

යටි ඇන්දේ දත් පමණක් පෙනෙන අයුරින් සිනාසෙන, නිකටේ හරි මැදින් පිහිටි කිණිතුල්ලෙකුගේ හැඩය ගත් ඉන්නා හඳුනාගත නොහැක්කේ මන්ද

"ලක්සිරි අයියා කොච්චර කාලෙකට පස්සෙද " දේවිකා විස්මිතව ඇසුවාය

"අවුරුදු තිහකට විතර පස්සෙ නේද"

දේවිකාගේ සිත අතීතයට දිව යයි.

එකල ඇය සිටියේ උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලබමිනි. රජයේ සේවයෙන් විශ්‍රාම ලද පියා සිටියේ ගෙවත්තේ කුඹුරේ වැඩ වල නිරත වෙමිනි. පුද්ගලික ආයතනයක සේවය කළ අම්මා උදේ වැඩට ගොස් නිවසට පැමිණෙන්නේ සැඳෑ අඳුර ද සමගිනි. උසස් පෙළ සමත් වූ අක්කා රැකියාවක් අපේක්ෂාවෙන් අම්මා නැති අවස්ථාවල නිවසේ වැඩ කටයුතු වල යෙදෙමින් කාලය ගත කළාය. අයියා වසන්ත දෙවරක්ම උසස් පෙළ විභාගයට පෙනී සිට සරසවියට යැමට ලකුණු ප්‍රමාණවත් නොවූ බැවින් බාහිර උපාධිය සඳහා ඉගෙන ගනිමින් සිටියේය .

ගමේ පාසැලේ ඉගෙනුම ලබමින් සිටි දේවිකා දිනක් පාසැල නිමවී නිවසට පැමිණෙන විට දුටුවේ ආලින්දයේ වාඩිවී සිටින තරුණයෙකි. පොතක් උකුලේ තබා ගෙන කියවමින් සිටි ඔහු ඇයගේ පාවහන් හඬ ඇසී මඳ සිනහවක් පා නැවත පොත වෙත නෙත් යොමු කළේය. නැගනිය නිවසට පැමිණි බව දැනගත් අක්කා කාමරයේ සිට එළියට එන විට දේවිකා අමුත්තා ගැන විමසුවේ හස්ත මුද්‍රාවෙනි. "මල්ලිගෙ යාළුවෙක්" අක්කා සිහින් හඬින් පැවසුවාය . එසේ නම් අමුත්තා සිටින්නේ අයියා එනතුරුය. කෑම කා ගමන් විඩාව නිමා වීමෙන් පසු පාසැලෙන් දුන් පැවරුම් සිහිපත් වූයෙන් පොත් මිටියද ගෙන සාලයේ ඇති මේසය වෙත ගියාය. රාත්‍රී කාලයේ මදුරුවන්ගෙන් සිදු වන පීඩාව මධ්‍යයේ වැඩ කිරීමට ඇති අකමැත්ත නිසාම විඩාව නොතකා සවස් වරුවේම පාසැලෙන් දුන් පැවරුම් නිම කිරීමට ඇය පුරුදුව සිටියාය.

"තාත්ත එයි දැන් වී කොටන්න යන්න මිදුලේ තියෙන වී ටික ගෙට ගන්න"

ගෝනියක් සහ වී මැනීම සඳහා කුරුණියද දේවිකා අතට දෙමින් අක්කා ඉවතට ගියාය. සිතෙහි හට ගත් නොරිස්සුම සඟවා ගත් ඇය මිදුලේ වනා තිබූ වී පැදුර වෙත ගියේ අක්කාට යටි සිතින් බැණ වදිමිනි. බැස යමින් තිබූ හිරුරැස් පේර ගසේ අතු අතරින් පෙරී පැදුර මත රටා මවමින් තිබුණි. ඇය වී පැදුරේ දෙකොනින් අකුලා පැදුර මැදට වී ටික එකතු කර

කුරුණියෙන් මනිමින් ගෝනිය තුළට දැමුවාය. දිගු සෙවනැල්ලක් පැදුර මත වැටෙනු දුටු ඇය ගෙල හරවා පසු පස බැලුවාය. නිවෙසට පැමිණි තැනැත්තා ඇය අසල සිනාසෙමින් සිටියි.

"මේක මොකද්ද "

කුරුණිය පෙන්වමින් ඔහු විමසුවේය.

"මේකට තමයි කුරුණිය කියන්නේ" ඇය සිනාමුසුව පිළිතුරු දුන්නාය.

ක්ෂණයකින් අක්කා පැමිණ දේවිකා අතෙහි තිබූ කුරුණිය උදුරාගත්තාය. ගෙට ගිහින් ස්කෝලෙ වැඩක් කරගන්නවා. අක්කා කෝප වී ඇත්තේ කුමකට දැයි දේවිකාට සිතාගත නොහැකිය. වී ටික ගෙට ගන්නට කීවේ ඇයමය. අඳුරුවී ගිය වතින් යුතු අමුත්තා දෙසද නෙතගින් බලමින් දේවිකා ගෙතුලට ඇදුනාය.

අම්මා නිවසේ නොමැති බොහෝ අවස්ථාවන්හි අක්කාගේ අනසකට නතු වීමට ඇයට සිදුවේ. දේවිකා අම්මාට මේ ගැන පැමිණිලි කළද මව ඇය අස්වසන්නේ තමා නිවසේ නොමැති වේලාවට යොවුන්වියේ සිටින බාල දියණියගේ ආරක්ෂාව වැඩිමලීගෙන් ලැබීම සිතට මහත් සහනයක් ලබා දෙන බැවිනි .

අයියා දිවා ආහාරයෙන් පසුව නිවසට මඳ දුරකින් පිහිටි පුස්තකාලයට ගොස් දවසේ පුවත්පත් කියවා මිතුරු කැළ සමග මිත්‍ර සමාගම් පවත්වා නිවසට පැමිණෙන විටද අමුත්තා නිවසේ හුදෙකලාව සිටියේය. ලක්සිරි නම් වූ ඔහු අයියා සමග බාහිර උපාධිය ලබා ගැනීම සඳහා ඉගෙනුම ලබමින් සිටින පාසැල් සගයෙක් විය. අවසන් විභාගය වසර අවසානයේ පැවැත්වෙන බැවින් දෙදෙනා එකතු වී පාඩම් කිරීම සඳහා ඔහු නිවසට පැමිණ ඇති බව අයියා, අක්කා සහ ලක්සිරි ගේ කතා බහට සාලයේ සිට කන් යොමා සිටි දේවිකාට වැටහුණි .

පිරිවෙනෙහි පන්ති පැවැත්වුණේ සති අන්තයෙහි බැවින් සතියට දින දෙක තුනක් පාඩම් කිරීම සඳහා ලක්සිරි දේවිකාගේ නිවසට පැමිණියද අක්කා නිවසේ සිටින අවස්ථා වලදී අයියාගේ කාමරය අසලටවත් ඇය නොගියේ පෙර දිනයෙක සිදුවීම සිහිපත් වීම නිසාය. එසේම අක්කා නොමැති අවස්ථාවලදී අයියාගේ ඇණවුම අනුව ඔවුන් වෙත තේ රැගෙන යන විට ලක්සිරි ඇය දෙස සිනහ මුසු මුහුණින් බලා සිටියද එය නොදුටු අයුරින් සිටියාය.

ඇතැම් දිනක දිවා ආහාරයෙන් පසුව මිදුලේ ඇති පේර ගසෙන් ගෙඩියක් කඩා ගෙන ගස් සෙවණේ සිට එය රස විඳීමට දේවිකා පුරුදුව සිටියාය. දිවා කාලයේ ලේනුන් සහ රාත්‍රී කාලයේ වවුලන් විසින් පැසුනු පේර ගෙඩි කා දමා තිබූ හෙයින් පැසුනු පේර ගෙඩියක් සොයා ගැනීමේ අටියෙන් ඇය ගස සිසාරා නෙත් යොමු කළාය .පහතට නැමී තිබුණු එක් අත්තක සතුන්ගේ බැල්මට හසු නොවූ ගෙඩියක් කොල අතර සැගවී තිබෙන අයුරු දුටු ඇය පා ඇඟිලි වලින් ඉස්සී පේර අත්ත අල්ලා තමා වෙත නමා ගැනීමට උත්සාහ කළාය. එහෙත් නැමුණු අතු අග්ගිස්සේ කොල කීපයක් ඇයගේ අතේ ඉතිරි කරමින් අත්ත උඩට විසි වෙයි. නැවත වරක් ඉතා අසීරුවෙන් අත්ත අල්ලා ගන්නවාත් සමග පිටුපසින් පැමිණි අතක් ඇයගේ අත සමග පේර අත්තද අල්ලා පේර ගෙඩිය කඩා ගැනීමට සහාය විය. පිටුපස බැලූ ඇ දුටුවේ ලක්සිරිය.
කාන්තිමත් දෑසින් සිනාසෙමින් බලා සිටින ඔහුගේ නිකටෙහි වූ කිණිතුල්ලෙකුගේ හැඩය ගත් ඉන්නා පළමු වරට දුටුවේ එදිනය. දේවිකාගේ වාසනාවකට මෙන් අක්කා අසලක නොවීය.

"මම නිසා එදා බැනුම් අහන්න වුනා නේද ?"

කිසිවක් නොකී ඇය සිනා මුසු මුහුණින් පේර ගෙඩියද ගෙන ගෙතුලට ගියද කෙදිනකවත් නොදැනුනු මිහිරි හැඟුම ඇගේ සිතට ගෙන දුන්නේ සතුටක් මෙන්ම බියකි. එදා ඔහු නිසා තමා අක්කාගේ නොරිස්සුමට ලක් වීම පිළිබඳව ඔහු පසුතැවෙන්නේ ඇයි? පේර අත්තට හා ඔහුගේ අතට මැදිවූ තම අත මුදා ගනිද්දී ඔහුගේ ගොරෝසු අත්ලෙහි ස්පර්ශයෙන් තම හදවත සසල වූයේ ඇයි දැයි ඇයට සිතා ගත නොහැකි විය. මිශ්‍ර පාසැලක ඉගෙන ගන්නා ඇයට පිරිමි ළමුන්ගේ ඇසුර සාමාන්‍ය දෙයකි. පාසැල් වත්ත මායිමේ ඇති සියඹලා ගසට පොලු ගසා කඩා ගන්නා සියඹලා කරල් පන්ති කාමරයට ගෙනවිත් කෙල්ලන්ට පෙනෙන ලෙස කන විට දේවිකා සහ මිතුරියන් ඒවා උදුරා ගන්නේ ඔවුන්ට පහර කිහිපයක් ගසමිනි. නමුත් ඔවුන් අමනාප නොවන්නේ පාසැලට පැමිණීමට නොහැකිවන දිනවල අතපසු වන පාඩම් සටහන් ලියා ගැනීමට තම මිතුරියන්ගේ සහාය අවශ්‍ය වන බැවිනි. එසේ නම් ලක්සිරිගේ අතෙහි

ස්පර්ශය කාන්තිමත් දැස, සිනහව තම සිතට බරක් වී ඇත්තේ ඇයි. එය සිහිපත් වන විට මෙතෙක් නොදැනුනු මිහිරක් හදට දැනෙයි. දේවිකා එතැන් සිට ලක්සිරි නිවසට පැමිණෙන දිනයන්හි ඔහු සමග සිනාවක් හුවමරු කර ගත්තේ අක්කාගේ ඇසට හසු නොවන පරිද්දෙනි.

අයියාත් ලක්සිරිත් කාමරයට වී පාඩම් කරන බවට හැගවූවද ඔවුන් ඉතා සෙමින් කථා කරමින් වෙනත් කටයුත්තකද නිරතවන බව දේවිකාට සිතුනේ වරක් දෙවරක් නොවේ. අයියාගේ කාමරය අතුගෑමට ගිය දිනෙක මේසය මත විසිර තිබූ පොත් අතර කොමියුනිස්ට් ප්‍රකාශනය, වී.අයි.ලෙනින් තෝරාගත් කෘති පොත් දුටු ඇය සිතුවේ ඒවා දේශපාලන විද්‍යාවට අවශ්‍ය පොත් ලෙසය. එක් දිනෙක අයියා නොමැති අවස්ථාවක අයියාගේ කාමරයට ගිය තාත්තා කෝපයෙන් කෑගසනු ඇසී ඒ දෙසට සවන් යොමු කළාය.

"මූ මේ උපාධියට ඉගෙන ගන්නව කියල දේශපාලනේ කරන්න ලේස්ති වෙලා. අපි මේ නැහෙන්නෙ මුන්ට උගන්නන්න" තාත්තා තවත් මොනවාදෝ කියමින් අයියාට බැණ වදියි. අයියා නිවසට පැමිණි පසු තාත්තා අයියාට බැන්නද ඔහු කිසිවක් නොකියා කාමරයට රිංගා ගෙන නිසොල්මන්ව සිටීයේය.

දිනෙක කාගේදෝ කාන්තා කටහඬක් ආලින්දයෙන් ඇසී අක්කාත් අම්මාත් එදෙසට යනු දුටු දේවිකාද ඔවුන් පසුපස ඇදුනාය. නිල් පැහැති ගවුමක් හැඳ වරලස ගොතා සිටි ඇයගේ අතෙහි පොත් කිහිපයකි.

"වසන්ත ගෙදර ඉන්නවද ? "

ඇය මිදුලේ සිටිමින්ම ඇසුවාය.

අම්මා ඇයට වාඩි වීමට ආරාධනා කළ අතර අක්කා අයියාගේ කාමරයට ගොස් ඔහු කැවා ගෙන ආවාය.

"අම්මෙ මේ සුජාතා, අපිත් එක්ක ඉගෙන ගන්නෙ. ලක්සිරිගෙ හොඳම යාළුවා"

අක්කා උපහාසාත්මකව සිනාසුනද දේවිකාගේ හදවත දැවී යනු ඇයට දැණුනි.

"ලක්සිරිට සනීප නෑ. මේ පොත් ටික වසන්තට දෙන්න කිව්ව" සුජාතා ලැජ්ජාවෙන් බිම බලා ගනිමින් පැවසුවාය. අයියාගේ දෙනෙත් යොමුවී තිබුණේ දේවිකා වෙතය. ඇයද කිසිදු වෙනසක් නොපෙන්වා ආගන්තුක තරුණිය දෙස බලා සිටියාය. ඉන් පසු කිසි දිනෙක ලක්සිරි දේවිකාගේ නිවසට නොපැමිණියේය. දේවිකාද ලක්සිරි පිළිබඳ මතකය අසීරුවෙන් වුවද සිතින් මකා දැමුවේ උසස් පෙළ විභාගය ළං වෙමින් තිබූ හෙයිනි.

"වසන්ත ළඟදි ආවෙ නැද්ද ලංකාවට "

ලක්සිරිගේ හඬින් ඇය අතීත ආවර්ජනයෙන් මිදුනාය.

"ගිය අවුරුද්දෙ ආවට පස්සේ ආවේ නැහැ" " ලක්සිරි අයියා මැරි කරේ සුජාත අක්කද "

නැහැ නංගි, සුජාත අපිත් එක්ක එකට පිරිවෙනේ ඉගෙන ගත්තේ. හැබැයි එයත් එක්ක මගේ විශේෂ සම්බන්ධයක් තිබුණෙ නැහැ. වසන්තගේ ඉල්ලීමට තමයි සුජාතා එදා ආවේ. මම දන්නව ඔයාගේ හිතේ මම ගැන හැඟීමක් තිබුණු බව වසන්තටත් ඒක තේරිලා තිබුණේ. දේවිකා පුදුමයෙන් ලක්සිරි දෙස බලා සිටියාය.

පිරිවෙනෙහි දේශන නිම වී බස් නැවතුම්පලට යමින් සිටියදී වසන්ත කළ යෝජනාව ලක්සිරිට සිහිපත් වෙයි .

"ලක්සිරි මට ඇත්ත කියපන් නංගි ගැන මොනව හරි හිතේ තියෙනවද?" ලක්සිරිට නැතැයි කීමට නොහැක්කේ අක්කා නිවසෙහි නොමැති අවස්ථා වලදී දේවිකා හා ඔහු කතා කරනු වසන්ත දැක ඇති හෙයිනි.

"සහෝදරය අපේ දේශපාලන ප්‍රතිපත්ති ඇතුලේ කුල මල පන්ති භේද ප්‍රතික්ෂේප කරන බව ඇත්ත. ඒත් කාරණා දෙකක් නිසා මම ඔය සම්බන්ධයට අකමැතියි. එකක් තමයි අපේ අම්මයි තාත්තයි බොහොම සම්ප්‍රදායික මිනිස්සු. කුලමල හිත් වල ඇටුවම් බැහල තියන්නේ. අපේ තාත්තාගේ අක්ක කෙනෙක් කුලෙන් පිට කසාදයක් කර ගෙන අදටත් ගෙදරට එන්න දෙන්නෙ නැහැ. දෙවෙනි කාරණය තමයි දේවිකා තාම ස්කෝලෙ යනවා. මේවා ඔලුවට දාගෙන විභාගෙ අවුල් කර ගන්නවට මම කැමති නැහැ" ලක්සිරිගේ සිතෙහි ඇති වූයේ කණගාටුව සහ කළකිරීම මුසු හැඟීමකි. තම පියාගේ සීයා කරනු ලැබූ රැකියාව නිසා හංවඩු ගසා ඇති වාසගම් පෙළපත් නම් නිසා තව පරම්පරා කීයක් පීඩාවට පත්විය හැකිද? වසන්ත සහ තමා සම්බන්ධවී සිටින දේශපාලන පක්ෂය විසින් කුලය, ආගම නොසලකා සියලු දෙනාටම සමාන

අයිතිවාසිකම් ලබා දීමට කුමන ප්‍රතිපත්ති සම්පාදනය කළ ද එය සමාජය තුළින් තුරන් කිරීමට දරන උත්සාහය සාර්ථක නොවේ යැයි ඔහුට සිතුනි. ප්‍රධාන දේශපාලන පක්ෂ තුල මෙන්ම ආගමික සිද්ධස්ථාන තුලද කුලය නමැති සාධකය ඉස්මතු නොවන්නේ යැයි කිව හැකිද ?

දේවිකාගේ සිතෙහි තමා ගැන හැගීමක් ඇති වන පරිදි හැසුරුනේ තමාම නොවේද? වසන්ත පැවසූ පරිදි ඔහුගේ උපක්‍රමයෙන් පසු ඇය තමා කෙරෙහි කලකිරෙනු ඇත. සුජාතා සහ තමා අතර ප්‍රේම සම්බන්ධයක් නොමැති බව ඇයට පැවසිය හැකි වුවත් එයින් සිදු වෙන්නේ ඇය සිය සොහොයුරාට ද්වේශ කිරීමයි. පාසැල් වියේ සිටම කල්‍යාන මිත්‍රයෙක්ව සිටිමින් සිය පොත පත පවා නිර්ලෝභීව තමාට දෙන වසන්ත අපහසුතාවයට පත් කළ නොහැකිය. දේවිකා කුමක් සිතුවද කළ යුතු හොඳම දෙය නැවත කිසි දිනෙක වසන්තගේ නිවසට නොයා සිටීම පමණක් යැයි ලක්සිරි තීරණය කළේය.

මේ සියලු කරුණු හෙළිදරව් කරන අතරෙහි දේවිකා දෙස දැස් යොමු කර සිටි ලක්සිරි දුටුවේ මුලදී ඇය විමතියට පත් වුවද පසුව උපේක්ෂාවෙන් අසා සිටින අයුරුය.

"මම යන්නම්"

දිගු සුසුමක් හෙලූ දේවිකා මේසය මත තිබූ හැඳුනුම් පත අතට ගෙන ලක්සිරිගෙන් සමුගත්තාය.

.

## පළමු පත්වීම - ගිවෝන් යානිකා නන්දසේන

**වරලත් පුස්තකාලයාධිපතිනී**
**ජාතික විගණන කාර්යාලය**

අපි හැමෝටම අපේ මුල්ම රැකියාව කළ ස්ථානය සදානුස්මරණීයයි කියලා කිව්වොත් ඒක බොරුවක් නෙමෙයි කියලයි මං හිතන්නෙ... වසර ගනනාවක් ගෙවිලා ගිහිල්ලත් අදටත් ඇස් පියාගෙන ඒ මතක අතරෙ සැරිසරන්න මටපුළුවන්...මුල්ම පත්වීම් ලිපිය ලබපු දවසෙ ඉඳන්...ඔව් ඇත්තෙන්ම...

**************************************************************************

"දුව අන්න ඔයාට ලියුමක් තිබුනා රෙජිස්ටර් පෝස්ට්... කම්කරු දෙපාර්තමේන්තුවෙන් එවලා තියෙන්නේ...

අර ඔයා ගිය ඉන්ටර්විව් එක ගැනද දන්නෙ නෑ..."

මව පැවසුවේ මා සරසවියේ දේශනයකට සහභාගී වී පැමිණි එක් සෙනසුරාදා දිනයක හවස් වරුවේය.

"අපෝ අම්මා ඒක නම් වැඩක් නෑ.. මාව තේරිලා නැතුව ඇති... එදා ඉන්ටර්විව් එකට ඇවිත් හිටිය සේරම ඩිග්‍රිය සම්පූර්ණ කළ අය... මං විතරයි එතන ඉගෙන ගන්න ළමයෙක්ට හිටියෙ...ඒ මදිවට ඔක්කොම ඇවිත් හිටියේ සාරි ඇඳලා ජැන්ඩි පහට... මං විතරයි කැෂුවල් ගිහින් හිටියේ හාල්පාරුවා වගේ...එදා මුලු ඉන්ටර්විව් බෝර්ඩ් එකම මං දිහා බැලුවේ අමුතු ජීවියෙක් දිහා බලන විදිහට..."

මා කීවේ මව දුන් ලිපිය අතට ගන්නා අතරතුර තරමක දෙගිඩියාවෙනි.

" හරි හරි ළමයෝ ඕක කඩලා බලන්නකො ඉතිං අංජනම් බලන්නෙ නැතුව මෙතන"

ඇගේ කීමට මා ලහි ලහියේ ලිපිය කැඩුවේ ගැහෙන හදවතිනි.

මා කම්කරු දෙපාර්තමේන්තුවේ තෙවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිනියක ලෙස තෝරා පත් කර ගෙන ඇති බවත් ලබන මස මුල සිට වැඩ භාර ගත යුතු බවත් එම ලිපියේ සඳහන් කර තිබුණි. විහඟ වෙස් ගෙන ඈත අවකාශයේ පියාසලා යන්නාක් බඳු ප්‍රහර්ශයකි එවර මගේ හදවතට දැනුනේ..මේ මා බලාපොරොත්තු වූ රැකියාවයි. කුඩා අවධියේ සිට පොත පතට ඉමහත් ඇල්මක් දැක්වූ මා පොත් සමග බැඳුණු මෙම වෘත්තියට ඇලුම් කිරීමට පෙළඹුණේ විදුහලේ පුස්තකාලය භාර ශිෂ්‍ය නායිකාව වීමෙන් පසු එවකට එහි පුස්තකාලයාධිපතිනිය සමග සමීප ඇසුරක් ඇතිවීමත් සමගයි.

උසස් අධ්‍යාපනය සඳහා පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ධාරාවන් තෝරා ගැනීමට මා උනන්දු කළේ ඇයයි.

"අනේ අම්මා ඉන්ටර්විව් එකෙන් මාව තේරිලා...මට මේක හරියට හීනයක් වගේ...ලබන මාසෙ පළවෙනිදා ඉඳන් වැඩ භාර ගන්නලු..."

මං කිව්වේ සතුට වැඩි කමට උඩපැනලා අම්මාවත් බදාගන්න ගමන්

" මට හරිම සතුටුයි දුව..අඩු වයසින්ම ඔයාට රස්සාවක් ලැබුණු එක මොන තරම් දෙයක්ද... තාත්තා ඔයාව එතන ජොබ් බැන්ක් එකේ රෙජිස්ටර් කරළා තිබුණු නිසා හොඳට ගියා"

අම්මාගෙ මූණෙ හිනා මල් පිපිලා තිබුණු හැටි මට අද වගේ මතකයි... අම්මා විතරක් නෙමෙයි තාත්තා වගේම මගේ නංගිත් එදා හිටියෙ හරිම සතුටින්...

ජීවිතේ පළවෙනි පාරට බොහොම අමාරුවෙන් ඔසරියකුත් ඇඳගෙන තාත්තත් එක්ක පත්වීමෙ වැඩ භාර ගන්න ගියපු හැටි මට මේ දැනුත් මතක් වෙනවා...

"දුව ඔයාට වැඩ ඇරිලා එනකොට තනියම එන්න පුළුවන් නේද..? ගන්න ඕන බස් එක, බහින තැන එහෙම මතකයිනෙ..නැත්නම් මං එන්නද හවසට ඔයාව ගන්න...? "

"එපා තාත්තා ඔන නෑ...මට තනියම එන්න පුළුවන්..."

එසේ කියා පියාට සමු දුන් මා පරිපාලන අංශයට ගොස් වැඩ භාර ගැනීමේ ලිපිය ද අත්සන් කර දී බිම් මහලේ පිහිටි මගේ සේවා ස්ථානය වූ කම්කරු දෙපාර්තමේන්තු පුස්තකාලයට පිවිසියෙමි.

ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය ඒ මොහොතේ නොසිටි අතර සිනහවකින් මුව සරසාගෙන මා පිළිගැනීමට ඉදිරියට ආවේ ප්‍රධාන ලිපිකාරිණියයි. මැදි විචේ පසු වූ ඇය නමින් කුසුම් විය. ඇයට අමතරව සුහා සහ හෂ්මිනී නමින් තවත් තරුණ ලිපිකාරිණියන් දෙදෙනෙක් විය. මගේ සම වයසේ පසු වූ හෂ්මිනී ඉතා ඉක්මනින් මා හා මිතුරු වූවත් පොත් බැහැරදෙන අංශයේ සිටි සුහා අක්කා සිටියේ බුම්මාගෙනය.

කාරයාල කාර්ය සහායකයින් තිදෙනෙකු වූ අතර ඉන් ජ්‍යෝෂ්ඨතමයා ඉදිරි පෙල අසුනේ පසු වූයේ ඉතාමත් අහංකාර ලීලාවෙනි. ද්‍රවිඩ ජාතිකයෙකු වූ ඔහු නමින් කොම්බන් නම් විය. අනෙක් දෙදෙනා සුහදශීලී කොලු ගැටවුන් දෙදෙනෙකි. සරිත් මුස්ලිම් ළමයෙක් වූ අතර ලීලාරත්න නම් වූ අනෙකා ගමක හැදුනු තරුණයෙකි. ඇත්තෙන්ම පුස්තකාලය සියලු ජාතීන්ගේ සුසංයෝජනයක් විය.. එම පුස්තකාලය කම්කරු නිතී පිළිබඳ පත පොතින් සන්නද්ධ වූ විශේෂ පුස්තකාලයකි. නවකතා කියවීමට ඉමහත් රුචිකත්වයක් දැක්වූ මා හට එම නීති පොත් කෙරෙහි කිසිදු ප්‍රියතාවයක් නොවිණි. මද වේලාවකින් ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය පැමිණියාය. මා සමග සුහද කතා බහින් අනතුරුව ඇය මට පැවරූ පලමු රාජකාරිය වූයේ ශ්‍රී ලංකා සේවක සභරාවේ සිංහල ලිපි සඳහා සුචි සංලේඛ සකස් කිරීමයි. එයද ඉතා නීරස විය. පිටුපස අසුනක සිටි සරිත් නිදි කිරා වැටෙන අයුරුත් කොම්බන් ඔහුට බැන වදින අයුරුත් මගේ නෙත් කොනට හසු විය. තම රාජකාරියට අයත් නැති වුවද අපට තේ සාදා උදේ හවස මේසයට ගෙනැවිත් තැබුවේ කොම්බන්ය. දවස ගෙවුනේ ඉබි ගමනිනි. හවස රාජකාරි අවසන්ව ගෙදර යාමට බසයකට ගොඩවීමි. එකවර මහා සූ හඬක් නැගී ආවේ මා හිඳගත් අසුනට පිටුපස අසුනෙනි. කාර්යාල අඳුමින් සැරසුණු කොලු රැනක් පිටුපස දිගු අසුනේ හිඳ කසු කුසු ගෑහ.

"කවුද බං මේ???.. මීට කලින් මීටර් වෙලා නැති සීදේවි..."

"ඔය මචං අලුත් පත්වීමක්නෙ...පුස්තකාලෙ ඉන්නෙ..."

"මොනවා උඹ කොහොමද දන්නෙ...?"

"දවල් මං පත්තර බලන්න පුස්තකාලෙට ගියානෙ....එතකොට දැක්කෙ...කොහෙද ඉතිං උඹලා වැස්සකටවත් ඕකට ගොඩ වෙලා තියෙන එකක්යැ..."

"අපෝ ඕකෙ අපිට කියවන්න පුළුවන් පොත් නෑ...අනික අර ඉස්සරහම මහ සෝනා වගේ ඉන්න පියන් කාරයාගෙ ගෙම්බර් බලන්න පුළුවන් කාටද බං... ඌ හිතන් ඉන්නෙ ඌ තමා එතන බොස් කියලා..."

"කමක් නෑ හෙට ඉඳන් ලන්ච් ටයිම් එකේ පත්තරේ බලන්න වත් යමං මචංලා..."

"ඔව්... ඔව්... මේ වගේ නංගිලා ඉන්නකොට නොගිහින් කොහොමද..."

"යකූ...පෙනේද මුගෙ කතාව..."

"සූ..සූ..ඒ... මේ...සීදේවි නංගි ඔයාගෙ නම මොකක්ද???... ගම කොහෙද...???"

"ඔහොම ඔරවන්න එපා මයෙ මැණිකේ...හඳුන්පොත කීං...කීං...ගානවා..."

රත්තරං නෙත් දෙකින් සලා සිහිල් පවන්...ජීවිතේ ලසෝ තැවුල් නිවන්න රත්තරං...

මේ උසුළු විසුළු මැද හොඳ හැටි ඔරවාගෙන මා බසයෙන් බැස ගත්තේ කලබලයෙනි.

එවර මා මගද වරද්දාගෙන තිබුණි. කිරුළපන හන්දියෙන් බසිනු වෙනුවට මා බැස තිබුනේ පොල්හේන්ගොඩිනි.

කේන්තිය වැඩි කමට දැන් මට හැඬෙන්නට එන්නේය. ආපසු ගෙදර යන විට හොඳටම හවස් වී තිබුණු අතර අම්මා මග බලමින් උන්නාය.

කොහොමද දුව රස්සාව හොඳයිද...? ඇය විමසුවාය

වරදක් නෑ අම්මා...ඇල්මැරුණු ස්වභාවයෙන් මම ඊට පිළිතුරු බැන්දෙමි.

මුන කට සෝදා ආහාර ගෙන නින්දට ගිය මා උඩ විසි වී යළි ඇහැරුණේ පසු දා උදෑසන මවගේ කෑ ගැසීමටය.

"නැගිටින්න දුව...නංගි ඉස්කෝලෙ ගිහිල්ලත් දැන් ගොඩක් වෙලා... තාත්තත් උදේම වැඩට ගියා... දැම්මා ලෑස්ති වෙලා ගියේ නැත්නම් ඔයාට වෙලාවට වැඩට යන්න බැරි වේවි... "

මා දෙවැනි දවසේ වැඩට ගියේ අම්මාගේ වදෙන් පොරෙන් බේරීමට නොහැකි තැනය.

ආරක්ෂක අංශයේ සිටි නිලධාරිණිය "ගුඩ් මෝර්නිග් මිස්" කියා සිනා පෑ අතර මමද පෙරළා ඇයට සුබ පැතුවෙමි.

පුස්තකාලයට පිවිසෙන විට සියලු දෙනා සුහද සිනා පෑ අතර මා සමග සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී තිබූ අනෙක් තැනැත්තියද එදින සේවයට වාර්තා කර තිබුණි. මා ඇයට රේණු අක්කා යැයි කියමි. කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිදාරිණියක වූ ඇය විවාහක තැනැත්තියක් විය. ටික දිනක් ගත විට බොහෝ මිතුරු වූ ඇයගේ උදෑසන බත් පතෙන් වැඩි කොටසකට වග කීවේද මාය. එකම දිනයක පත් වීම් ලද බැවින්දෝ අප සිටියේ ඉදිකට්ටයි නූලයි මෙනි. පූර්ව ගර්භණී සමයේ පසු වුවත් ඇය බොහෝ ක්‍රියාශීලී අයුරින් රාජකාරියේ නියුතු විය.

අපගේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් තුමිය දහවල් කාලයේ පුස්තකාලයට පැමිණීම දෛනික දින චරියාවක් වූයේ ඇය ප්‍රධාන පුස්තකාලයාධිපතිනියගේ හොඳම මිතුරිය වූ බැවිනි. මා ඇයට සීතා මැඩම් කියා කියමි. ඇය කෙරෙහි මා සිතේ වූයේ බිය මුසු ගෞරවයකි. කෙදිනකවත් මගේ නමින් ආමන්ත්‍රණය නොකල ඇය මට කීවේ පොඩි කෙල්ල කියාය. පෙර දින මට විහිළු කළ පිරිමි ළමුන් කැළ දිවා ආහාර වේලාවේ පත්තර හා සඟරා බැලීමට පැමිණ සිටිනු දක්නට ලැබුණි. පුස්තකාලයේ ප්‍රධාන කාර්යාල කාර්ය සහායක තැන වූ කොම්බන් ඉදිරියේ ඔවුන් හැසිරුණු විනීත සුනීත ස්වභාවය හාස්‍ය දනවන සුළු විය. පසු කාලීනව ඔවුන් මගේ ඉතා හොඳ මිතුරන් වූ අතර අද වන විට රජයේ විවිධ කාර්යාලවල විවිධ උසස් තනතුරු දරන බවද මෙහිදී මගේ සිහියට නැගේ.

තෙවන දිනයේ පාඨක සේවා අංශය සම්පූර්ණයෙන්ම මා වෙත භාර දෙන ලදී. පුස්තකාලයේ තිබූ කම්කරු නීති රීති පිළිබඳ පොත පත කෙරෙහි මගේ සිතේ උනන්දුවක් ඇති වූයේ කවදා සිටදැයි නිශ්චිතව පැවසීමට නොහැකි වුවත් මම ක්‍රමක්‍රමයෙන් මෙම පරිසරයට අනුගත වෙමින් සිටියෙමි. මට පැවරූ රාජකාරිය කුමක් උව එය නොපිරිහෙලා ඉටු කිරීමට මම සැලකිලිමත් වූයෙමි. අප කරනා වැඩ වල වැරදි අඩු පාඩු කොම්බන්ගේ උකුසු ඇසින් ගැලවී නොගිය අතර ඔහු ඒවා ප්‍රධාන පුස්තකාලයාධිපතිනියගේ කනේ තබන බවද මම ඉතා හොඳාකාරයෙන්ම දැන සිටියෙමි.

"එයා හැසිරෙන්නෙ මේකෙ බොස් එයා කියලා හිතාගෙන වගේනෙ"

ඇතමෙක් ඔහු නැති තැන කසු කුසු ගෑහ.

කුමක් හෝ රුස්සන්නේ නැති දෙයක් සිදු වුවහොත් හෙතෙම මා හට තරවටු කළේ උපැස් යුවල යටින් බලා

"යානිකා මිසී මේ මොනා කරනවා...? "යනුවෙන් කැඩුණු සිංහලෙනි.

ඔහු නැති තැන අපි ඔහුව චීෆ් ලයිබ්‍රේරියන් යන අනවර්ථ නාමයෙන් හඳුන්වා උසුළු විසුළු කළෙමු.

නමුත් ඔහු වැනි පලපුරුදු අවංක සේවකයින් ආයතනයට කොතරම් වටීදැයි අපට වැටහී ගියේ ඔහු මාරු වී ගිය පසුවය.

පාඨක සේවා අංශයේ මා සිටි අසුන අසලින්ම අලුතින් පරිගණයක් ගෙනැවිත් සවි කළ ආකාරය මට හොඳ හැටි මතකය. අන්තර්ජාල පහසුකම්වලින් සමන්විත එම පරිගණකය මා භාවිතා කළේ පාඨකයින්ට අවශ්‍ය තොරතුරු සොයා දීමට හා පරිගණක දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීමට පමණි. මුහුණු පොත හා සමාජ මාධ්‍ය ජාලා ජනප්‍රිය නොවූ ඒ යුගයේ නව දැනුම සොයා අපි අන්තර්ජාලය පීරුවෙමු. තොරතුරු බෙදා හැරුණේ විද්‍යුත් තැපැල භාවිතයෙනි. ඊට අමතරව පාඨක දැනුම සඳහා විෂයට අදාල අනුක්‍රමණිකා සාර සංග්‍රහ සහ අත් පොත් ප්‍රකාශයට පත් කරන ලද්දේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනී ශ්‍රීමතී සූරිආරච්චි මහත්මියගේ අධීක්ෂණය යටතේය. කම්කරු නීතිවලට වැදගත්වන මිල අධික විදෙස් සඟරා කිහිපයක්ම අඛණ්ඩව මිලදීගත් අතර ඒවා පාඨකයින් අතර ප්‍රචලිත කරනු වස් අප විසින් පටුන පිටු සේවාවක් පවත්වාගෙන යන ලදී. නවක පත් වීම ලද අපගේ ආගමනයත් සමග මහජන සේවාවන් වෙනදාට වඩාත් පුළුල් විය. දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල ශාඛා පුස්තකාල 39ක් පිහිටුවීමත් කම්කරු කෞතුකාගාරය පිහිටුවීමේ පිඹුරුපත් සැකසීමත් මේ අතර සිදු විය. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි සලද පුස්තකාලය යටතේ පැවතුනි. පුස්තකාලයට පොත් මිලදී ගැනීම පුස්තකාල කමිටුව හරහා සිදු වූ ප්‍රධාන කටයුත්තයි. පුස්තකාල කමිටුවේ සභාපති කම්කරු කොමසාරිස් ජනරාල් වරයා වූ අතර කමිටුවේ ලේකම් පුස්තකාලයාධිපතිනියයි. එවකට කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කළේ මහින්ද මඩිහහේවා මහතාය. ආයතනයේ පැවති සියලු කාර්ය සාධන රැස්වීම් සඳහා පුස්තකාලයාධිපතිතුමිය සමග මමත් රේණු අක්කාත් සහභාගී වීමු.

පොදු මහජනතාව සමග නිරන්තරයෙන් ගනුදෙනු කරන කම්කරු දෙපාර්තමේන්තුවට වෙබ් අඩවියක් ඉතා ඉක්මනින් සැකසිය යුතු බවට කම්කරු කොමසාරිස් ජනරාල්තුමා යෝජනාවක් ගෙන ආවේ එවන් වූ රැස්වීමක් අතරතුරය.

සූරණී ඉන්ස්පයිරේෂන් එකෙන් හෙට එනවා අපේ වෙබ් සයිට් එක ඩිවෙලොප් කරන හැටි ගැන මීටින් එහෙකට

කවුද මේකට ඉන්වෝල් වෙලා වැඩ කරන්නෙ...??? කම්කරු කොමසාරිස් ජනරාල්තුමා විමසා සිටියේ උපැස් යුවල යටින් තීක්ෂණ බැල්මක් අප වෙත යොමු කරමිනි.

"යානිකාට පුළුවන් නේද පුස්තකාලෙ වැඩටික කරන ගමන් මේ වැඩේටත් පයෝරිටි දෙන්න..? "

අප සියලු දෙනා මුනිවත රකින විට හෙතම මගෙන් එක එල්ලේම විමසා සිටියේය.
"හත් දෙයියනේ කවද කාපු ටකරන්ද....??
ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් නැති වුවද එතුමාට බැහැයි කියන්නට බැරි කමට මම ඇටිකෙසෙල් කෑ උගුඩුවෙකු සේ "පුළුවන් සර්... " යනුවෙන් මිමිණුවෙමි. එතැන් පටන් මට පැවරුණු රාජකාරි පරාසය පුළුල් වන්නට විය. එවකට උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරමින් සිටි මා වෙබ් අඩවි සැකසීම පිළිබඳ දන්නා ඉලව්වක් නොවීය. එහෙත් පරාද විය නොහැකි නිසා එතැන් පටන් ඒ පිළිබඳ වැඩිදුර ඉගැනීමට සිතා ගතිමි. කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ පාලන අධිකාරිය විසින් මා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය පාඨමාලාවට අමතරව IDM ආයතනයේ වෙබ් අඩවි සංවර්ධන පාඨමාලාවකටද යොමු කරන ලදී. එතැන් පටන් යකා බැඳ ගත්තා සේ වැඩ කිරීමට මට සිදු විය. සතියේ දිනවල රාජකාරි කටයුතු සඳහාත් සති අන්තය පාඨමාලා සඳහාත් මගේ කාලය වැය විය.
"මේ ළමයව අල්ල ගන්න තියෙන අමාරුවක් රස්සාවට ගියාට පස්සේ...
දැන් හරි ගිහිල්ලනෙ මෙයාට... අපිව දැන් ඕන නෑ... අලුත් යාලුවො ඉන්නවනේ...
කොහොමද ඔෆිස් ගිය මුල් දවස්වල නහයෙන් අඬපු හැටි..
ඒකටත් එක්ක දැන් ඔෆිස් එක බදාගත්තු ගමන්මයි මෙයා.... "
ඔවැනි ආඩපාලි කියමින් නිවසට ආ ගිය නෑදෑ හිත මිතුරෝ නොයෙක් විට මැසිවිලි නැගූහ.

ICTA ආයතනය මගින් අපට Joomla හරහා වෙබ් අඩවි සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසියක් SLIDA ආයතනයේදී පවත්වන ලද්දේ ඔය අතර තුරය. එයට සහභාගී වී සෑදූ වෙබ් අඩවියට දෙවන ස්ථානය හිමි වූ ආකාරය අදටත් හීනයක් සේ මගේ සිතේ රැඳී තිබේ. බැහැයි කියා දෙයක් නොමැති බැව් මා එදින තේරුම් ගතිමි. මනුදම් ගුණයෙන් සපිරුණු ඉහල නිලධාරී පිරිසකගේ ගුරු හරුකම් ලබමින් රැකියාවේ නිරත වීමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි. සාම්ප්‍රදායික පුස්තකාලයාධිපති වෘත්තියෙන් බැහැරව නිර්මාණශීලී පුස්තකාලයාධිපති වෘත්තිකයෙකු ලෙස නැගී සිටීමට පන්නරය දුන් මා පළමු පත්වීම ලද කම්කරු දෙපාර්තමේන්තුවට හිස නමා ආචාර කරමි.

**සහකාර පුස්තකාලයාධිපති**

**සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**

මේ මගුල් බෙර හඬ, ස්තෝත්‍ර ගායනා, සැරසිලි නොමැතිව ම සිදු වෙන මගුලක්. පුදුමේ කියන්නේ විවාහ රෙජිස්ට්‍රාර් වෙනුවට වැඩිහිටියෙක් මුල් තැන ගත්ත මගුලක්.

කන්ද පාමුල තේවත්තක් අයිනේ ලයිං කාමර පේළියක හැන්දෑවක, සිවා හා මිනාච්චි අතිනත ගන්න මොහොතේ සුබ්‍රමනියම් තමන් දන්න ශාස්ත්‍රයට අනුව උගුරත් කැගහලා "මුදු මාරු කරගත්තනම්" කියනකොට සිවයි මිනාච්චියි හනිකට දෙන්නගේ මුහුණ බලාගෙන ම මුදු මාරු කරගත්තා. ඒ වෙලාවේ සිවා හිනාවෙලා හිටියට මිනච්චිගේ මූණේ පොඩි බයකුයි, ලැජ්ජාවකුයි හිනියට මොදු වෙලා තිබුණා.

එතකොට තමයි මිනච්චිගේ ඇඟිල්ලේ දැම්ම මුද්ද ටාං ගාගෙන බිම වැටුනේ... එතකොට ම මිනච්චිගේ අම්මා "මං තමුසේට කිව්වා මුද්දක් දාගන්න ඇඟිල්ල මහත් වෙනකම්වත් මේකිට ඉන්න දියං කියලා ... කො ඇහුවයැ ... තකහනියේ ම ගෙදර පාලු කළා මිසක්" තම ස්වමියා දිහා බලාගෙන තරහෙන් කුටු කුටු ගාන්න පටන් ගත්තා. ඒත් මිනච්චිගේ අප්පච්චි මුරුගන්, කරබාගෙන නිහඬව ම හිටියේ තමන්ට කිසිම ගාණක් නෑ වගේ.

කොහොම වුණත් සිවාගෙයි මිනච්චිගෙයි මගුල ලයිමට ගෙනාවේ ලොකු සතුටක්. රෑ මැදියම වෙනකම් ම දෙමළ සින්දුවලට ගල්වෙච්ච පා වේදනාවකින් තොරව ම නැටවුණා. කුරුවල් වුණු ඔලු සූර් වෙලා ටිකෙන් ටික ලිහෙන්න පටන් ගත්තා.

පහුවදා උදේ ලයිමට ඊයේ රෑ මගුලක් තිබුණදවත් කියලා මතක නෑ වගේ ... කඩිගුලක් ඇවිස්සුණා වගෙයි. මගුල් දවසේ රෑ ලයිං කාමරයේ අයිනක පන් පැදුරේ මදුරුවොත් එක්ක ම මංගල රාත්‍රිය ගත කළ සිවයි මිනාච්චියි උදේ ම නැගිටලා දලු කඩන්න යන්න සූදානම් වුණා. මෙච්චර දවසක් මිනාච්චි උදේට සූදානම් වුණේ සුදු ගවුම ඇඳන් කන්දේ මැද ඉස්කෝලේ යන්න. මිනච්චිට අදත් ඕන වුණේ ඉස්කෝලේ යන්න. ඒත් හිත දැඩි කරගෙන ම අමාරු කන්ද නගින්න පටන් ගත්තා.

පන්තියේ යාලුවන්ගෙන් භාගෙකට වැඩිය මිනච්චි වැඩ කරන වත්තේම වැඩ කරන නිසා මිනච්චිට අලුත් පරිසරයට හුරු වෙන්න වැඩි දවසක් ගියේ නෑ. ඉතුරු ටික දෙනත් ටික දවසකින් ම වත්තේ වැඩට එන බවත්, එතකොට පන්තිය වත්තෙම දාගන්න පුලුවන් බව තර්ජනී හිනාවෙලා කියනකොට මීනච්චිගේ ඇඟ හීතල වුණේ ඉබේට ම වගේ. ඇයටත් හොරා ඇගේ හිත දුවගෙන ගිහිල්ලා නැවතුණේ ඉස්කෝලේ ඇගේ පන්තියේ ඇගේ පුටුව උඩ. බිම වැටුණු මකන කෑල්ලක් හොයන්න එහේ මෙහේ බලනවා වගේ යාලුවන්ගේ ඇස්වලින් බේරෙන්න ඇය උත්සාහ ගත්තේ දැනටමත් මිනච්චිගේ ඇස් හොඳටම රතු වෙලා තියෙන නිසා.

## කාව්‍ය නිර්මාණ

### දයාබර පියාණෙනි - චන්දිමා වාදසිංහ

අඳුර සමඟම සුළඟ සීතල
සුනඛ රැනක උඩු බිරුම් හඬ..
ඇඟට හිරිගඩු පිපෙන තරමේ
උලලේනා හැඬූ දෝංකාරය
ඉඟි කලා මට ලෝක ධර්මය..



සිතත් නහරත් කේශ නාලිකා
වටහගන්නෙම නෑ...
දිව්‍ය ලෝකෙන් සුරඟනුන් විත්
එක් නිමේෂෙක...
මගේ රුධිරයෙ තැනුම්කරුවා
රැගෙන ගිය වග දිව්‍ය ලෝකෙට....
හුස්ම ගන්නට බැරිව හිටියා
මොහොතකුත් සහ තව ටිකක් මම..

ඇසුත් රතු වී හුස්ම හිරවී...
සිතැඟිවන්නෙම නෑ...
පොලෝගැබ සකසලා ඔහු හට

නොදුරු මානෙක...
ශේෂ වූ මගෙ තැනුම්කරුවා
රැගෙන යන විට ගෙයින් එළියට
කඳුලු එන්නට නොදී හිටියා
සිතුවමක නුඹෙ ඇති නිසා මම...

**චන්දිමා වාදසිංහ**
**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**



ජීවිතයට පාර කියන
සොඳුරු මතක සිත රඳවා
හෙටත් ආයෙ හමුවන්නට
මඟ බලනවා මා දෙනයන

නොවේ ඉඩක් හමුවන්නට සැම දින
පරිස්සමෙන් ඉනු මැන සැමවිට
හෙටක් කියා එන දිනයක
අපි හමු වෙමු මතකයන් සමඟ

මගේ කියා මටම සිතෙන
අපේ කියා අපිම සිතන
අත් අල්ලා ගනිමු ඉතින
නිවන තෙක්ම යන ගමනට

සොඳුරු කතා රස කර කර
මුමුණ මුමුණ සිනා සෙන්න
යන මාවත අත්වැල වී
සිනා තුටින් නිමා වෙන්න

**ඩී. එල්. ඒ. නදීකා**
**පුස්තකාලයාධිපති**
**ගාල්ල හෙද විදුහල**

## මළවුන්ගේ අවුරුදු දා - ගිවෝන් යානිකා නන්දසේන



දෙවොන්දරා සං අහන්න
එපා අහක බලා ඉන්න
මට මගෙ හිත හදාගන්න
එක වදනක් දැන් කියන්න

මා හැරදා ඔබ නොයන්න
යනවා නම් මෙය අහන්න
සැමදා මතකයෙ තියෙන්න
ඔබේ සුවඳ තබා යන්න

ඔබ ඉන්නේ අද විතරයි
හෙට ඔබ නෑ මං විතරයි
හුදෙකලාව නම් රුදුරුයි
සැනසුම කොහොමත් ඇතයි

මළවුන්ගේ අවුරුද්දට
ඔබ එනවාදැයි කියන්න
ඉක්මනින්ම ඔබ එයි නම්
මගේ මතක රැගෙන යන්න

**(තේමාව - මහාචාර්ය එදිරවීර සරත්චන්ද්‍රගේ මළගිය ඇත්තෝ/මළවුන්ගේ අවුරුදු දා නවකතා)**

**ගිවෝන් යානිකා නන්දසේන**
**වරලත් පුස්තකාලයාධිපතිනී**
**ජාතික විගණන කාර්යාලය**

ඇසිපියා සිටිය මම තේජසින් සැතපිලා
දේවාලේ ඉස්සරහ තිරිංගත් තදවුනා
දේවාලේ දොරකොඩින් ගැහැනියක් මතුවුනා
දෙවියො මම කතරගම ගැස්සිලා ඇහැරුනා



රතු වෙච්ච ඇස් කෙවෙනි, අපිලිවෙල සාරිපොට
මැල වෙච්ච රතු මූණ, අවුල් උන දිග කෙස්ස
ගැට පිච්ච මල් මාලේ මගෙ ගෙලට හිර වැඩිද?
ගුලි වෙච්ච මොණර කොල කපු අතින් සැගවුණිද?

(බැතිමතියගේ බේදණීය විලාපය)

"දෙවියනේ කතරගම මගෙ මිනිහ පියදස
උඹට ලොකු හොර ගෑනි මම උගේ හරි ගෑනි
ඒ ගෑණි එක්ක දැන් තිස්ස මහ වැව ගාව
උඹ ඉන්නවා ඔන්න දෙයියම්ප දැක්ක මම"

"මම දුන්න සෙනෙහසත් ඔහුට දැන් මදි වීද
අප්පගේ සෙනෙහසත් දරුවන්ට නැති වේද
පොඩි උන්ව ලොකු වෙද්දි මැව් හීන අමතකද
අසරණයි දෙවිඳුනේ වෙනවාද මට පිහිට "

ගෑණු දෙදෙනෙක් මටත් සිටිය වග සිහිවුණා
තේවානි, වල්ලිටත් එක ලෙසම පෙම් කළා
තීරණය ගන්නෙ මම කොහොමදැයි සිත සිතා
දෙයියො මම කතරගම ආයෙමත් ගොලු වුණා

එම්.ජී ෂෙහානි මධුෂිකා
කැළණිය විශ්වවිද්‍යාලය

පෙති පහට විහිදිලා සුදෝ සුදු මල් සුවඳ
තැනින් තැන බිම වැටී ඒයේ අතු මත රැඳුණ
මල් පොකුරු නැතිවා ද මලානික බව නොදුටු
හෙට අරන් එනවාද මටත් පන්සල් යන්න.....



තැළුණ පෙත්තක තියෙන පර මල් සුවඳ
දැනෙන විට මහ බරක් ගෙනෙයි හදවත රිදුණ
යළි යළිත් පිපෙන්නට මල් පොකුරු හැමදාම
පතන්නම් ටිකක් කල් ඒ පොකුරේ රැඳී ඉන්න

**ප්‍රියදර්ශනී හේමකුමාර**
**පුස්තකාලයාධිපති**
**ශ්‍රී ලංකා රසායන විද්‍යා පුස්තකාලය**

හුස්මක් ගානෙම
සුසුමක් ගානෙම
කඳුළක් ගානෙම
නුඹම තමයි...

එදවස වාගෙම
ඉරහඳ වාගෙම
මගෙ පණ වාගෙම
නුඹම තමයි...



නිම්නැති අහසම
රළ පිරි සයුරම
ගනමහ පොළවම
නුඹට සමයි...

මගෙ හද ගැස්මම
ලය පිරි හුස්මම
නවතිනතුරු මම
නුඹෙම තමයි...

**හංසනී ශානිකා විජේතුංග,**
**පුස්තකාලයාධිපති,**
**මධ්‍යම පුස්තකාලය,**
**රුවන්වැල්ල.**

දයාබර අයිරින්,



පිරිහී ගිය රදළ පරපුරක
අවසන් පුරුක වූ මම
ගරා වැටෙන වලව්වක්
රැකගැනීම උදෙසා
මිත්‍යාව පසුපස හඹා ගොස්
මං මුලා වූවෙමි...

ඔබ බිලිදී මා ලැබූ
නිධානයක් නැත්තා සේම
මගේ නිධානය ඔබම බව
තේරුම් ගන්නා විට
මට ඔබව සදහටම
අහිමිව ගොසිනි...

ඔබේ දිවි තොර කළේ
මා නොව
මා තුළ සැඟව සිට
එවේලෙහි මට ආවේශ වූ
යක්ෂයෙකු විසින් බව
මට විශ්වාසය....

හුදකලා වූ ජීවිතයට
සහකාරිය ලෙස
නුඹ මට පෑ සෙනෙහස
හදතුළ රඳවාගෙන
මේ කටුක ජීවිතයෙන්
නික්ම යන්නෙමි....

මීට
විලී අබේනායක

(ජී. බී. සේනානායක මහතාගේ නිධානය කෙටි කථාව ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා විසින් සිනමාවට නගන ලදී.)

**ගිවෝන් යානිකා නන්දසේන**
**වරලත් පුස්තකාලයාධිපතිනී**
**ජාතික විගණන කාර්යාලය**

## ජිනදාසගේ පාපොච්චාරණය - එම්. ජී ෂෙහානි මධුෂිකා



හයිය ඇති අත්වලින් සතුන්හෙම මැරුවා
කසිප්පුත් රා එක්ක සුරා පැන් බිවුවා
කටට එන හැමදේම බොරු උනත් කිවුවා
සතේ අතෙ නැතිවෙද්දි හොරකනුත් කෙරුවා...

ස්කන්ධෙ කල් යද්දි දිරන බව හැගුනා
දැන් නොමැති සැප මොටද පසුවකට සිතුනා
ගෑණිටත් හොරෙන් මම වත්තෙ කොටු පැන්නා
ජීවිතේ සුන්දරම දෙයක් බව සිතුනා ....

කාලයක් යද්දි මට ලෙඩ ගොඩක් හැදුනා
ළඟ උන්නු පිරිවරත් එකින් එක හැලුනා
ස්කන්ධෙ වැහැරිලා දරහැවක් මැවුණා
කරපු පවු එකින් එක සිහිවෙන්න ගත්තා....

පස්පවුම කඩ කරපු වරද හිත රන්දා
අවසාන චුති සිතත් හරහටම හිටියා
කල්පගානන් නිරයෙ දඩුවමුත් ලැබුනා
මම තමයි හංදියේ ජිනදාස ගොයියා ...

**එම්. ජී ෂෙහානි මධුෂිකා**
**කැලණිය විශ්වවිද්‍යාලය**

නමත් අමුතුයි හඩත් සොඳුරුයි
මගේ සිත් ගත් රොබරෝසියා
රෝස පැහැයෙන් මගම හැඩකර
පරව යයි රොබරෝසියා

සෙවන දුන් මුත් වසර ගණනක්
ඉතා පරණයි කඳත් හයියයි
තවත් තිබුණොත් අනතුරක් වෙයි
කපා දමමු හනික මේ ගස රොබරෝසියා



ප්‍රියදර්ශනී හේමකුමාර
පුස්තකාලයාධිපති
ශ්‍රී ලංකා රසායන විද්‍යා පුස්තකාලය

කොතන හෝ තනිවෙලා
සිටින්නට නොහැක මට
දිවා සුරැකුමට වී
මඟ බලා සිටින නුඹ
සිහිවෙලා හැමවිටම
කඳුළු කැට පනියි පිට

තවත් පොඩි උන් සමඟ
සිටින බව සිතෙන විට
පුංචි සැනසුමක්
ගෙන දේවි මගෙ සිතට
අම්මා දෙස අහිතකින්
නොබලන්න
මගේ පුත
රැකියාව මහ මෙරකි
අපේ ජීවිත වලට
අළුපාට අහස දෙස
දෙනෙත් යොමු කරමින්ම
හනික දිව එමි ගෙදර
නුඹේ වත සිප ගන්ට
නුඹ නිදන්නට පෙරම..
සැනසීම කොතනක ද
නිතර සිත විමසුවද
සැනසීම නුඹ ළඟය
මගේ පුංචි මැණික නුඹ
මගෙ ලොවම නුඹම මය



**චමිලා ගමගේ**
**මීගොඩ**

## Reading Quotes

**“A reader lives a thousand lives before he dies, said Jojen. The man who never reads lives only one.”**
**— George R.R. Martin**

**“You can never get a cup of tea large enough or a book long enough to suit me.”**
**— C.S. Lewis**

**“Never trust anyone who has not brought a book with them.”**
**— Lemony Snicket**

**“We read to know we're not alone.”**
**— William Nicholson**

**“Sometimes, you read a book and it fills you with this weird evangelical zeal, and you become convinced that the shattered world will never be put back together unless and until all living humans read the book.”**
**— John Green,**

**“If one cannot enjoy reading a book over and over again, there is no use in reading it at all.”**
**— Oscar Wilde**

**“The more that you read, the more things you will know. The more that you learn, the more places you'll go.”**
**— Dr. Seuss**

**“I find television very educating. Every time somebody turns on the set, I go into the other room and read a book.”**
**— Groucho Marx**

**“What really knocks me out is a book that, when you're all done reading it, you wish the author that wrote it was a terrific friend of yours and you could call him up on the phone whenever you felt like it. That doesn't happen much, though.”**
**— J.D. Salinger**

**“I declare after all there is no enjoyment like reading! How much sooner one tires of any thing than of a book! -- When I have a house of my own, I shall be miserable if I have not an excellent library.”**
**— Jane Austen**

**“′Classic′ - a book which people praise and don't read.”**
**— Mark Twain**

**“Books are a uniquely portable magic.”**

**— Stephen King,**
**“Books are the ultimate Dumpees: put them down and they’ll wait for you forever; pay attention to them and they always love you back.”**
**— John Green**

**“Only the very weak-minded refuse to be influenced by literature and poetry.”**
**— Cassandra Clare**

**Books are the quietest and most constant of friends; they are the most accessible and wisest of counselors, and the most patient of teachers.”**
**— Charles W. Eliot**

**“Until I feared I would lose it, I never loved to read. One does not love breathing.”**
**— Harper Lee**

**“A children's story that can only be enjoyed by children is not a good children's story in the slightest.”**
**— C.S. Lewis**

**“A great book should leave you with many experiences, and slightly exhausted at the end. You live several lives while reading.”**
**— William Styron**

**“If you don't have time to read, you don't have the time (or the tools) to write. Simple as that.”**
**— Stephen King**

**“You don't have to burn books to destroy a culture. Just get people to stop reading them.”**
**— Ray Bradbury**

**“Sleep is good, he said, and books are better.”**
**— George R. R. Martin**

**“Let us read, and let us dance; these two amusements will never do any harm to the world.”**
**— Voltaire**

**“Some books should be tasted, some devoured, but only a few should be chewed and digested thoroughly.”**
**— Sir Francis Bacon**

**“You think your pain and your heartbreak are unprecedented in the history of the world, but then you read. It was books that taught me that the things that tormented me most were the very things that connected me with all the people who were alive, who had ever been alive.”**
**— James Baldwin**



PRATHIRAWA - VOL 3

ISSN 2950-7278